FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
“රංගිරි ශ්‍රී ලංකා”
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER

FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
“රංගිරි ශ්‍රී ලංකා”
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2022
පෙබරවාරි (නවම්)
මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය
39




රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය
UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532
රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ
රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO
FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# නවම් පෝය වර්ණනාව

වසරක් ගෙවී නව වසරක් උදාවත් සමග එළඹෙන නවම් පොහොය ශාසනික වශයෙන් ඉතාවැදගත් සිදුවීම් රාශියකට මූලික වී තිබේ. සම්මා සම්බුදුරජාණන් ලෝකාර්ථ චර්යාවේ යෙදීම ආරම්භවීමත් සමඟම සිව්වනක් පිරිසකත් ඇති වන්නේ මෙම පොහොය මූලික කරගෙනය. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වන පිරිස රජගහනුවර වේළුවනාරාමයට රැස්කළ බුදුරජාණන් වහන්සේ ධර්මානුශාසනාවක් පැවැත් වූ සේක.

මෙම රැස්කිරීම පළමුවන සංඝ සම්මේලනය ලෙස සැළකේ. බුදුරජාණන් වහන්සේ චිර පැවැත්ම සඳහා භික්ෂූන් වහන්සේලාට ප්‍රාතිමෝක්ෂ දේශනාව පවත්වන ලද්දේද නවම් පොහෝදිනකය. මෙම දේශනාව ''ඕවාද ප්‍රාතිමෝක්ෂ දේශනාව'' යනුවෙන් හැඳින්වේ. සම්බුද්ධ ශාසනයේ නව දියුණුවක්ද මේ නිසා ඇතිවිය. එවකට මිථ්‍යාදෘෂ්ටිගතව සිටි තුන් බෑ ජටිලයන් වෙතට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ඔවුන්ට දහම් දෙසා ධර්මාවබෝධය ලබාදුන් සේක. පෙර අත්බැව්හි ප්‍රාර්ථනා වූ පරිදි ශ්‍රාවක පිරිස අතරින් සැරියුත් මහරහතන් වහන්සේටත් මුගලන් මහරහතන් වහන්සේටත් අග්‍රශ්‍රාවක තනතුරු ප්‍රදානය කරන ලද්දේ ද නවම් පොහෝ දිනකය.

මෙම ශාසනික තනතුරු ප්‍රදානය කිරීම ශාසනික වශයෙන් වැදගත් තැනක් ගනී. මෙම උතුම් පොහොය නිමිති කරගෙන ලක්දිව බෞද්ධ ජනතාව විහාරස්ථානයන්හි විවිධ ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවන් පවත්වති. මහනුවර දළදා මාළිගාව, ජය ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි දාගැබ, සඳහිරුසෑය, අටමස්ථාන, සොළොස්මස්ථාන, කතරගම කිරිවෙහෙර යන සිද්ධස්ථානයන්හි විශේෂ පූජාවිධි පැවැත්වේ. කොළඹ ගංගාරාම විහාරස්ථානයේ නවම් මහ පෙරහැර ද නවම් පොහොය මූලික කරගෙන පැවැත්වෙන බව සඳහන් කිරීමට පුළුවන. මෙම පෙරහැර දෙස්, විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනීය බවක්ද ඇතිවීමට තරම් සෝබාමත් වේ.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# ලංකාතිලක රජමහා විහාරය




බෞද්ධ හා හින්දු සංස්කෘතික ලක්ෂණ දෙකක් එක්තැන් කොට නිර්මාණය වූ රමණීය විහාරයකි. ලංකාතිලක විහාරය මෙම විහාරය ගම්පොළ රාජධානියට අයත්වෙන අතර එකල රජකළ IVවන බුවනෙකබාහු රජුගේ අගමැති විසින් නිර්මාණය කරන ලද බව ලක් ඉතිහාසයෙහි සඳහන් වේ. ස්වභාවික ගල්තලාවක් මත නිර්මාණයකර තිබීම නිසා මෙහි රමණීයත්වය වැඩිවී තිබේ. මෙය නිර්මාණය කිරීමේදී හින්දු ගෘහ විහාරය අසල හින්දු දෙවොලක් දක්නට ලැබෙන අතර වෙනත් කැටයම් කලාවන්ගෙන්ද සමන්විතය. මෙම විහාරය මහල් සතරින් නිර්මාණයකර තිබූ අතර වර්තමානයේ දක්නට ලැබෙන්නේ මහල් තුනකි. විහාර අභ්‍යන්තරයෙහි සමාධි බුද්ධ ප්‍රතිමාවන්ද චිත්‍ර කර්මාන්තද දක්නට ලැබේ. හිටි පිළිම දෙකක් ද රත් හඳුන් හා කිරිගරුඬ පිළිම දෙකක්ද නිර්මාණකර තිබීම පොළොන්නරු සම්ප්‍රදාය සිහිගන්වන්නකි.

විහාර භූමිය තුළ බෝධින් වහන්සේ සිරිපා සටහන දැඩිමුණ්ඩ දේවාලය, ධර්ම ශාලාව, පොකුණ, පියගැට පේළි, වාහල්කඩ, සීමා ගල්කණු මේ වන විට දක්නට ලැබේ. මෙම ඓතිහාසික විහාරස්ථානය සහ දෙවොල සුවිශේෂි ස්ථානයක් ලෙස සැලකිය හැකිය. මෙවැනි ඓතිහාසික වූත් පූජනීයත්වයක් ඇති විහාරස්ථාන වර්තමානය මෙන්ම මතු පරපුර සඳහාද පෝෂණයකර ආරක්ෂා කිරීම ලාංකික බෞද්ධ ජනතාවගේ පරම යුතුකම වන්නේය. මෙම විහාරස්ථානයට යෑම සඳහා කොළඹ නුවර පාරේ ගමන්කර හිරියාපිටිය ස්ථානයෙන් හැරී එම ස්ථානයට ලගාවිය හැකිය.

විජය තලවත්තේගෙදර

# නවම් පොහොය



"වර්ෂයක් උදා වී එහි දෙවෙනි පොහොය වශයෙන් එළඹෙන්නේ නවම් පුර පසළොස්වක පොහොයයි. එය පෙබරවාරි මාසය තුළ අපට සිහිකළ හැකි උතුම් පුන් පොහෝ දිනයකි. නවම් පුන් පොහෝ දිනය බෞද්ධයින්ට වැදගත් වන්නේ කුමන සිදුවීම් මුල් කරගෙනද යන්න විමසා බැලීම වැදගත් වේ."

ශාසන ඉතිහාසයේ ඉතා වැදගත් සිදුවීම් කීපයක්ම සිදුවී ඇති නවම් පුර පසළොස්වක පුන් පොහෝ දිනය ලෝක බෞද්ධ ජනයාට අනුස්මරණීය දිනයකි. එයට හේතුන් ලෙස සැලකෙන්නේ,

1. භික්ෂූන් වහන්සේලා පළමුවරට එක් රැස් කොට මහා සංඝ සම්මේලනයක් පැවැත්වීම.

2. සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලාට අග්‍ර ශ්‍රාවක තනතුරු ප්‍රදානය කිරීම.

3. භික්ෂූන් වහන්සේලාට ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම.

4. බුදුරජාණන් වහන්සේ මෙයින් තෙමසකට පසු පිරිනිවන් පාන බව භික්ෂූන් වහන්සේලාට දැනුම් දීම.

යන කරුණු නවම් පුර පසළොස්වක පුන් පොහෝ දිනය තුළ සිදුවී ඇත. පළමු කාරණය පිළිබඳව අවධානය යොමු කර බැලීමේදී බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ පිරිස ප්‍රධාන වශයෙන් කොටස් 4කට බෙදා දැක්විය හැකිය.

- භික්ෂු
- භික්ෂුනී
- උපාසක
- උපාසිකා ආදි වශයෙනි.

මෙම පිරිස සිව්වනක් පිරිස හෙවත් සිවුවැදෑරුම් ශ්‍රාවක යනුවෙන් හැඳින්විය හැකිය. මෙම චතුරංගනී පිරිසේ නායකත්වය දැරුවේ ශාස්තෘන් වන අපේ බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ පාලනය කළේ ධර්ම රාජ්‍යයයි. භික්ෂු, භික්ෂුනී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස මුල් වරට 1250 කට වැඩි නොවුන බව සඳහන් වේ.

බුදුරජාණන් වහන්සේ මෙම පිරිස සියල්ලම රජගහ නුවර වේළුවනාරාමයට එක්රැස් කොට මහා සංඝ සම්මේලනයක් පවත්වන ලදී. එය සිදුවූයේ නවම්පුර පසළොස්වක පොහෝ දිනය තුළයි.

බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ මෙම භික්ෂු සම්මේලන ක්‍රමය රාජ්‍ය පාලනය තුළටද ආදර්ශයක් වූවාට කිසිඳු සැකයක් නොමැත. රාජාණ්ඩු හා සමූහාණ්ඩු තුළ එම ක්‍රමය දැකගත හැකි ය.

සමූහාණ්ඩුවක් වූ ලිච්ඡවි රාජ්‍යය තුළ සමඟියෙන් රැස්ව සමඟියෙන් කටයුතු කොට සමඟියෙන් විසිරයෑමේ දේශපාලනමය න්‍යාය ඉස්මතුවී පැවතුණි.

වර්තමාන පාලන තන්ත්‍ර තුළ ඒ ඒ රටවල් වල පාර්ලිමේන්තු ක්‍රමයද ඊට අනුගතව පවතී. රටේ නායකයා හා මැති ඇමතිවරුන් මසකට වතාවක් දෙවතාවක් එකම තැනකට එකතු වී රටේ ප්‍රශ්න ජනතාවගේ ප්‍රශ්න සාකච්ඡා කිරීම හා ඒ සඳහා ගතයුතු පියවර ගැනීම රටක සමාජයක අභි වෘද්ධිය පිණිස හේතු වේ. එම උතුම් පණිවිඩය පළමු වරට අපට කියා දුන්නේ අද වාගේ පොහෝ දිනක අපේ ශාස්තෘවරයාණන් වහන්සේ බව සිහිපත් කළ යුතුව ඇත.

දෙවෙනි කාරණයෙන් පැහැදිළි වන්නේ සුදුස්සාට සුදුසු තැන දීමේ පිළිවෙතයි .

මංගල සූත්‍රය තුළ "පූජාච පූජනීයාං" පිදිය යුත්තන් පිදීමේ උතුම් ගුණාංගයට දෙවෙනි කාරණය තරමක් දුරට සමානය. බුදුරජාණන් වහන්සේ දකුණත් සවු වශයෙන් සැරියුත් මහරහතන් වහන්සේද වමත් සවු වශයෙන් මුගලන් මහරහතන් වහන්සේද පත් කරන ලදී.

එම අග්‍ර ශ්‍රාවක තනතුරු මුහුණ බලා හෝ වෙනත් සම්බන්ධතාවයක් මත පදනම් වූවක් නොවේ. උපරිම සුදුසුකම් අනුවත් සසර කරන ලද ප්‍රාර්ථනා බල මහිමයත් මත බුදුරජාණන් වහන්සේ එම තනතුර මෙසේ පිරිනමන ලදී.

ඒ අනුව මුලින් සඳහන් කළ මහා සංඝ සංවිධානයේ ධර්ම සේනාධිපති තනතුරට සැරියුත් රහතන් වහන්සේද ධර්ම පුරෝහිත බවට මුගලන් රහතන් වහන්සේද පත්වූහ.

මෙම සුදුස්සාට සුදුසු තැන දීමේ බෞද්ධ ප්‍රතිපදාව නොහොත් බෞද්ධ සම්ප්‍රදාය අද සමාජයටද ගතයුතු ආදර්ශයකි. අද බහුතරයක් නොසුදුසුකම් මත තානාන්තර නිලතල හොබවති. මේ ක්‍රමය මත සිදු වන්නේ දක්ෂයාට, සුදුස්සාට අවශ්‍ය තැන අහිමි වීමයි.

ඒ අනුව තම හදවතට අවංකව තමාට ඇති හැකියාවන් හා සුදුසුකම් අනුව තනතුරු ලබා එතුළින් රටට සමාජයට යම් සේවය කිරීමට අධිෂ්ඨාන කර ගන්නේ නම් මෙම පොහෝ දිනයේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ එම බෞද්ධ සම්ප්‍රදාය ආරක්ෂා කළා වන්නේය.

තෙවැනි කරුණ තුළින් බුදුරජාණන් වහන්සේ ධර්ම රාජ්‍යය පවත්වාගෙන යාමට අවශ්‍ය විනය නීති මාලාවක් ඉදිරිපත් කොට ඇත. බුදු සසුනේ මුල් යුගය තුළ එය අවවාදාත්මක ස්වරූපයෙන් පැවතුණි. බුදුරජාණන් වහන්සේ එය පවත්වාගෙන ආවේ,

"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං
ඒතං බුද්ධානුසාසනං"

යනාදී වශයෙනි.

එනම් සියලු පව් නොකරන්න. කුසල් දහම් රැස් කරන්න. සිත පිරිසිදු කරගන්න. යන ඕවාද ප්‍රාතිමෝක්ෂයයි.

මෙම ක්‍රමය බුදුවී මුල් විසිවසර තුළම පවත්වාගෙන ආ නමුත් ඊට පසු එහි සංශෝධනයක් කරමින් බුදුරජාණන් වහන්සේ විනය ප්‍රාතිමෝක්ෂය දේශනා කළ සේක.

ඒ කෙසේ වෙතත් මුල් කාලයේ භික්ෂු සංස්ථාව තුළ මෙම ඕවාද ප්‍රාතිමෝක්ෂය තුළින් නිසි සංවරයක් ඇති වූ බවක් දක්නට ලැබේ. පසු කාලීන බුදු සසුනට ඇතුළත් වූ ඡබ්බග්ගිය, උදායි, සුදින්න වැනි භික්ෂූන් වහන්සේලාගේ යම් යම් වැරදි ක්‍රියාකාරකම් නිසා විනය නීති ස්ථිර වශයෙන්ම පැනවීමට සිදුවිය. රටක සමාජයක වුවද නීති පද්ධතියක් තිබිය යුතු අතර එය කඩ කරන්නන්ට එරෙහිව දඬුවම් පැනවීමද සිදුවිය යුතුය.

අද මොන තරම් නීති රීති තිබුණද එය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නයක් උද්ගතව ඇත. රටක විනය ආරක්ෂා වන්නේ නීති රීති අනුගමනය කිරීම තුළිනි. බුදුරජාණන් වහන්සේ පනවන නීති විනය නීති තුළින් අද දක්වාම සාසනයේ පැවැත්ම සිදුවිය. "විනයො නාම සාසනස්ස ආයු" එය බුදු සසුනේ චිර පැවැත්ම නොහොත් ආයුෂයි.

ඒ අනුව රටක ඇති නීති පද්ධතියත් ආරක්ෂා කර රටේ පැවැත්ම උදෙසා සිත, කය, වචනය යන ත්‍රිදොරින්ම සංවරයක් ඇති පුද්ගලයෙකු වශයෙන් කටයුතු කළ යුතුය. එය බුදුරජාණන් වහන්සේ දේශනා කළ විනය නීති ආරක්ෂා කිරීමේ මූලික පිළිවෙතයි. තිදොරින් සංවර වූවා යනු අනුනට හා සමාජයට යහපත කැදවන්නෙකු වන්නේය. එවිට අලුතෙන් නීති ආරක්ෂා කිරීමක් අවශ්‍ය නැත. මේ උතුම් පුන් පොහෝ දිනය තුළ බුදුරජාණන් වහන්සේ උගන්වා වදාළ එම උතුම් ගුණාංගයත් ආරක්ෂා කිරීමට අපි සිතට ගනිමු.

හතර වෙනි කාරණයෙන් පැහැදිළි වන්නේ අනාගතයේ සිදුවිය යුතු දේ කළින් ප්‍රකාශ කර සිටීමකි. බුදුරජාණන් වහන්සේ පන්සාලිස් වසක් ලෝක සත්වයාට (දෙවි මිනිසුන්ට) ධර්මය දේශනා කළහ. එසේ ධර්මය දේශනා කළ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමට මාස තුනක් තිබියදී චාපාල චෛත්‍යය අසලදී ආයු සංස්කාරය අත්හැර මෙයින් තෙමසකට පසු පිරිනිවන් පාන බව භික්ෂූන් වහන්සේලාට දේශනා කළ සේක. එයින් සැබෑ ශාස්තෘවරයෙකුගේ ලක්ෂණ පෙන්නුම් කරති.

අද සමාජය තුළ වුවද ඕනෑම පුද්ගලයෙකුට තමන්ගේ ජීවිතය පිළිබඳ ස්ථිර වශයෙන් යමක් කිව නොහැකි වුවද තමන් ලැබූ පදවි තානාන්තර වලින් සමුගැනීමේ දිනය, විශ්‍රාම යන දිනය කිව හැකිය. ඒ සඳහා කල්වේලා ඇතිවම සූදානම් වී සිටීම ඉතාම වැදගත් වේ. ජනතාවගේ වැඩි කැමැත්තක් නැතිව ආරාධනාවක් නැතිව එම තානාන්තර වල ඇලී ගැලී සිටීම නුසුදුසුය. ජනතාවගේ ප්‍රතිචාරය අනුව එම නිලතල වල සිටීම හෝ එයින් ඉවත්වීම සිදු කළ යුතුය.

ලොව උතුම්ම පදවිය ලබාගත් බුදුරජාණන් වහන්සේට වුවද වසවත්ති මාරයාගෙන් ගැලවීමට නොහැකි විය. එසේ නම් සෑම කෙනෙක්ම මරණයට පත්වන බව සිතා තම වගකීම් හා යුතුකම් කොටස ඉෂ්ඨ කරමින් මෙලොව පරලොව ජයග්‍රහණය කිරීමට මේ උතුම් පුන් පොහෝ දිනය තුළ අදිටන් කර ගනිමු.

අවුලේගම රණවනයාගම/බමුණුගෙදර ශ්‍රී සදහම් සෙවණ
බෞද්ධ මධ්‍යස්ථානාධිපති කොබෙයිගනේ පුබ්බිලිය
ශ්‍රී සාරානන්ද පිරිවෙනේ නියෝජ්‍ය පරිවේණාධිපති
ගලගෙදර රතනවංස හිමි



# බෞද්ධ දර්ශනය

ක්‍රි.පූ. 6 වන ශතවර්ෂයේ භාරතය ගැන සලකා බැලීමේදී එය "දිට්ඨි ගහනං දිට්ඨි කාන්තාරං" දර්ශන වලින් ගහණ වූ දර්ශන කාන්තාරයක් ලෙස හැඳින්විය හැකිය. බ්‍රහ්මජාල සූත්‍රයේ මිසදිටු ආගම් 02ක් ගැන සඳහන් වේ. මෙම සෑම ආගමක්ම දර්ශනයක්ම අභිබවනය කරමින් ඉතා කෙටි කාලයක් තුළදී බෞද්ධ දර්ශනය භාරතීය සමාජයේ මුල්බැස ගන්නා ආකාරය දක්නට ලැබේ.

සමකාලීන අනෙක් ආගම්වලින් වෙනස් වූ දර්ශනයකි. බෞද්ධ දර්ශනය දර්ශනයේ ශ්‍රේෂ්ඨත්වය පමණක් නොව එම නවතම දර්ශනය ඉදිරිපත් කළ බුදුපියාණන් වහන්සේ සතුව පැවති දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් සමන්විත වූ මහා පෞරුෂයක් උන්වහන්සේ සතුව පැවතිනි. මහා කරුණාව වැනි උතුම් වූ මානුෂීය ගුණාංගත් භාරතීය සිත් ඇදගැනීමත් දර්ශනය ව්‍යාප්ත වීමට හේතු වූ සාධකයන්ය.

බුද්ධකාලීන භාරතයේ පැවති බොහෝ ආගම් නිර්මාණවාදය මත පදනම් වූ ආගම්ය. එදා භාරතයේ පැවති ප්‍රබලම ආගමක් වූ බ්‍රාහ්මණ ආගමේ ද පදනම නිර්මාණ වාදයයි.ලෝකය මැවීමත් මිනිසා මැවීමත් සමාජ ක්‍රමය මැවීමත් යන සියල්ලම මහා බ්‍රහ්මයා අතින් සිදුවූ බව එහි සඳහන් කර ඇත. ඍග්වේදයේ 10 වන මණ්ඩලයේ එන 90 වැනි පුරුෂ සූත්‍රයෙන් හෙළි වන ආකාරයට,

*බ්‍රාහ්මණස්‍ය මුඛවාසීත්*
*බාහු රාජන්‍යඃ කෘතඃ*
*ඌරූ තදස්‍ය යද් වෛශ්‍යඃ*
*පද්භ්‍යාම් ශූද්‍රෝ ආජායත*

මහා බ්‍රහ්මයාගේ මුවින් බ්‍රාහ්මණ මණ්ඩලයද දෙබාහුවෙන් ක්ෂත්‍රිය මණ්ඩලයද කලවා වලින් වෛශ්‍ය මණ්ඩලයද පා වලින් ශුද්‍ර මණ්ඩලයද උපන් වූ බව පෙන්වා දී ඇත. සියල්ලම මහා බ්‍රහ්මයාගේ තීරණය මත සිදුවන බව පවසා උතුම් මිනිසා අකර්මණ්‍ය අචේතනික වස්තුවක් බවට පත්කර ඇති ආකාරය දක්නට ලැබේ.

නමුත් මිනිසාට පමණක් නොව තිරිසන්ගත සත්වයාට පවා එක හා සමානව සැලකූ බෞද්ධ දර්ශනයේ (සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්තා) කේන්ද්‍රය වන්නේ මිනිසාය. මිනිසාගේ සිතය. එහි නිර්මාණවාදයට ඉඩක් නැත.

කවදාවත් නොදුටු මහා බ්‍රහ්මයෙකු ගැන විශ්වාස කිරීම, නොදුටු අයෙකුට ආදරය කිරිම නුසුදුසුයැයි බුදුන් වහන්සේ දේශනා කර ඇත. උන්වහන්සේ එක් අවස්ථාවක දේශනා කළේ "බ්‍රහ්මාති භික්ඛවේ මාතා පිතු ඵෙතං අධිවචනං" යනුවෙනි.

එයින් පැහැදිළි වන්නේ බෞද්ධ දර්ශනයේ බ්‍රහ්ම යනුවෙන් හඳුන්වාදී ඇත්තේ උතුම් පුද්ගලයින් බවයි. මෙසේ බෞද්ධ දර්ශනය නිර්මාණ වාදය ප්‍රතික්ෂේප කරන අතර එය හේතුඵලවාදීය. එයින් පෙන්වන්නේ යහපත් ක්‍රියාවන්ට යහපත් ප්‍රතිඵල ලැබෙන බවත් අයහපත් ක්‍රියාවන්ට (පාපී ක්‍රියා) අයහපත් ප්‍රතිඵල ලැබෙන බවත්ය.

"යාදිසං වපතේ බීජං තාදිසං හරතෙ ඵලං" (යම්සේ බීජ වැපුරුවේද එයට අනුව ඵල ලැබන්නේය)

මේ මගින් මිනිසා අකර්මන්‍ය කිරීම වළක්වා ඇත. ඔහුට උත්සාහයෙන් කටයුතු කිරීමට ඉඩ සලසා ඇත. ලෝකයේ පහළ වූ විවිධ ආගම් අතර මිනිස් වර්ගයාගේ ස්වභාවය ඔහුගේ සිතේ ස්වභාවය මතට සිදුවන බව බෞද්ධ දහම අවධාරණය කරයි.

පිරිසිදුකම හෝ අපිරිසිදුකම විමුක්තිය හෝ භෞතික හා ආධ්‍යාත්මික බැඳීම මිනිස් සිත හා සම්බන්ධ බවත් මිනිසාගේ මැවුම්කරු මිනිසාම බවත් (මිනිසාගේ සිත බවත්) මුලික බුදුසමය මනාකොට පැහැදිළි කරයි. මිනිස් සිතේ ස්වභාවය පිළිබඳව කළ දේශනා දර්ශනය පුරාම දක්නට ලැබේ.

*මනෝ පුබ්බංගමා ධම්මා මනෝ සෙට්ඨා මනෝමයා*
*මනසා චේ පදුට්ඨෙන භාසතිවා කරෝතිවා*
*තතො නං දුක්ඛ මන්වෙති*
*චක්කංව වහතො පදං"*
(ධම්ම පදය 1 සහ 2)

*පභස්සරමිදං භික්ඛවේ චිත්තං තංච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං"*
(අංගුත්තර නිකාය 12)

*චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි චෙතයිත්වා කම්මං කරෝති කායෙන වාචා මනසා"*
(අංගුත්තර නිකාය 1.103)

මුළු ලෝකයම සිතමත පිහිටා ඇති ආකාරය, චිත්තේන නියතී ලෝකෝ' යන පාඨයෙන් හෙළිවේ. බෞද්ධ දර්ශනය මෙන් සිත පිළිබඳව විග්‍රහ කළ වෙන කිසිදු ආගමක් නැත. ඉහත මා විසින් සඳහන් කළ බුද්ධාගම හා සමකාලීන අනෙක් සියල්ලම පාහේ අන්ත 02ක එල්බගත් ඒවාය.

එනම්,

- කාමසුඛල්ලිකානුයෝගය
- අත්තකිලමතානුයෝගය

යන අන්ත දෙකයි. මෙහිදි පළමුවැන්න නම් සැපෙහි ඇලී ගැලී විසීමත් දෙවැන්න ශරීරයට අපමණ දුක්දීමත් අර්ථවත් වෙයි.

බුදුපියාණන් වහන්සේ සිය ප්‍රථම ධර්මදේශනාවෙන්ම අවධාරණය කළ සේක,

*"ද්වේ මෙ භික්ඛවේ අන්තා පබ්බජිතේන*
*න සේවිතබ්බා යෝ චායං කාමේසු කාමසුඛල්ලිකානුයෝගෝ, හීනෝ ගම්මෝ පොථුජ්ජනිකෝ අනරියෝ. අනත්ථසංහිතෝ,*
*යෝ චායං අත්තකිලමතානු යෝගෝ දුක්ඛෝ අනරියෝ, අනත්ථසංහිතෝ.*
*ඒතේ තේ භික්ඛවේ උභෝ අන්තේ අනුපගම්ම මජ්ජිමා පටිපදා තථාගතේන අභිසම්බුද්ධා. චක්ඛුකරණී, ඤාණකරණී, උපසමාය, අභිඤ්ඤාය, සම්බෝධාය, නිබ්බාණය සංවත්තති"*
යන්නයි.

එනම්, මහණෙනි, පැවිද්දහු විසින් සේවනය නොකටයුතු අන්ත හෙවත් කෙළවරවල් දෙකක් ඇත. ඒ දෙක නම්, හීනවූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන් විසින් සේවනය කරනු ලබන්නා වූ අනාර්ථ වූ අනර්ථ සන්නිශ්‍රිත වූ කාමසුඛල්ලිකානු යෝගයද දුක්වූ අනාර්ථ වූ අනර්ථ සන්නිශ්‍රිත වූ අත්ත කිලම තානුයෝගයද යන මේ දෙකයි.

මහණෙනි, මේ ඉහත කී අන්ත දෙක හැර දමා නුවණැස පිරිසිදු කරන ඥානය පහළ කරන කෙලෙස් දුරුකරනු පිණිස පවතින නිර්වාණය සාක්ෂාත් කිරීම පිණිස පවතින මධ්‍යම ප්‍රතිපදාව තථාගත වූ මා විසින් අවබෝධ කරන ලදී." යන්න ධම්මචක්කපවත්තන සූත්‍රාන්ත දේශනාවෙහිදී දේශනා කර ඇත.

සියලු සංස්කාර ධර්මයන් අනිත්‍ය බවත් අනිත්‍ය දේ නිත්‍ය ලෙස ගැනීමෙන් දුක ඇතිවන බවත් එනම් අනිත්‍ය තුළ ඇත්තේ දුක බවත් (යද නිච්චං තං දුක්ඛං( ආත්මීය වශයෙන් ග්‍රහණය කර ගැනීමට කිසිවක් නොමැති බවත් බෞද්ධ දර්ශනයේදී අවධාරණය වේ.

මුළු ලෝකයම දුක මත පිහිටා ඇත. "දුක්ඛෝ ලෝකෝ පතිට්ඨිතෝ" මෙම සචේතනික අචේතනික ලෝකධාතුවේ අනිත්‍ය ස්වභාවයන් එහිදී හටගන්නා දුකක් පිළිබඳව නිතරම දේශනාකොට ඇත.

*"ඉදං ඛෝ පණ භික්ඛවේ,*
*දුක්ඛං අරියසච්චං,*
*ජාතිපි දුක්ඛා,*
*ජරාපි දුක්ඛා,*
*ව්‍යාධිපි දුක්ඛෝ,*
*මරණම්පි දුක්ඛං,*
*අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ,*
*පියේහි විප්පයෝගෝ දුක්ඛෝ,*
*යදනිච්චං න ලබති තම්පි දුක්ඛං,*
*සංඛිත්තේන පඤ්චුපාදනක්ඛන්ධා දුක්ඛා"*

චතුරාර්‍ය සත්‍ය තුළ දුක, දුකට හේතුව හා දුක නැති කරන මාර්ගය ගැන සඳහන් වේ. මෙම දුකට හේතුව තෘෂ්ණාවයි. (තවත් විටක අවිද්‍යාවද දුකට හේතුවක් ලෙස පෙන්වා දී ඇත) තෘෂ්ණාව, කාම තෘෂ්ණාව, භව තෘෂ්ණාව හා විභව තෘෂ්ණාව ලෙස තුන්වැදෑරුම්ය. මෙම තෘෂ්ණාව නැතිකිරීමෙන් දුක නැතිකළ හැකිය.

"තණ්හක්ඛෝ යො සබ්බං දුක්ඛං ජිනාති" දුක, දුකට හේතුව, දුක නැති කිරීමේ මාර්ගය වන්නේ ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. එමගින් නිර්වාණය ලබාගත හැකිය. පරම සුඛය වන්නේ නිර්වාණයයි. "නිබ්බානං පරමං සුඛං" එහිදී නැවත ඉපදීමක් නැත. එය ශාන්තය. යමක් ශාන්තද එය ප්‍රණීතය. "යන්තං සන්තං ඒතං පණීතං" යනු බුද්ධ දේශනාවයි. එය අවබෝධය පිණිසය.

ශාස්ත්‍රපති රුවන් ජයවීර

# සංසාර ගමන කෙළවර කර ගනිමු



සත්වයෝ භවයෙන් භවයට ගමන් කරමින් සංසාරේ බොහෝ කාලයක් සැරිසැරීමට හේතුවන ප්‍රධාන කරුණ වනුයේ තණ්හාවයි. බුදුරජාණන් වහන්සේ ධම්සක් පැවතුම් සූත්‍රයේදී දුක්ඛ සමුදයාර්‍ය සත්‍ය වශයේ පැහැදිලි කළේ එයයි. එහිදී ''ඉදං බොපන භික්ඛවේ දුක්ඛ සමුදයං අරියසච්චං යායං තණ්හ'' පොනොභවිතා, නන්දිරාගසහගතා, තත්‍ර තත්‍රාභි නන්දනී සෙයසථිදං, කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා (මහණෙනි දුක්ඛ සමුදයාර්‍ය ෂත්‍ය නම් මෙයයි. තණ්හාවයි.) තණ්හාව පුනර්භවය ඇති කරයි. නන්දරාගය හා එක්වෙයි. ඒඵ ' භවයෙහි ඇලෙයි. එය කාමභව, විභව තණ්හා යනුවෙන් ප්‍රභේද කොට දක්වා ඇත.

මෙහි කාම තණ්හා කියා පැවසුවේ කාමයට ඇති ආශාවයි. ඒ අනුව රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ආදී අරමුණු නිසා සුවයක් සතුටක් ඇති වූ විට පුහුදුන් පුද්ගලයා ඒ අරමුණෙහි ඇලී තමා සතු කර ගැනීමට උත්සාහ කරයි. එයින් අවසානයේ දුකට පත් වේ. භව තණ්හා කියා ප්‍රකාශ කළේ භවයට ආශා කිරීමයි. ජීවිතය හා ලෝකය ගැන තදින් අල්ලා ගැනීම් වශයෙන් ඇති කරගන්නාවූ ලෝභය ''භව තණ්හාව'' වශයෙන් දැක්වේ. ආත්මය, සත්වයා සදාකාලික වෙනස් නොවන සුළුය වශයෙන් ඇති කරගන්නාවූ වැරදි විශ්වාසය ලෙස මෙය දක්වා ඇත. විභව තණ්හා වශයෙන් දක්වාලුයේ නොපැවැත්මට ආශා කිරිමයි. ෂත්වයා මරණින් පසු යළි ඉපදීමක් නොවන්නේය. යන උච්චේදවාදී දෘෂ්ටිය සමග උපදින තණ්හාව විභව තණ්හාව වේ.

බුදුරජාණන් වහන්සේ ඇතැම් තැනක මාරයාගේ තොණ්ඩුව කාමය ලෙෂ දක්වයි. ෂත්වයා රූපයට, ශබ්දයට ගඳ සුවඳට, රසයට, පහසට අලවලා බැඳලා තියෙන කම්, ජාති, ජරා ආදිය පමණයි ලැබෙන්නේ. ඒ අයුරින්ම භව, විභව තණ්හා වලදීද ඒවාම අලවලා තියෙන කම් එම තැනැත්තා ඉන්නේ මාරයාගේ වසගයේ යයි කියති.

බුදුරජාණන් වහන්සේ ''තණ්හාව'' මහා සාගරයට උපමා කොට ආශා, සාගරයට නිරන්තරයෙන්ම සෑම දිශාවකින්ම ගංගා ගලා බසී. එහෙත් සාගරය උතුරා යාමක් නැත. අපි නිතරම ඇසින්, කණින්, නාසයෙන්, දියෙන්, ශරීරයෙන් අරමුණු ගන්නා අතර ඒවායේ කෙළවරක් හෝ ඇති වීමක් සිදුවන්නේ නැත. භව තණ්හාවේ දී භවයට ඇලීමක්, විභව තණ්හාවේදී උච්චේදවාදී දෘෂ්ටි වලට ඇලීම, බැදීම නිතරමප වතින දෙයක් වේ.

මේ ආකාරයට ෂත්වයා සසරෙහි පෙළඹවන තණ්හාව (බැදීම, ඇලීම) ප්‍රමාදවීමකින් තොරව ප්‍රභානය කිරීමට උට්ඨනවීර්යයෙන් යුතුව කටයුතු නොකළ හොත් අපගේ භව ගමන තව තවත් දීර්ඝ වී යා හැක. අපි සියල්ලෝම ක්ෂණයක් ක්ෂත්‍රයක් පාසා මොහොතක් මොහොතක් පාසා මරණය කරා ලං වෙමින් සිටිමු. බුදුරජාණන් වහන්සේ සූත්‍ර දේශනා වලදී මෙන්ම වෙනත් දේශනා වලදී ප්‍රමාද නොවී අප්‍රමාදව සිහි නුවණින් කල්පනාකොට කුසල් දහම් වැඩීමට ක්‍රියාකළ යුතු බව වදාල සේක. මේ සඳහා දම්ම පදයේ අප්පමාද වග්ගයේ එන 10 වන ගාථාව එක් නිදසුනකි.

''අප්පමාදෝ අමතපදං - පමාදො මච්චුනො පදං
අප්ප මත්තා නමී යන්ති - යෙපමත්තා යථා මතා''

(නොපමාව සිහි නුවණින් කුසලයෙහි යෙදීම නිවණට හේතු වේ. සිහි මුලාව කුසලයෙහි නොයෙදීම මරණයට හේතු වේ. නොපමාවුවෝ නොමැරෙති, පමාවුවෝ නොමළත් මළවුන් වැනිය.)

ක්ෂණ සම්පතච්තිය ලෙස දක්වා ඇත්තේ කුමක්දැයි විමසා බලමු. චතුරාර්යය සත්‍ය ධර්මය අවබෝධ කර ගැනීමට අපට ලැබෙන අවස්ථාව නම් ක්ෂණ සම්පත්තියයි. 'ක්ෂණය' කියා වහරන්නේ ඇස පිය හෙලන තරම් මොහොතකින් ගෙවී යන ස්වභාවයයි. භව ගමනෙහි යෙදී සිටින කෙනෙකුට කල්පනා කිරීමට හැකිවන්නේ සිහිය දියුණු කර ගන්නට පුළුවන් වන, නුවණින් විමසා බැලීමට හැකිවන අවස්ථාවක් ලැබෙන්නේ කලාතුරකිනි. ඒ දුරලභවූ අවස්ථාව අපට දැන් ලැබී ඇත. එබඳු ආකාරයකට මනුෂ්‍ය ජීවිතයක් ලැබුණ කෙනෙකුට චතුරාර්යය සත්‍ය ධර්මය ශ්‍රවණය කිරීමට ලැබෙන්නේ ඊටත් වඩා කලාතුරකිනි. මේ කාරණා දෙක උදාවූ විට ක්ෂණ ක්ෂණ සම්පත්තිය සම්පූරණ වීම සිදුවේ.

ඇතැම් සත්වයකුට මේ ක්ෂණ සම්පත්තිය උදාවන්නේ කල්ප ගණනාවකට පසුවයි. මිනිස් ජීවිතයක් ලබා අවුරුදු දහස් ගණනක් ඉපදිලා සිටියා කියා ක්ෂණ සම්පත්තිය උදාවන්නේ නැත. වත්මන් සමාජය දෙස බැලූ විට මනුෂ්‍ය ආත්මයක් ලැබී ඇතත් විවිධ ආබාධවලින් පෙළෙන අය සිටිති. එසේම කිසිම ආකාරයක කුසල් දහම් රැස් කරගැනීමට නොහැකි තත්වයක පසුවෙන අය සිටිති. ඇතැම් අය වෙනත් ආගමික මතවාද හා දෘෂ්ටිවල, ජාතිවල ඉපදී ඒ දෘෂ්ටිවාද, මතවාද වල ඇලී ගැලී සිටිති.

මේ කියන පිරිසට මනුෂ්‍ය ආත්මයක් ලැබී තිබුණත් සද්ධර්මය ශ්‍රවණය කිරීමට තිබෙන අවස්ථාව ගිලිහී ගොස් ඇත. එසේම බුද්ධිමත් මනුෂ්‍යයකු වෙලා ඉපදීමට ඕනෑ තරම් අවස්ථාව තිබුණත් චතුර්රායය සත්‍ය ධර්මය අසන්නට ලැබෙන්නේ නැත්නම් ක්ෂණ සම්පත්තිය උදානොවී භවගමන දීර්ඝකර ගනී.

මේ භව ගමනේ අන්තරාය කාරී බව, ඉමක්කොනක් නැති බව පිළිබඳව අප නිතරම සිහි නුවණින් කල්පනා කළ යුතුය. ජීවිතය කොයි මොහොතේ දී වුවද මරණින් කෙළවර වන බව යථාර්තවාදීව නොසිතන වර්තමාන ලෝකයේ වැඩිදෙනා ධනය උපයමින් ලෞකික සැප සම්පත් ලඟාකර ගැනීමට නොනවතින ගමනක යෙදී සිටිති. මේ ධනය රැස්කිරීම සඳහා ශිෂ්ටයයි සම්මත ලෝකයා විසින් බැහැර කළ නොයෙක් මාදිලියේ අයහපත් හා නොකටයුතු නොපනත්කම් වල නිරතවී සිටිති. අයහපත් සිතුවිලි වලින් චිත්තය පුරවාගෙන පාපකාරී ක්‍රියාවල ඇලීගැලී වාසය කරති. මෙම අගතිගාමී පිරිසයේ අයහපත් ක්‍රියාකාරකම් නිසා ලෝකය සත්වයාට ජීවත් විය නොහැකි වන තරමට අගාදයේ පතුලට ඇදවැටී ඇත.

දැන් අපට මින් පෙර නොලැබුණු ක්ෂණ සම්පත්තියක් හමුවී ඇතැයි සිතිය හැක. අපට ලැබී ඇති මේ ක්ෂණ සම්පත්තිය කල්පගණනාවකට පසුව ලැබුණු එකක් වන්නට පුළුවන. මේ අවස්ථාවේ ඇති වටිනාකම, විරලබව, අප සිහිනුවණින් කල්පනා කළ යුතුය. එක එක්කෙනාගේ මතවාදවලට, කියමන්වලට වසග නොවී තමන් ලබාගත් මෙම ක්ෂණ සම්පත්තිය අහිමිකර නොගෙන කටයුතු කළහොත් ඔබට සසරින් එගොඩ විය හැක. අපතුල පවතින පෞද්ගලික මතිමතාන්තර හැඟීම්, ආශාවන්, පෞද්ගලික ඕනෑ එපාකම් සියල්ලම කැපකර මේ ක්ෂණ සම්පත්තියේ ඇති අගනා බව තේරුම් ගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට අධිෂ්ඨාන කර නොගත් හොත් අපට වැදීම ඒකාන්තවේ. මේ අවස්ථාවේදී අප බුදුරජාණන් වහන්සේ දේශනා කළ චතුර්රායය සත්‍ය ධර්මය අවබෝධකර ගැනීමට කල්පනා නොකළ හොත් බුද්ධිමත්, ඥාණවන්ත කෙනෙකු පවා ධර්මය අවබෝධ නොකර දුගතියට පත්වී භවගාමී ජීවිතයට ඇදවැටේ.

උදාවූ තැන පටන් මොහොතකුදු නොනැවති අස්තය කර ඇදියන හිරු මෙන් සකල සත්වයෝද උපන් අවස්ථාවේ පටන් පැවතීමක් නැතිව මරණය කර ගමන් කරති. නොමැරෙණ ෂත්වයකු නොමැති අතර කොයි මොහොතේදී වුවද ජීවිතය නැතිවී යා හැක. දූර්ලභ වූ නැසෙ ස්වභාවය ඇති ජීවිතය, ''පිට්ටනියක් මැද අවරණයක් නොමැතිව දැල්වෙන පහනක් බදුය. උදයේ තණ අග එල්ලෙන පිණිබිඳුවක් වැනිය. පෙන පිඬුවක් වැනිය. මැටි බඳුනක් වැනිය''. සත්වයාට ඒකාන්තයෙන්ම, නියත වශයෙන්ම පැමිණෙන්නාවූ ''මරණය'' නැවත නැවත නිතර මෙනෙහි කිරීම තුළින් භව ගමන කෙළවර කර ගැනීමට වෙර වීරිය දැරිය යුතුය. ඒ සඳහා අපට ලැබී ඇති මිනිසත් බව හා සද්'ධර්මය ශ්‍රවණය කිරීම යන කරුණු දෙකින් යුක්ත වූ ක්ෂසම්පත්තිය පිළිබඳව නිරන්තරයෙන් සිහිනුවණින් කල්පනා කිරීමට අධිටන් කරගත යුත්තේ වෙයි.

**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ ඩී. එම්. එච්. කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පලකෙරේ.**

# පිංකම්හි අනුසස්

ඉධ නන්‍දති පෙච්ච නන්‍දති
කත් පුඤ්ඤො උභයත්ථ නන්‍දති
පුඤ්ඤං මෙ කතන්ති නන්‍දති
භීයො නන්‍දති සුග්ගතිං ගතො
ශ්‍රද්ධා බුද්ධි සම්පන්න පිංවත,

මාගේ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාරනවා යම්කිසි පුද්ගලයෙක් පිංකම් කරන්නේ නම් ඒ පුද්ගලයාට මා විසින් පිංකම් කළා කියල මෙලොවත්, පරලොවත් සතුටු වියහැකි බව. මෙලොව පරලොව දෙලොවම සතුටුවන පිංවතා සුගතියට පත්වන්නේ බෙහෙවින්ම සතුටුවන බවයි. ඉහත සඳහන් ධම්ම පද ගාථාවේ සඳහන් වෙන්නේ.

පිංවත, මෙලොව පරලොව සැප විපාක දෙන, මෙලොව පරලොව සතුටුවිය හැකි මේ පින්කම් මොනවාද? දස පුණ්‍ය ක්‍රියා හැටියට පිංකම් දහයක් තියෙනවා. "ආරාම රොපා වණරොපා............" ආදී වශයෙන් හැමදා පිං වැඩෙන පිංකම් කීපයකුත් වණරෝප සූත්‍රයේ සඳහන් වෙනවා.

"කඨිනටඨ පරික්ඛාරං වාසදානංච උතතමං......" ආදී වශයෙන් අටමහා කුසල් නමින් මහා පිංකම් අටක් පිළිබඳවත් දේශනා වෙනවා.

වණරෝප සූත්‍රයේ සඳහන් වෙන විධියට පල වැල සහිත ගස් කොළන් සිටු වීම, උද්‍යාන සකස් කිරීම, ගස් වැල් සහිත කැළෑ සකස් කිරීම, ඒදඬු පාලම් සකස් කිරීම, මං මාවත් ඉදිකිරීම, ලිං පොකුණු සෑදීම, කියන කාර්යයන් තුළින් මිනිසුන්, සිව්පාවුන්, පක්ෂීන්, උරගයින් කුරා කුහුඹුවන්ගේ පටන් සියළු සතුන්ට නිරන්තරයෙන් පහසුව සැලසෙන නිසා දිවා රාත්‍රිය පිං වැඩෙන පිංකම් බවට පත්වෙනවා. මේවා තුළින් මෙලොවත් පරලොවත් සතුට සැපත ලබාගන්න හැකියාව තියෙනවා. මහා පිංකම් අට හැටියට සඳහන් වෙන්නේ,

කඨින චීවර පූජාව
අටපිරිකර පූජාව
ආවාස (සංඝාවාස) පූජාව
බුද්ධ ප්‍රමුඛ සංඝයාට දෙන දානය
ශ්‍රී සද්ධර්මය ලිවීම හා ලියවීම
සංඝයාට කෙත්වතු පූජා කිරීම
බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම
සංඝරත්නය උදෙසා පැසිකිලි තනවා පිදීම

ඉහත පිංකම් හේතුවෙන් ලෞකික වශයෙන් ලැබිය හැකි ශ්‍රේෂ්ඨම තත්වය වන චක්‍රවර්තී රාජ්‍යයේ පටන් සියළුම දිව්‍ය මානුෂීය සම්පත් ලබා ගැනීමටත් සසර සිදුව ඇති සුළු අකුසල් සියල්ල නැතිකර ගැනීමටත් හැකියාව ලැබෙනවා. ඒ කියන්නේ මෙලොව, පරලොව සැප ලැබීමට අටමහා පිංකම් ඒ කාන්තයෙන් හේතු වාසනාව ලැබෙනවා.

අපගේ මෙලොව පරලොව සැප විපාක ලැබෙන තවත් පිංකම් දහයක් තියෙනවා. ඒ තමයි දස පුණ්‍ය ක්‍රියා.

දානං සීලං ච භාවනා
පත්ති පත්තානු මෝදනා
වෙය්‍යා වච්ච පචායංතො
දෙසනා සුති දිට්ඨි

මෙහි පළමු පිංකම දානය. දානය විවිධාකාරයෙන් සිදුකළ හැකියි.

ආමිස දාන, අභය දාන, ධර්ම දාන, වශයෙන් දානය ත්‍රිවිධාකාර වෙනවා. මේ ත්‍රිවිධාකාර දාන අතුරෙන් ශ්‍රේෂ්ඨතම දානය ධර්ම දානය බව "සබ්බ දානං ධම්ම දානං ජිනාති" යන බුදු වදනින් දැක ගත හැකියි. ධර්ම දානය කියල කියන්නේ ධර්ම දේශනා කිරීම, ධර්ම සාකච්ඡා කිරීම, දහම්පොත් ලිවීම, ලියවීම, ධර්ම දේශනා කරවීම ආදියයි.

දෙවැන්න උභය දානයයි. උබය දානය කියල කියන්නේ ජීවිතය ලබාදීම කියන එක. ඒ කියන්නේ මරණයට නියමවුන මිනිසුන්, සතුන් මරණයෙන් මිදීම සහ මුදවා ගැනීම.

තුන්වැන්න තමයි ආමිස දානය, ආමිස දානය කියල කියන්නේ ඇසින් දැකිය හැකි, අතින් පිදිය හැකි සියළුම භෞතික වස්තූන් පූජා කිරීම හා පරිත්‍යාග කිරීම හා පරිත්‍යාග කිරීම. මෙහිදී පූජාවන් වශයෙන් මහා පින්කම් අටට අයිති දේවල් ඇතුළුව චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලංපස, කියන සිව්පස පූජාවන් මහසංඝරත්නය උදෙසා පූජා කිරීමත් නිතර පිංවැඩෙන පිංකම් ඇතුළුව ආහාරපාන, ඇදුම් පැළඳුම්, අධ්‍යාපනික උපකරණ, බෙහෙත් ද්‍රව්‍ය, නිවාස ආදිය අනුකම්පාවෙන් රෝගීන්ට, අසරණයන්ට, යාචකයන්ට, දිළින්දන්ට, තිරිසන් සතුන්ට ලබාදීමත් ආමිස දානයට අයිති වෙනවා.

මේ ආමිස දානයේදී පිංවත, ඒ ඒ උත්තමයාගේ ශීලයේ ජ්‍යෙෂ්ඨ භාවයට ගුණයේ ජ්‍යෙෂ්ඨ භාවයට අනුවයි ආනිසංස ලැබෙන්නේ.

පූජාවක් ලෙසින් ලොව්තුරා බුදු, පසේ බුදු, මහරහත් වහන්සේලා උදෙසාත්, මාර්ග ඵලාභී උතුමන් වහන්සේලා උදෙසාද, පෘතග්ජන භික්ෂු භික්ෂුණී, උපාසක,උපාසිකා යන සිව්නක් පිරිස උදෙසාද යමක් පූජා කිරීමෙන් මහත්ඵල මහානිසංස ලබා ගත හැකියි. එහිදීත් උපාසක, උපාසිකා වන්ට පූජා කරන දානයට වඩා භික්ෂු, භික්ෂුණීන්ට පූජා කරන දානයේ ආනිසංස ප්‍රබල වන අතර පෘතග්ජන භික්ෂු භික්ෂුණීන් වහන්සේලාට පුදන දානයේ ආනිසංස ප්‍රබල වන අතර එම දානයට වඩා පසේ බුදු, ලොව්තුරා බුදුරජාණන් වහන්සේට වශයෙන් ආනිසංස ප්‍රබල වෙනවා.

අනුකම්පාවෙන් දෙන දානයත් එයාකාරයෙන්ම දැනගත යුතු වෙනවා.

සඳහන් කරන්නට යෙදුන සියළු දානයන්ගේ ආනිසංස වශයෙන් මෙලොව පරලොව, ආහාර පාන, ඇඳුම් පැළඳුම්, යානවාහන, නිවාස ලබාගැනීමේ භාග්‍ය ලැබෙනවා.

දස පුණ්‍ය ක්‍රියාවේ දෙවන පිංකම ශීලය. පිංවත ශීලය ලෞකික, ලෝකෝත්තර වශයෙන් දෙවැදෑරුම් වෙනවා. පුණ්‍ය කර්ම ගණයට වැටෙන්නේ ලෞකික ශීලය පංච ශීලයේ පටන් උපසම්පදා ශිලය දක්වා සියළුම ශීලයෝ ලෞකික ශීලයන් වන අතර සෝවාන් ඵලයෙන් එහා මාර්ගඵල ලාභී උතුමන් වහන්සේලා ආරක්ෂා කරන ශීලයෝ ලෝකෝත්තර ශීලයන් වෙනවා.

භෝග සම්පත් ලැබීම, කීර්තිය ලැබීම, තේජය ලැබීම, නොමුලාව මරණට පත්වීම, දිව්‍යලෝක සම්පත් ලැබීම, නිරෝගි පැහැපත් සිරුරක් ලැබීම ආදී සම්පත් ලෞකික ශීලයේ බලයෙන් ලබාගත හැකි බව විසුද්ධි මාර්ගයේ සඳහන්ව තිබෙනවා.

දස පුණ්‍ය ක්‍රියාවේ තුන්වන අංගය පිංවත "භාවනා" භාවනාවත් ලෞකික ලෝකෝත්තර වශයෙන් කොටස් දෙකකට බෙදනවා. කමටහන් 40 ක් වූ සමථ භාවනාව තමයි පිංවත ලෞකික භාවනා කොටසට අයිති වෙන්නේ. ත්‍රිලක්ෂණ භාවනාව නැත්නම් විදර්ශනා භාවනාව ලෝකෝත්තර භාවනාව හැටියට හඳුන්වනවා.

පිංවත අපට නිවන් මග විවර කරන්න නම් ලෝකෝත්තර ශීලයත්, ලෝකෝත්තර භාවනාවත් අනුගමනය කරන්න ඕන. මේ ලෝකෝත්තර ශීලයටත්, භාවනාවටත් කියනවා "කුසලය" කියලා. එයින් පැහැදිලි කරගත යුතු විශේෂ දෙයක් තියෙනවා. ඒ තමයි නිවන් දකින්නට නම් කුසල් වැඩිය යුතු අතර අකුසල් දුරු කරන්න ඕන.

සසර සැප ලබන්න නම් පිංකම් කරන්න ඕන. පව්කම් කළොත් සසර අනන්ත දුක් ලබන්න වෙනවා. සසර සැප පිණිස සිදු කළ හැකි භාවනාවන් මොනවාද?

1 දස කසින
2 දස අසුභ
3 දස අනුස්සති
4 සතර බ්‍රහ්ම විහරණ
5 සතර ආරුප්ප
6 ආහාරෙ පටික්කුල සංඥාව
7 චතු ධාතු වවත්ථාන.

පඨවි කසින, ආපො කසින, තෙජො කසින, වායො කසින, නීල කසින, පීත කසින, ලොහිත කසින, ඕතාද කසින, ආලෝක කසින, පරිච්ජින්නාකාස කසින, වශයෙන් කසින භාවනාව කර්මස්ථාන දහයකින් කළ හැකියි. අසුභ භාවනාව උද්ධුමානක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හත වික්ඛිත්තක, ලොහිතක, පුලවක, අට්ඨික වශයෙන් මළ කඳක් දිනෙන් දින විනාශවෙන, වෙනස් වෙන වගේම එහි යථා ස්භාවය මැනවින් දකිමින් දස ආකාරයකින් භාවනා කළ හැකියි.

බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, ශීලානුස්සති, චාගානුස්සති, දෙවතානුස්සති, මරණානුස්සති, කායගතානුස්සති, ආනාපානා සති, උපසමානුස්සති වශයෙන් දස අනුස්සති වඩන්න පුළුවන්.

මේ අනුස්සති වැඩීම තුළින් තුනුරුවන් පිළිබඳව ශ්‍රද්ධාව, තුනුරුවන් පිළිබඳව දැන ගැනීම, සීලය නිවැරදිව ආරක්ෂා කිරීමට පෙළඹවීම, පරිත්‍යාගය, ශ්‍රේෂ්ඨ ගුණයේ පිහිටීම, මරණය පිළිබඳව සිහිකිරීමෙන් පව් නොකර සිටීම, පංචස්කන්ධයේ යථා ස්භාවය යම් පමණකින් තේරුම් ගැනීම වගේම මේ භාවනා කර්මස්ථාන තිහම තුළින් ධ්‍යානඵල සම්පත්තීන් කරා සිතේ සමාධිය දියුණු කළ හැකියි.

ඊළඟට සතර බ්‍රහ්ම විහරණ, සතර බ්‍රහ්ම විහරණ කියන්නේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා වලට මේ හතරෙන් පළමු එක මෛත්‍රියනෙ. මෛත්‍රී භාවනාවෙන් මෙලොව ආනිසංස 11 ක් ලැබෙන බව "මෙත්තානිසංස" සූත්‍රයේ සඳහන් වෙලා තියෙනවා. මේ භාවනා හතරේ උපරිම ලෞකික ඵලය තමයි බ්‍රහ්මලෝක උප්පත්තිය තෘතීය ධ්‍යානය දක්වාත් සිත දියුණු කළ හැකියි.

ඊළඟට ආරුප්ප හතර, ඒ තමයි ආකාසානඤ්චායතනය. විඤ්ඤායතනය. ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤා නසඤ්ඤායතනය. මේ හතර වැඩීමෙන් චතුර්ධ්‍යානය දක්වාම සිත දියුණු කළ හැකිය.

ඊළඟට ආහාරේ පටික්කුල සංඥාව. අපි මුඛයෙන් ඇතුලට ගත්තාවූ ආහරයේ පිළිකුල් බව යථා ස්භාවය මෙනෙහි කිරීම, අවසාන සමථ කර්මස්ථානය චතු ධාතු වවත්ථානය, චතුධාතු වවතථානය කියල කියන්නේ මේ ශරීරය පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වශයෙන් ධාතු වශයෙන් ගෙන මෙනෙහි කිරීම.

පිංවත, මේ භාවනා තුළින් ලැබෙන උපරිම ඵලය චතුර්ථ ධ්‍යානයනෙ. මේ ධ්‍යාන භාවනාව ලිහිල් කිරීමෙන්, අතහැරීමෙන්, සම්පූර්ණයෙන්ම නැතිවෙලා යන නිසා මේවා නිවනට හේතු කාරක වෙන්නේ නෑ. ඒ ලබන භාවනා ප්‍රතිඵල වලින්, ලබන ලෞකික ඥානයන්ගෙන් මෙලොව පරලොව සැප, සැනසීම, ශාන්තිය, ලබා ගන්න පුළුවන් වෙනවා.

දස පුණ්‍යක්‍රියාවල 4,5 පුණ්‍ය ක්‍රියාවන් වෙන්නේ පිංදීම සහ පිං අනුමෝදන්වීම.

ඊළඟට "වෙය්‍යා වච්ඡ" වෙය්‍යා වච්ඡ කියන්නේ වත්පිළිවෙත් කිරීම, මොනවද වත්පිළිවෙත් කියන්නේ. තමන්ගේ නිවසට මහා සංඝරත්නය වඩිනවිට දෙපා දෙවීම, අසුන් පැනවීම, පවන් සැලීම, පෙරගමන් පසු ගමන් කිරීම, විහාරස්ථානයට ගිය විට මළුපෙත්මං ඇමදීම, වෙහෙර විහාර පිරිසිදු කිරීම, කුණු රොඩු ඉවත් කිරීම, ගිලං භික්ෂූන් වහනසේලාට වයෝවෘද්ධ භික්ෂූන් වහන්සේලා නෑවීම, සිවුරු සේදීම, ආදි කටයුතු වත්පිළිවෙත් කියන්නේ.

මේ තුළින් ලැබෙන පිං මහිමයෙන් නිදුක් නීරෝගී බව, සිතේ තැන්පත් බව, කෙලෙස් තුනී වීම, මානය අඩුවීම, මෑදුමොලොක් සිරුරක් ලැබීම. කීර්තිය, තේජස, ලෞකික ප්‍රඥාව ලබාගන්න පුළුවන් වෙනවා. මීළඟ පුණ්‍ය කර්මය වන අපචායනය නැත්නම් වැඩිහිටියන්ට ගෞරව කිරීම, වැදීම, පිදීම තුළිනුත් ඉහත ආනිසංසයෝ ලැබිය හැකි වෙනවා.

ධර්ම දේශනයත් ධර්ම ශ්‍රවනයත් දස පුණ්‍යක්‍රියාවට අයිති පිංකම් දෙකක්. අවසාන පුණ්‍ය ක්‍රියාව "දිට්ඨිජු කර්ම" දිට්ඨිජු කර්ම කියල කියන්නේ තමා තුළ පවතින දාන, ශීල, භාවනා දී පුණ්‍ය ක්‍රියා පිළිබඳව පැහැදීම, ප්‍රසාදය, නිවැරදි බව දැකීම, තමන් කරන යම් පුණ්‍ය කර්මයක් තියෙනවා නම් ඒ පිළිබඳව නිවැරදි අවබෝධයකින් කර්මය කර්ම ඵලය අදහාගෙනම කරන්න ඕන. ලාභ, ලෝභ, කීර්ති, ප්‍රසංසා ලැබීම සඳහා පිං නොකිරීමයි "දිට්ඨිජු කර්ම" කියල කියන්නේ. ඉහත සඳහන් ආකාරයේ පුණ්‍ය කර්ම සිදුකොට පිංවත ඔබගේ මෙලොව පරලොව දෙලොව සැනසීම ලබත්වා.

**දේශකයාණෝ ගොකරැල්ල ශ්‍රී ධර්මප්‍රදීපාරාමාධිපතිණි ශාස්ත්‍රවේදී වත්තේගම කුසලධම්මා මෙහෙණිය.**

# දානය ගැන දැනගනිමු

## සත්පුරුෂ දාන අට

මජ්ඣිම නිකායෙහි අට්ඨක නිපාතයෙහි සත්පුරුෂ දාන සූත්‍රයෙහි සත්පුරුෂ දාන අටක් ගැනද සඳහන් වේ.

1. පිරිසිදු දෙය දීම (සුචිං දෙති)
2. ප්‍රණීත දෙය දීම (පණීතං දෙති)
3. සුදුසු කල්හි දීම (කාලේන දෙති)
4. කැපවූවක් දීම (කප්පියං දෙති)
5. පරීක්ෂා කොට දීම (විචෙය්‍ය දෙති)
6. නිරතුරු දීම ( අභිණ්හං දෙති)
7. දෙමින් සතුටු වීම (දදං චිත්තං පසාදෙති)
8. දුන්පසු වඩාත් සතුටු වීම (දත්වා අත්තමනො හෝති)

මේ අයුරින් යමෙක් දානය දීම කරයි නම් ඔහු සත්පුරුෂයෙක් වශයෙන් සත්පුරුෂ දානයක් දෙන්නෙක් වෙයි. අප විසින් දිය යුත්තේද එසේමය.

අද බොහෝ දෙනා දන් දෙන්නේ නිසි අවබෝධයකින් තොරව බව ඔබටද වැටහී යනු ඇත. එවන් දාන අසත්පුරුෂ දාන පහට ගැනෙනු ඇත.

1. සකසා නොදීම
2. ගෞරවයෙන් නොදීම
3. සියතින් නොදීම
4. ඉවත දමන්නාක් මෙන් දිම
5. කර්මපල ඇදහීමෙන් තොරව දීම

## 1. සකසා නොදීම

සමහර අය කාර්යය බහුලත්වය නිසා හෝ අවිවේකී බව නිසා දීමට අවශ්‍ය නිසා කලබලයෙන් එහෙන් මෙහෙන් තම්බා ලුණු ඇඹුල් පවා පදමට නොදමා මනාව සකස් නොකොට කලබලයෙන් විහාරස්ථානයට හෝ නිවසකට ගොස් අමනාපයෙන් මෙන් දන් දීම මෙම සකසා නොදිමට ඇතුලත් වේ. එවන් දානයක් තුළින් මහත් වූ පිනක් ලැබිය නෙහෙකිය. එය අසත්පුරුෂ දාන ගණයට අයත් වේ.

ඔබ ඔබේ හදවතට කතාකර බලන්න. මේ අයුරින් නොදැන හෝ දානය දී ඇත්නම් මින් ඉදිරියට ගෞරවාන්විතව සැළකිල්ලෙන් යුතුව දානය පිරි නමන්න ඔබට මහත්පල මහානිසංස හිමි වීමට භාග්‍ය ඇත.

## 2. ගෞරවයෙන් නොදීම

ඔබ යමක් දෙනවානම් එය ලබන පුද්ගලයා මොන තත්වයක ජීවත් වන පුද්ගලයෙක් වුවත් එය ඔහුට දිය යුත්තේ ගෞරවයකිනි. යාචකයෙකුට විය හැක, අසල්වැසියෙකුට විය හැක, සිල්වතෙතකුට විය හැක. එසේත් නැතිනම් තිරිසන් සතෙකුට වියහැක. මේ කාට දුන්නත් ඔබේ හදවතේ අන්කම්පාව, කරුණාව, වෛරයෙන් කෝපයෙන් කරදරයෙන් බේරීමට පිළිකුල් සිතින් අහක බලාගෙන තිරිසන් සතෙකුටවත් යමක් නොදිය යුතුය.

යාචකයෙක් පැමිණි විට පොතු ගැලවුන බෙලෙක් පිඟානකට හෝ අඬුව කැඩුන කෝප්පයකට කහට ටිකක්, ආහාර ගේ ඉදිරිපිට මිදුලේ වාඩිකරවා දෙන නෝනාවරුන් මා දැක ඇත්තෙමි. ඒ අවස්ථාවන්හීදී ඔබ යමක් දුන්නායයි එබට හැඟෙන්නට ඇති. එහෙත් එය ඔබ සත්පුරුෂව දුන් දෙය නොව අසත්පුරුෂව දුන් දෙයක් බවට පත්වන අයුරු සිතට ගන්න. මා මෙයින් අදහස් කරන්නේ ඔබේ නිවස තුළටම කැඳවා කැම කාමරයේ කැම මේසයට තබා දීමක් නොව එසේ කිරීමට ඔබට හැකියාවක් ඇත්නම් ඔබ නියම සත්පුරුෂයෙක් මය.

නිවසෙහි ඉදිරි පසට එන බල්ලෙකුට පූසෙකුට මොන කරදරයක්ද මන්ද? කියමින් ආහාර ඔබ ඉන්නා තැන සිට ඈතට විසිකිරීමෙන් වැලිගොඩවල් වලට හෝ ගහක මුලට හැලීම සුදුසු නැත. තිරිසනෙකුට වුව ආහාරයක් දිය යුත්තේ අනුකම්පාවෙනි.


## 3. සියතින් නොදීම

යම් කිසි කෙනෙකු දානයක් පිළියෙල කර නිවසෙහි සිටින මෙහෙකාර කොළුවා අත හෝ වෙනත් පිටස්තර කෙනෙකු මඟින් හෝ විහාරස්ථානයේම සේවය කරන පුද්ගලයන්ට පණිවිඩ යවා ගෙන්වා ගෙන දානය යැවීම සත්පුරුෂ ක්‍රියාවක් නොවේ. එය අසත්පුරුෂ දානයට ඇතුළත් වේ.

දානය පිළියෙළකර සියතින්ම පිරිසිදු සිතකින් යුතව පිළිගැන්වීමට උත්සහගන්න. කොතරම් දුර බැහැර වුව මොන වැඩක් තිබුණත් ඔබ දෙන්නේ දානයක් නම් සැදැහැ සිතකින් යුතුවම පිළිගන්වන්න. එයයි නියම වූ දානය. ඉන් ඔබට මහානිසංස ලැබිය හැක.

## 4. ඉවත දමන්නාක් මෙන් දීම

දානය නැමති උතුම් ක්‍රියාවෙහි නියැලෙන ඔබ ශ්‍රද්ධාවෙන් යුතුව මහා කරුණාවෙන් එය කළ යුතුය. එසේ නෙමෙතිව ඔබට පාවිච්චියට ගත නොහැකි දෙයක් ඉවත දමන්නාක් මෙන් යමෙකුට පරිහරණයට හෝ ආහාරයට ගැනිමට දීම සත්පුරුෂ ක්‍රියාවක් නොවේ. නරක් වූ ආහාරයක් යමෙකුට නොදිය යුතුය. යාචකයෙකුට ආහාරයක් වේලක් දෙන අවස්ථාවක වූවත් අනුභව කළ හැකි ආහාරයක් පිඟානකට බෙදා එයට අවශ්‍ය පමණට ව්‍යඤ්ජනද බෙදා බිමට දිය බඳුනක්ද සමඟ දෙන්න. එසේ කිරීමට නම් ප්‍රථමයෙන්ම ඔබේ සිත තුල අනුකම්පාව, කරුණාව, දයාව තිබිය යුතුය. එවිට කුස ගින්නේ සිටින තැනැත්තා ආහාර ගන්න අයුරු දකින ඔබට අප්‍රමාණ සතුටක් දැනෙනු ඇත. ඔබ කළ ක්‍රියාවේ උපරිම ප්‍රතිඵල ඔබට ලැබෙනු ඇත. සතෙකුට දෙන



ආහාරයක් වූවත් හොඳින් මිශ්‍රකර ලෑල්ලකට හෝ භාජනයකට දමා දීමට පුරුදු වන්න. ඒ මන්ද යත් සතාට ඔහුගේ ආහාරය මිශ්‍රකර අනා ගැනිමට නොහැකිය. එසේ නොදෙන විට ඒවා අසත්පුරුෂ දාන ගණයට වැටෙනු ඇත.

## 5. කර්මපල ඇදහිමෙන් තොරව දීම

විවිධ වූ පුද්ගලයන් විවිධ ඉටුකර ගැනිමට දන්දීම් කරති. කීර්ති ප්‍රශංසා ලැබීමට, උදව් උපකාර ලැබීමට, ප්‍රසිද්ධිය ලබා ගැනීමට සහ අන්අය අභිබවා යාමට සිටින අය අතරේ පරලොව සුගතියක් ලබාගැනිමට එනම් මතු උපදින ආත්මවල සා පිපාසාවක් නොමැතිව යස ඉසුරු සම්පත් ලබාගැනීමට දන්දෙන අයද වෙති. තවත් කොටසක් තමන් තුළ ඇති ආශාව ලෝභය තුනීකර ගැනිමටත් එමඟින් නිවන් මාර්ගය අවබෝධ කර ගැනීමටද පිවිසීමක් වශයෙන් දන්දීම කරති. එසේ ලෞකික ලෝකෝත්තර ලාභ ලබාගැනීම පිණිස දන්දීම කර්මපල ඇදහිමේ ගණයට අයත් වේ. එසේ නොමැතිව දන්දීම අසත්පුරුෂ දාන ගනයට අයත් වේ.

ඒවගේම තමන් පරිභෝජනය කරන ආකාරයට වඩා පහත් ලෙස කරන පරිතයාග දාන කරන තැනැත්තා දාස දාන දායකයෙක් වේ.

තමන් පරිභෝජනය කරන ආකාරයටම කිසිවක් අඩු හෝ වැඩි නොකොට දෙන තැනැත්තා දාන දායකයෙක් වේ. තමා පරිභෝජනය කරන අකාරයට වඩා ඊට හාත්පසින්ම වෙනස් අන්දමට පිළිවෙලට ප්‍රණීතව මනාලස දන්දිම දානපති දායකයාගේ ලක්ෂණයකි.

ඔබත් මේ වනතෙක් දන් දිම් කළ තැනැත්තෙක් නම් ඔබ ඔබේ හදතට තට්ටු කර බලගන්න. ඔබ මේ දාන අතුරෙන් මොන ස්ථානයේ සිටින්නේද කියා ඔබටම ඔබ ගැන අවංකව සතුටු විය හැකිනම් අන්අය මොනවා කීවත් ඔබටකම් නැත. ඔබ ගැන ඔබට අවංකව සතුටුවිය නොහැකි නම් ලෝකයාම ඔබ ගැන වර්ණනා කළත් එයින් එලක් නැත.

ලබන කලාපයෙන් තවත් දානය ගැන දැන ගනිමු.

**ලලිතා හෙට්ටිආරච්චි දේවහුව.**

# ලාංකීය ගීත කලාවේ භාරතීය බලපෑම


ඒ.එල්. බෂාම්ගේ "අසිරිමත් ඉන්දියාව" ග්‍රන්ථය ඇසුරිනි.

හිරු නගින විට බැස යන සඳ හිරු බසින විට යළි නැග එයි. ඒ මේ ලොව යථා ස්වභාවය ලොවට කියාපාන්නට මෙනි. දින, සති, මාස, අවුරුදු ගෙවෙමින් කාලය ගෙවී යද්දී හිරු සඳු එලෙසින්ම තම දෛනික රාජකාරිය ඉටු කරයි. එසේ ගෙවී යන කාලයේ තවත් එක් වසරක් උදාවී මාසයක් ම ගතවී හමාරය. මා මේ ලියන්නේ එවන් ගතවී යන කාලයේ එක් හෝරාවකය.

කාලය කෙසේ කොයි ලෙසින් ගෙවී ගියත් අප සැම කෙනෙකුටම ගෙවී ගිය අතීතයේ යම් යම් සොඳුරු මතකයන් නොනැසී පවතී. සැම රටකටම, ජාතියකටම උරුම වූ සාහිත්‍යාංගයන් ඒ අතර සුවිශේෂී තැනක් ගනී. අප රටේද එසේ ඉතිරි වූ සාහිත්‍යයක් ඇත. ඒ අතර ජන කවි, ජන කතා ද විශාල ප්‍රමාණයක් පවතින අතර වත්මන් සමාජයටද සුවිශේෂී පාඩම් රැසක් ඉන් ඉගෙනීමට ඇත්තේය. නමුත් මා මේ කථා කිරීමට යන්නේ අපේ ජන කවි හෝ ජන කතා ගැන නොවේ.

අපේ අසල්වැසි රටක් වන ඉන්දියාවේ සාහිත්‍යාංගයක් පිළිබඳවයි. එය මා උපුටා ගනු ලබන්නේ ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ඉන්දීය ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය "බී.ඒ, පී.එච්.ඩී, එෆ්.ආර්.ඒ, ඒ.ස් උපාධිධාරි "ඒ.එල්.බෂාම්" මහතා විසින් ලියන ලද "The Wonder That was Ondia" නම් කෘතියේ සිංහල පරිවර්තනය වන "අසිරිමත් ඉන්දියාව" නම් කෘතියෙනි. බෂාම් මහතා මෙය ලියා ඇත්තේ මුසල්මානයන් ගේ ආගමනයට පෙර ඉන්දීය අර්ධ ද්වීපයේ පැවති සංස්කෘතිය පිළිබඳ සමීක්ෂණයක් ඇසුරිනි.

එම ග්‍රන්ථයේ භාෂාව සහ සාහිත්‍යය පිළිබඳව හඳුන්වා ඇති කොටසින් උපුටා ගන්නා ලද්දකි මේ. ඒවා ද අප රටේ මෙන්ම ගැමි ජනයාගේ දුක, ශෝකය, කඳුල, සුසුම, සතුට, භීතිය, ත්‍රාසය, සොම්නස, දොම්නස කැටි කර ගත් ඒවා විය හැකි යයි එය කියවා අවසන මා හට සිතේ. මා මෙම ලිපියේ මාතෘකාව ලෙසින් උපුටා ගන්නේද එම ජන කවිවල එක්තරා කවියෙකු ලියූ කවියක කොටසකි.

"අප මෙතෙක් කථා කළ සාහිත්‍ය දීර්ඝ සම්ප්‍රදායන් ඇති සාහිත්‍යය මගින් කරන ඒවායි. සමහර කවි සම්මාන සංස්කෘත සාහිත්‍ය තරම් ක්‍රමානුකූල නැති බව පෙනේ. තැනින් තැන, විශේෂයෙන්ම දෙමළ සාහිත්‍යාවලින් හා ප්‍රාකෘත "සප්තශතකයේ" අපට මුඛපරම්පරාගත ජනකවිවල ස්වභාවයක් යම්තමින් දක්නට ලැබේ.

අප දන්නා තරමින් කිසිම ඉන්දීය ලේඛකයෙකු පැරණි ඉන්දියාවේ ජන කවි එක් රැස්කර නැත. නූතන කවි හා සමාන කර බලන කල වැදගත් ජනකවි රාශියක් තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් කවි කිහිපයක් චීන පරිවර්තන වලින් සුරක්ෂිත වී ඇත. මේවා ප්‍රාග් ගුප්ත යුගයේ නියම ජනකවි වල කියුම් යයි සිතිය හැක. සංයුක්ත නිකාය නම් බෞද්ධ පිටක ග්‍රන්ථය ක්‍රි.ව 440 පමණ දී චීන බසට පෙරළිණ. එසේ පෙරළෙන ලද්දේ ක්‍රි.ව 411 දී පාහින් විසින් ලංකාවේදී,

*"ඇතැම් විට පශ්චාත් ද්‍රවිඩ සාහිත්‍යයේ වැදගත්ම පුරුෂයා වීරමාමුණිවර් (1680-1747)ය. ඒ වූ කර දෙමළ රටේ 36 වසක් ඉගැන්වූ ඉතාලි ජේසුයිට් වරයෙකු වූ කොන්ටන්සියෝ බේස්කි පියතුමාගේ අපලි නාමයයි. පැරණි ක්‍රිස්තියානි මිෂනාරීවරුන් බොහෝ දෙනෙක් මෙන් ඔහු සපුරාම ඉන්දීය ක්‍රමයට ජීවත් විය. ඔහු දෙමළ බස මැනවින් උගත්තේය. සාහිත්‍යය රීති ද උගත්තේය. ඉන් පෙර හෝ පසුව කිසිම යුරෝපියයකු එතරම් හොඳින් ඉන්දීය බසක් උගත්තේයැයි සිතිය නොහේ. බේස්කිගේ "තෙම්බාවනිය" පැරණි හා අලුත් තෙස්තමේන්තුවල කතා සාටෝප අලංකාර දෙමළෙන් කියන්නකි. ඔහුගේ රීතියත් වස්තු විකාශනයත් සම්ප්‍රදායානුරූපය. එහෙත් ඔහුගේ කෘතිවල මැසෝගේ ආභාෂය පෙනේ. මේ කොටසට කරුණුත් චීන කවිවල පරිවර්තනයත් ආචාර්ය ආතර් වැලිගෙන් ලැබිණ. පළමුවරට ඒවා මෙහි පළකිරීමට අවසර දීම ගැන අපි ඔහුට ඉතා ණය ගැත්තෙමු."*

ලබා ගන්නා ලද පිටපතක් බලාගෙනය. මේ පොතේ අග පාලි පොතේ නැති කොටසක් තිබේ. එය පාහියන්ගේ අත් පිටපතේ තිබෙන්නට ඇත. මෙහි තිබෙන කවි ක්‍රි.පූ 1 වන සියවසේදී පාලි පිටක එක් රැස් කරන ලද කාලයත් ක්‍රි.ව 5 වන සියවසත් අතර සමයේදී දඹදිව ගයන ලද ඒවා විය හැකිය.

අප දක්වන ඡේදය නොයෙක් ලෞකික ගීත අසා ඒවා මදක් වෙනස් කොට බෞද්ධ පරමාර්ථයට අනුව හැඩ ගැස්වූ භික්ෂුවක් ගැන විස්තර කරයි. එබැවින් මෙහි පළමුවෙන්ම දක්වනු ලබන කවියට කලින් එන්නේ කරදරයක් නැතිව නිවහනට යන්නට සිතා භික්ෂුව විසින් ගයන ලද්දකි. අනෙක් ඒවාද මෙබඳුම වෙයි.

### සැමියාගේ පවුල සමග ආරවුල් කරගත් ස්ත්‍රියගේ ගීතය

ගංගා නදිය
මට දැණ් අවැසි වනුයේ
ඔබගේ ගලන දිය හා බැඳී
මැදු සේ මුහුදට පාවන්නටය.
මගේ මාමණ්ඩිය හෝ නැන්දම්මා විසින්
නිතරම කළහ කරනු ලැබීම්
වළක්වා ගනු සඳහාය"

### පුහුල් හොරාගේ ගීතය

කාන්තිමත් චන්ද්‍රයාණෙනි.
පිටතට නො එන්නැයි යැදිමි
ඉන්නා තැන ඉන්න
මා මේ පුහුල් කපන තුරු
මා මගේ පුහුල් හසු නොවී ගන ගියාට පසු
ඔනෑ නම් පිටතට එන්න
ඔනෑ නම් ඔහේ ඉන්න.

### දුප්පතාගේ ගීතය

මට එක ඌරෙකු ඉන්න තුරු
හොඳ මදිරා එක බඳුනක් තිබෙන තුරු
මදිරා වත් කරන්නට එක බඳුනක් තිබෙන තුරු
නැවත නැවතත් බඳුන පුරවන්නට කෙනෙකු ඉන්නා තුරු
මට මේ ටික තිබෙන තුරු
මට කිසිවකින් කරදරයක් නැත

### වර්ෂාව ඇති රැයෙක සිය පෙම්වතා හා නියම කරගත් පරිදි යද්දී පය ලිස්සා මඩේ වැටුණු කෙල්ලකගේ ගීතය

මා හිසකේ ලිහාලා අවුල් විය.....
මගේ ලස්සන මාලය ගැඹුරු මඩේ වැටිණ
මගේ මුදු හා වළලු කැඩී
අවලස්සන විය
මා ප්‍රියයා වෙතට අා විට ඔහුට
අඳින්නට දෙන්නේ කුමක්ද?

### සිය අනියම් බිරිඳ සමග විනෝද ගමනක් ගිය ප්‍රියයකුගේ ගීතය

අපේ පහසුව හා විනෝදය ට පෙම් සිතුවිලි බරව
අපි නිල් තුරු සෙවණේ රැඳෙමු
ගලන නදියේ වේගයෙන් පිවිතුරුව ගලයි
මගේ වීණාවේ හඬ ගීතවත්ය. මිහිරිය
අපේ සැපයට වැඩි සැපයක් කොතැනක නම් ඇත්ද?

### කොබෙස්සතුට අවවාද

කොබෙය්ය. ආහාර රැස් කර ගන්න
තල, වී මෙනේරි ආදිය එක් රැස් කර
කඳු මුදුනේ ගසකට ගෙන යන්න
ඉතා උඩින් ඔබේ කුඩු ගුහාව තනා ගන්න
එවිට අහසින් දිය වැටෙන කාලයෙහිදී
ඔබට වාසස්ථාන, ආහාර පාන නො වරදවා ලැබේවි

මෙයට අනුව බලන කල අපට පෙනී යන්නේ සිංහල ජන කවිය හා සමානවම ගැමි සරල සුගම බස් වහරකින් ඉන්දීය ජන කවියද සැදෑ ඇති බවකි. ගැමි ජනයාගේ කඳුලේත් සිනහවේත් අපූර්ව සංකලනයක් මෙයින්ද පෙන්නුම් කරන බව මා හැඟි සිතිවිල්ලකි.

ශාස්ත්‍රවේදී එස්. දිල්රුක්ෂි අබේකෝන්

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER
රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

## නිදහස් සිතුවිලි සිතනා සිතත් උදාරයි

සෑම වසරකම පෙබරවාරි මාසය එළඹෙන්නේ ශ්‍රී ලංකාව අධිරාජ්‍යවාදීන්ගෙන් යටත් වීමේ උදාර සිතුවිල්ලද අප වෙත ගෙනඑමිණි. 1815 දී ශ්‍රී ලංකාද්වීපය යටත් වීමෙන් අනතුරුව 1818 සහ 1848 සිදුවූ නිදහස් අරගලයන් පසුබිමේ බුදුදහමේ සහ බුදු සසුනේ පැවැත්මට එල්ලවූ දැඩි බලපෑම් ද හේතු වූ බව ඉතිහාසය පෙන්වා දෙයි. 1847 දී ඉංග්‍රීසිහු දළදා වහන්සේගේ භාරකාරිත්වයෙන් ඈත්වීම, වෙහෙර විහාර, දේවාල සඳහා පැනවූ දැඩි නීතිරීති මෙන්ම භික්ෂූන් වහන්සේලාගෙන් පවා බදු අය කිරීමට පෙළඹීම වැනි රුදුරු තීරණ ඒ අතර මුල් තැනක් ගනී.

ඌව වෙල්ලස්සේ සහ මාතලේ දී පිළිවෙලින් 1818 සහ 1848 ඇතිවූ නිදහස් අරගලයන්හිදී ඊට මඟ පෙන්වූ භික්ෂූන් වහන්සේලා සහ වෙහෙර විහාර වෙත ඉංග්‍රීසින් එල්ල කළ රුදුරු ප්‍රහාරයන් ද මෙවැනි මොහොතක සිහිකළ යුතුවේ.

1848 නිදහස් සටනේ කේන්ද්‍රස්ථානය වන්නේ රංගිරි දඹුලු විහාරස්ථානයයි. එකී අරගල හමුවේ ජාතියේ නිදහස උදෙසා දිවි පිදූ භික්ෂූන් වහන්සේලා සිහිපත් කිරීම ද අපගේ වගකීමකි.

බෞද්ධ දර්ශනයට අනුව අප වෙත ජීවන විමුක්තියේ සහන් පණිවුඩය ලැබුනේ මහින්දාගමනයෙනි. සියලු තෘෂ්ණාවන්ගෙන් මිදී සදාකාලික සුවය ඇති නිර්වාණ සුවය ලැබීම බෞද්ධයන්ගේ පරම චේතනාවය. ඉන් මෙහා අප ලබන සියල්ල තුළ ඇත්තේ දුක් සහිත බවය. අස්ථිර බවය.

මිනිස් චින්තනය සර්ව සම්පූර්ණයෙන්ම නිදහස් නිවහල් විය යුතු ආකාරය කාලාම සූත්‍ර දේශනාවෙන් බුදුරජාණන් වහන්සේ මැනවින් පෙන්වා දෙනු ලැබූ සේක.

දේශපාලන, ආර්ථික, සමාජීය, හෝ වෙන අන් කවර හෝ පටු බැඳීමකට කොටු නොවී කටයුතු කිරීමේ ශ්‍රේෂ්ඨ මානව නිදහස එයම වන්නේය.

අධිරාජ්‍යවාදීන්හු නික්ම යන්නේ ආර්ථික, දේශපාලනික සහ අධ්‍යාත්මක වශයෙන් යළි කිසිඳු දිනෙක අත්මිදිය නොහැකි සංකල්ප ජාලයක අපව සිරකර තබමිනි. 74 වසරක් පුරා අප එය දෙතුන් ගුණයකින් නොව හත් අට ගුණයකින් පටලවාගෙන එහිම ගිලී, එහිම සිරවී පවුල, පන්සල දක්වාම බේද කරගෙන අවසන්ය.

මෙවන් මෝහ ඝනාන්ධකාරයන්ගෙන් මිදීමේ ඒකායන මාර්ගය වන්නේද බුදුදහම නිවැරදිව අවබෝධ කරගැනීමය. පිළිපැදීමය. ඒ අනුව ජීවිතය සකස් කරගැනීමය. ඒ සිදුවන තාක් සැබෑ නිදහස අපට තවත් දුරින් දුරය.

# ලොව රකිනා දහම



**දසමාසයක් කුස තුළ නවාතැන් දුන් මෑණියන්ට තම නිවෙස තුළ දිවි ඇතිතෙක් නවාතැන් දෙන්නට නොහැක. මානව වෙස්ගත් වානරයන්ට ඒ මවගේ සුසුම් පොදක් බණ පදයක් වී නොඇසෙන්නේ මන්ද?**

සෝදා පාළුවට ලක් වූ කඳු මුදුනක සිට පහතට ගලාගෙන ආ පස් තට්ටුවක් කළුගල් දෙබුක්කාවක සිර වුණු වල් අන්නාසි ගසක රැදුණි. ඒ පස්ටික මහත් ඕනෑකමින් තුරුළු කරගත් වල් අන්නාසි පඳුර ආඩම්බරයෙන් තම විසිරුණු මුල් ශාඛා පස් අතර රඳවයි. ඉන් ශක්තිමත් වූ පස් තට්ටුව ඊළඟ මහ වැස්සෙන් ගසාගෙන යන්නට ඉඩක් නොලැබෙන පරිදි තැන්පත් වෙයි. දෙදෙනාගේ අන්‍යොන්‍ය සුහදත්වය මගින් වල් අන්නාසි පඳුර ලස්සනට වැඩි පස් තට්ටවක් බදාගෙන සිටින අයුරු බලන්නට මහා පඳුරු මැදින් ලස්සන සරුසාර මල් ගොබයක් මතු වී තිබේ.

සෙවණ දුන් ගස පූජනීය කළ බුදුරජාණන් වහන්සේගේ නාමයෙන් ගහකොළ ඇළ දොළ, ඉරහඳ දේවත්වයෙන් පිදුම් ලැබූ අතීතාවර්ජනා භාවනාවක යෙදීමම තේරුම් ගත් මාර්ගඵලය නම් ගුණමකුවකුට වඩා ගුණ සැලකීම ශක්තිමත් බලයක් ඇති පෙළහරක් බවයි.

''ලොව දුර්ලබම දහම කළගුණ දන්නා බව...'' යැයි දේශනා කළ තථාගතයන් වහන්සේගේ පරමාදර්ශය කොඩිවැල් දහසක්, පැන්කල දහසක්, ප්‍රදීප අසූහාර දහසක්, මල්මාල, සුවඳ දුම් ආදී භෞතිකමය පූජෝපහාරයන්ගෙන් මැනිය හැකි දැයි සිතෙන්නේ මා දන්නා දේ අංශු මාත්‍ර බැවිනි.

දසමාසයක් කුස තුළ නවාතැන් දුන් මෑණියන්ට තම නිවෙස තුළ දිවි ඇතිතෙක් නවාතැන් දෙන්නට නොහැක. මානව වෙස්ගත් වානරයන්ට ඒ මවගේ සුසුම් පොදක් බණ පදයක් වී නොඇසෙන්නේ මන්ද?

ඇඳුම් පොට්ටනිය තුරුළු කරගෙන වයස හැට හැත්තෑවේ පියවරු වැඩිහිට නිවාසයේ සිට අසළ පිහිටි වැව දෙසට පිය මණින අයුරු දුටු මා මදක් වාහනය නතර කර ඒ පෙරහැරට සාදුකාර දුණි.

පියවරුනි! නුඹලාගේ ලෙයින් උපන් මහ සිටුවරු මහ මන්දිර වල යහළු මිත්‍රයන් හා සමඟ ප්‍රියසාද පවත්වද්දී නොදැනුවත් කමින් හෝ දරුවන්ගේ ප්‍රීතියෙන් ඔද්දල්ව ගිය සිතිවිල්ලෙන් හැදිවතේ සුලු දිය ගලා ගියේ යැයි ඔවුන් උරන වීද?

ගොම මැටි ගෑ ගෙබිම හුරු වූ දෙපා ඔවුන්ගේ මාළිගාවන් හි ඔප දැමූ වීදුරු පොළවට අකීකරු වී බිම ඇද වැටී එතැන මළ පහ වුනත්? සිහිනෙන් වත් දරුවන් ගැන අහිතක් නොසිතන බුදු ගුණ දන්නා පියවරුනි ! මට යාමට අවසර ! මගේ පියා මා එන තුරු මඟ බලා සිටින බැවිනි.

"බුදු හිමියනි මේ ශාසනය හරි අඩක්ම පවතින්නේ කළ ගුණ සැලකීම මත නොවේද?...."

"නැත ආනන්ද එසේ නොසිතන්න.. මගේ ශාසනයේ අඩක් නොව මුළුමනින්ම පවතින්නේ කළගුණ සැලකීම මතය.."

එම ගුරුගෝල වදන බණ පොතේ සැඟවී තිබුණත්, ගුරුවරු හමුවේ ගෝලීයකරණය වූ ගෝලබාලයන් අද හැසිරෙන්නේ අඳ බාල මිනිසුන් පරිදිය.

ගසක පිපුණ මල පරවී වැටෙන්නේ ද ගස මුලටමය. එය පොහොරක් වී ගසටම කෘතවේදී වන්නා සේ හා හැදූ වැඩූ ලෝකය මට හොඳ නරක කියා දුන් ලෝකය, මට ජීවත් වීමට උරුමය සලසාදුන් ලෝකය, මා නිසා සැනසේවි යැයි පතන්නට මට අයිතියක් ඇත. ඒ අයිතිය මට ලබා දුන්නේ කෘතවේදී ඔබයි..

**පොතපත ඇසුරින්**

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

කවියට ලැදි රංගිරි ශ්‍රී ලංකා පාඨකයින් උදෙසා කවියට කවිය 'කවි පැන' තීරයේ පල කිරිමට අප සූදානම්ය. ඒ සඳහා පද දෙකකින් යුත් රසවත් කවි පැන අප වෙත යොමු කරන්න.
සංස්කාරක කවි පැන.....




## රංගිරි කවිය

එදා අඳිරද බලය සන්තර ගුවන නිවහල් ධජය සැලුණා
මෙදා රුපුසෙන් යළිත් පරදා සිංහ නාදයෙ රාව නැගුණා
පුදා ජීවිත් හලා කඳ දෙරණ රතු කැට ඔපය වැටුණා
සදා කාලෙන් සදා කාලෙට නිදහසේ මල් සුවඳ හමණා

අහංගම

## කෙම්බිම

රස කවි කලාවෙන් මට ලැබ දුන් සවිය
දිරිමත් කලාවේ එය හඳුනන දිවිය
මෙය ලියැවෙන්නේ පතමින් සාමය සුවය
දෙ අතම මුදුන් ද නමදිමි සරසවිය

කවි බස ගලා යනවිට හල හල අමෝද
මහවැලි ගඟ වගේ උතුරා යයි මහද
මම මෙත වඩමි ඔබ හැමගේ හද වැළඳ
තුති පෙරටුවෙන් පිනිදෙමි හැගුමෙන් සුහද

ජීවය ආත්මය කරගෙන ගමන් යමි
මේ යන ගමන අවසන කෙක් නොනවතමි
දහමයි කලාවයි කවදත් හැදින්නෙමි
ඉසි කෝ මද මාන පුහුදුන් නුරුස්සමි

කෙනෙකුගේ ළඟට පත් වුන විට සරසවිය
දැහැමිය සැහැලුය සංවේදිය දිවිය
පතමින් ඔබ හැමට පිවිතුරුමය සුවය
ලියැවුනි ආත්මය කර ගනිමින් කවිය

හෙළ රජ දවස සිට ආ අපගේ කවිය
නංවා ගැනුම අප සතු අප යුතුකමය
කවියනි, කිවිදියනි නමදින සරසවිය
ඔහ ලද කුසල අගයුම තුළ අපමණය

සාහිත කලා කෙත අස්වද්ද විය බැතින්
දෙවි බුදු පිහිට යැද නමදිමි නැමුනු හිසින්
හමුවන තුරා කෙදිනක හෝ හැලුන හදින්
කෙම්බිම සොයා යමි පිවන කදුල මැදින්

විල්ප්‍රඩ් මීපුර
කුරණ - මීගමුව

## දෝනිගේ පැතුම

චූටි දෝනි ඇහැරෙන්නකො
දැන් වෙලාව උදේ තුනයි
දියනි තවත් ගුලි ගැහෙනවා
තව චුට්ටක් නිදා ගන්න

අනේ අම්මේ ඔබ දෙන්නකො
මට චුට්ටක් නිදාගන්න
අයදිනවා චූටි දෝනි

ඔයා නිදාගෙන හිටියොත්
හතරට එන වෑන් එකේ
ස්කෝලෙට යන්න වෙන්නෙ
නෑ ඔයාට, මම දන්නෑ
අම්මා මුමුණනවා ඇසේ

සැතපුම් ගණනක් ඈතක
තියන මගෙ ස්කෝලෙ
බැරිද අම්මෙ ළඟට ගන්න
මට පුලුවනි හැමදාමත්
එළිවෙනකම් නිදාගන්න

චන්ද්‍රා ජයසුන්දර
රඹිල්ලගස්කඩ

දේශයට
ගාපයක් වන
පාලකයින්ට
ලකුණු දාන
නාටකයක
යතාර්ථය...

කුමුදුලි

## දයාබර මෑණියනි...

ජීවිතය ගලන ගංගාවකට සම නම්,
එය සුන්දරයි...
ජීවිතය මල් විලකට සම නම්,
එය සුන්දරයි....
මා, මේ ජීවිතය ලැබුවේ ඔබගෙනි,
එහි අරුත විමසුවේ ඔබගෙනි,
එය අලංකාර කර ගත්තේ ඔබ මගිනි,
එය රැකගත්තේ ද ඔබ සමගිනි,
එබැවින්
එය හිමි ඔබටමය..
දයාබර මෑණියනි...
මාගේ මේ දිවිය..
ඔබට පූජා කරනෙමි..
බැති සිතින්...



මධුවන්ති වීරරත්න
දඹුල්ල ජාතික පාසල

## දුරක ගිය ඔබ....

*ජීවිතේ දුර යන්න*
*අත්තටු වලට සවිය දෙන්න....*
*හඬා වැටෙන සනැදුරු අඳුරට*
*පුන් සඳ වී පායන්න....*
*වැටෙන විට නැගිටින්ට*
*දෙපා වාරුව වී ඉන්න....*
*ජීවිතේ තියං දාව*
*වැහි බිඳක් වී වැටෙන්න...*
*දුක් කඳුළු වැටෙනවිට*
*එකිනෙකට*
*ඒ කඳුළු පිසලන්න.....*
*ජීවිතේ වසත් කල අරුත්*
*හිරු කුමරු ඔබ එන්න...*

කුමුදු ජයවර්ධන-මාතලේ

## ආවාටයට ප්‍රහාරයක්

හිරු දෙවිගේ සැඩ කිරණ ගෙන සිසිල තැවරුවෙමි
රැය අඳුර සිඳ පැමිණ මිහි මවට තනි රකිමි
රුවැති කඩුපුල් මලක මිහිර නරතුරු දුටිමි
බැතිමතුන් බුදු පුදට යනෙන මග හෙළි කළෙමි

හඬන කිරි දරුවනට සිහින කිරි පැහි ගෙනෙමි
බිළිඳු සිනහව දකින දෙගුරුනට ඉගි කරමි
තුරුණු දෙහදක රැඳුනු පෙමට කවියක් වුනෙමි
ළඳක පියකරු වතට සොඳුරු උවමක් මවමි

පතා ලොවිතරු වරම කුමරු සිදුහත් එදින
නික්ම ගිය මග සොඳින බැබලුවෙමි සඳ රැසින
දහමි පණිවුඩ රැගෙන යොදුන් දුර මග ගෙවන
සඟුන් පිරිවර යනෙන සැතපුවෙමි සඳ දියෙන

සොමි ගුණෙන් පරිමිතව අද මෙන්ම පෙර දිනද
සදා හිතැතිව විසිමි මනු සතට මිහිකත
එවන් මෙහෙයකි නිබඳ මගෙන් ඉටු වුනි නොමඳ
මනු ලොවින් අද කිමද මෙවන් අතවර සබඳ

සොයා නිල් දිය කඳුරු දෙවුනි පීඩා නොලස
උදම් වුයෙදු කෙලෙස රිදුම් දී සඳවතට
විදිනු සඳ රැස් සිසිල මනු සතට නිති උරඟ
ඔබ ඔතැන මා මෙතැන එයම වේ දිය දහම

මාලා විජේකෝන් - උතුරුකැලිෆෝනියාව

## අම්මා පමණි
## පුතකුගෙ තනියට ඉන්නේ ...

ලොව කිසිවෙකුට කිසිදින කළ නොහැකි මිලක්
මුවගින් ගලා එන්නේ පිය වචන පෙළක්
ජීවන කතර මැද දුටුවෙමි සොඳුරු විලක්
අම්මා මගේ එහි සුපිපුන සුවඳ මලක්

අප වෙත හඹා එන විට ගැරහුම් නින්දා
නොබියව මුහණ දී ඒ බාධක බින්දා
සිරිදුව වෙසින් සිට සුව සහනය කැන්දා
අප දිවි මාවතේ ඔබ ජය දද බැන්දා

දෙතොළග පිපි සිනා හිමමෙන් පිරිසිදුය
පිවිතුරු හද මඬල මල් පෙති මෙන් මුදුය
පෙන්වන ආදරය අප කාටත් පොදුය
හිරු සඳු කුමට.. අම්මා ලොව හිරු සඳුය

පෙම්මා වැඩූ මුළු ලොව හැම දරුවන්නේ
සම්මා ජීව ගුණයෙනි දිවි ගෙනියන්නේ
නිම්මා නැති සුවඳ සෙනෙහස පුදමින්නේ
අම්මා පමණි පුතකුගෙ තනියට ඉන්නේ

සුරංජි වාසනා
නාත්තන්ඩිය.

## දුරලා භේද සැම අපි රට ගොඩ නගමු

මිනිසත් ගුණය පෙන්වා මුළු ලෝ කයට
මෙත්තා කරුණා මුදිතා පා ලක් දණට
තිස් වසරක් පැවති යුධ ගිනි නිමා කොට
නිවහල් රටක් ඇත සාමය උදා කොට

වනසනු එපා රැකගත් රට රණ විරුවන්
කුළ මල එපා අපි ඔක්කොම රට වැසියන්
මත භේදයන් දුරලා හැම පුර වැසියන්
එක්වෙමු සදා අත්වැල් බැඳ සේ නෑයන්

අවිහිංසාව අප රට තුළ රජ කරමු
අඩමිටුවන් නොවී දැහැමිව දිවි ගෙවමු
දුරලා භේද සැම අපි රට ගොඩ නගමු
මුළු ලෝකයට අපි ආදර්ශය ගෙනෙමු

අනුලා එම්. හේරත්
අත්තනකඩවල



## විභාග ප්‍රතිඵල

ජීවිතයම වෙනස් කරන
උසස් පෙලින් කියනු ලබන
ආසාවෙන් බලා හිටිය
විභාග ප්‍රතිඵල ඇවිල්ල
කන්න බොන්න වෙලා නැතිව
සිනා සෙන්න වෙලා නැතිව
ගමන් යන්න වෙලා නැතුව
පාඩමටම වෙලා ගත්ත
විභාග ප්‍රතිඵල ඇවිල්ල
විභාගයේ නිසි ප්‍රතිඵල
මහන්සියෙන් නිසි ප්‍රතිඵල
ලබාගත්ත දූ දරුවන්
මව් පියන් ද සමඟ එක්ව
උදම් අනයි සතුටු සිතින්
තමා හිතපු දේ නොලැබුන
දේ ගැන පසු තැවිල් වෙමින්
මුළු ලොවක් නැති වූ සේ
තව දරුවෙක් සුසුම් හෙලයි
ජය මාවත විවර කරන මඟක්
ලෙසට සිතා ගන්න ඔබ අද
ලැබූ පරාජයත්........
ගෙන ධෛර්යය ඔබේ සිතට
වැඩ කළහොත් ඔබේ සිතට
ඔබට හැකිය ජය ගන්නට
ඉදිරි දිනක මුළු දිවියම

හෙදි තිලකාරී ජයසුන්දර

## මුළු රට වටේ ළෙලදේවා සිංහ කොඩි

රණවිරු විජය ඩෙන්සිල් වැනි රණ විරුවෝ
අල්ගම ලකි-ජානකලගෙ පණ නැසුවෝ
රණවිරු රිචඩ් වැනි දහසක් රණ විරුවෝ
රට වෙනුවෙන් ඒ ජීවිත පුද කෙරුවෝ

කිතුල් උතුවෙ මිනිසුන් කපලා මැරුවා
දිඹුලාගල සමිදුගේ ජීවිත නැසුවා
කිරිදරුවන් උදුරගෙන පොළවේ ගැසුවා
කොටි හපුවන් ළඟයි යන්නට කම්මුතුවා

කිලිනොච්චියෙන් ජයගෙන රණවිරුවො එඩි
අලිමංකඩත් ජය ගත්තනෙ තබා වෙඩි
වත්මන් ගැමුණු රජු තව තව පෙරට වඩී
මුළු රට වටේ ළෙලදේවා සිංහ කොඩි


තෙන්නකෝන් රත්නායක
දේවහුව

## පාරමී පුරන්නම් අම්මේ...

මගේ ලොව එකම සඳ
ඔබයි ආදර අම්මේ
සැමදාම ළිහින් හිඳ
අවවාද දුන්නෙ ඔබ..
මේ රුදුරු ලෝකයේ
දේවතාවිය ඔබයි..
සෙනෙහබර නෙතු ඔබේ
මැවී පෙනෙනවා මට
දුකින් තනිවුණ විටදී
ළඟින් සිටියා ඔබ
ඒත් අම්මේ ඔබ කොහෙද
අද දවසෙ....
තනිවෙලා මා මෙලොව
හැමදාම සන්සාරේ
ඔබ මගේ වෙන්න
පාරමී පුරන්නම්...

ජානකී ඉරුගල් බණ්ඩාර
නුවරඑළිය

# සිතීමේ හා විමසීමේ නිදහස



නිදහස් චින්තනයේ මුදුන් මල්කඩක් වැනි බෞද්ධ දර්ශනයේ සිතීමට හා විමසීමට ලැබෙන්නේ උසස් ස්ථානයකි. සමහර ශාස්තෘන්වරයන් තම ලබ්ධිය දේශනා කළා විනා පෙරලා ඒවා පිළිබඳයව ප්‍රශ්න නැගීමට අවස්ථාව ලබාදුන්නේ නැත. සමහර ශාස්තෘවරයන් ගුරුවරයාගෙන් ප්‍රශ්න නැගීම පාපී ක්‍රියාවක් ලෙස දේශනා කර ඇත.

බුදුපියාණන් වහන්සේ දේශනාකර ඇත්තේ, '' තථාගතප්පවේදිනො භික්ඛවේ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡනෙනා '' (අංගුත්තර නිකාය - තික නිපාතය)
(මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා විනය විවෘත වුයේ බබලයි. වැසුනේ නොම බබලයි)

බුදුන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්ට දුන් නිදහස තරම් උතුම් වරප්‍රසාදයක් වෙනත් ශාස්තෘවරයෙකු අනුගාමිකයනට දී නැත. උන්වහන්සේ දුන් අවවාදය නම් ආත්මය, ද්වීපයක්, පහනක් කොට ආත්මාරක්ෂාවක් කොට වසව් යන්නයි. වෙන කිසිදු පිළිසරණක් නොපතම් යන්නයි. ඇතැම් ආගම්වලින් කෙරෙන්නේ (ඉහත කථාකළ හින්දු ආගම මෙන්) මිනිසා දෙවියකුගේ හෝ ශාස්තෘවරයෙකුගේ වහලෙකු බවට පත්කිරීමයි. ගැති බවට යටත් කිරීමයි.

මිනිසාට සිතීමට හා විමසීමට දොරටුව විවෘත කොට ඇති බව සූත්‍ර කීපයකින් පැහැදිළි වේ. කාලාම සූත්‍රය, විමංසක සූත්‍රය, මහා පදෙස සූත්‍රය ඉන් කීපයකි. මෙයින් කාලාම සූත්‍රයට මුල් තැන හිමිවේ. වරක් බුදුන් වහන්සේ කොසොල් රට කේස පුත්ත නමැති නියම් ගමට වැඩම වූ කළ කාලාම නමින් ප්‍රසිද්ධව සිටි මිනිසුන් උන්වහන්සේ කරා පැමිණ මෙසේ පවසා ඇත.

භාග්‍යවතුන් වහන්ස, මේ නියම් ගමට කලින් කල බුද්ධිමත් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ පැමිණෙති. ඔවුහුම තමන්ගේ මතවාද ප්‍රකාශ කෙරෙති. අනුන්ගේ මතවාද හෙළා දකිති. එයින් කුමරු සත්‍ය පවසත්ද, කුමරු අසත්‍යවාදීහු වෙත්දැයි අපි බලවත් සැකයට විමතියකට මුහුණ පා සිටිමු. බුදුන්වහන්සේ කාලාමයනට මෙසේ පිළිතුරු දුන්හ.

''එථ තුමෙහ කාලාමා මා අනුස්සවෙත, මා පරථපරාය, මා ඉතිකිරාය මා පිටක සම්පදානේන, මානක්කහේතු, මා භය හේතු, මා ආකාර පරිවිතක්කේන, මා දිට්ඨි නිජ්ඣාන ඛන්තියා මා භබ්බ රූපකාය, මා සමනො නො ගරුති යදා තුමෙහ කාලාමා අත්ත නාම ජානෙය්‍යාථ ඉමෙ ධම්මා අකුසලා ඉමෙ ධම්මා සාවජ්ජා ඉමෙ ධම්මා සවනතා සමා දින්නා අහිතාය දුක්ඛාය සංවත්තනිති'' කාලාමයෙනි,

1. යම් අදහසක් වේදයෙහි එන නිසා
2. පරම්පරාවෙන් එන නිසා හෝ
3. මෙසේ වන්නට ඇතැයි අනුමානයෙන් හෝ
4.තමාගේ පිටකයෙන් එන සම්ප්‍රදායයන්ට සමානයැයි පෙනුමෙන් හෝ
5.තමන් දන්නා කියන දෙයට අනුකූලය යන පෙනුමෙන් හෝ
6. තමන් දන්නා න්‍යායයට අනුකූලයැයි කියා හෝ
7. මතුපිට ආකාරය හොදය යන පෙනුමෙන් හෝ
8. තමන් පිළිගත් දෘෂ්ඨියට එකඟය යන ආකාරයෙන් හෝ
9. පුද්ගල ගෞරවය නිසා හෝ
10. මොහු අපගේ ගුරුවරයා යන ගුරු ගෞරවය නිසා හෝ නොපිළිගන්න.

මේ දහම් අකුෂල්ය. මේ දහම්වාද සහිතය. මේ ධර්මය බුද්ධිමතුන් විසින් ගර්හිතය. මේ දහම් පිළිගැනීම අහිත පිණිස දුක් පිණිස පවතී යයි යම් අවස්ථාවක ඔබටම වැටහේ නම් එහිදි අත්හරින්න, බැහැර කරන්න.

ඉහත දේශනයෙන් බෞද්ධ දර්ශනය තුළ විමසීමට කොතරම් නිදහසක් ඇද්ද ස්වාධීන චින්තනයට කොතරම් ඉඩ ෂලසා ඇද්ද යන කාරණය මනාව ස්ඵුට වෙයි.

මැදුම් සඟියේ විමංසසා සූත්‍රයේදි මෙසේ ද වදාරා තිබේ. ශ්‍රාවකයන් විසින් තථාගතයන් වහන්සේ පවා විමසා බැලිය යුතුයි. ශාස්තෘවරයා සම්‍යයක් සම්බුද්ධ ද නැද්දැයි වටහා ගත හැක්කේ එසේ විමසා බැලීමෙනැයි පැවසූහ.

මෙවැනි ශ්‍රේෂ්ඨ වචනයක් නසිහ ශාස්තෘවරයෙකු ගේ මුවින් පිටවූයේ නැත. යම් අදහසක් පිළිබඳව නිගමනයකට බැසීමේ තවත් ක්‍රමයක් අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ මහා පදේශ සූත්‍රයෙන් දැක්වේ. එහිදි පෙන්වා දි තිබෙන්නේ,

01. යමෙකු තමා බුදුන් වහන්සේ වෙතින් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි යමක් ඉදිරිපත් කළත් - බුධාපදේශ
02. යමෙකු තමා අසවල් විහාරයේ සංඝයාගෙන් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි ඉදිරිපත් කළත් - සංඝාපදේශ
03. යමෙක් යමක් අසවල් විහාරයේ බොහෝ භික්ෂූන්ගෙන් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි ඉදිරිපත් කළත් - සම්බහුල තෙථරාපදේස
04. යමෙකු යමක් අසවල් විහාරයේ ධර්මදර විනයදර උගත් භික්ෂුවකගෙන් අසා පිළිගත් ධර්මයක් හෝ විනයක් යයි යමක් ඉදිරපත් කළත් - එකථෙරාපදේස

එය එක්වරම පිළිගැනීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් නොකොට එය සූත්‍ර විනය දෙක හා සසදා ගැලපේ නම් පමණක් පිළිගැනීමමත් නොගැලපේ නම් ප්‍රතික්ෂේප කිරීමටත් අවස්ථාව ෂලසා තිබේ.

යම් අදහසක් පිළිබඳව යථාර්ථය තේරුම් ගැනීමට උපයෝගීවන කරුණු හෙවත් උපදේශ 4ක් බුද්ධඝෝෂ හිමියන් විශුද්ධි මාර්ගයේ දක්වා තිබේ. එනම්,

සුනත, සුත්තානුලොම, ආචරියාවාද, අත්තනොවකි යන කාරණා ෂතරයි.

යමෙකු යම් කරුණක් ඉදිරිපත් කළ විට එය සූත්‍රයක දක්නා ලැබේද නොලැබේද සූත්‍රයට අනුලෝමද නැද්ද ආචරියාවවාදයට අනුකූලද නැද්ද තමාගේ මතයට ගැලපේද නැද්ද කියා විමසීමෙන් අනතුරුව පිළිගැනීම නිවැරදි බව එහි දක්වා තිබේ.

මේ ආකාරයට සිතීමේ හා විමසිමේ නිදහසට බෞද්ධ දර්ශනය තුළ ඇත්තේ සුවිශේෂී තැනකි. එය බුදුදහමේ ශ්‍රේෂ්ඨත්වයයි.

**රුවන් ජයවීර**

# යථාවබෝධයෙන් භාවනා කරමු

මිනිස් බව ලැබීම දුර්ලභ අවස්ථාවක් වන බව බුද්ධ දේශනාවේ සඳහන්ය. අප උත්සහ ගත යුතු වන්නේද ඒ ලද මිනිස් බවින් උපරිම ප්‍රයෝජන ගෙන තමන්ටත් සමාජයටත් අර්ථකාරී ලෙස ජීවිතය හැඩ ගසා ගැනීමය. බෞද්ධයන් ලෙස අපගේ සාස්තෘන් වහන්සේ පෙන්වා දුන් මඟ ගමන් කිරීමය. ඒ සඳහා අනුගමනය කළ යුතු මූලික පියවර තුනකි. එ **නම්** දානය,සීලය,භාවනා, යන ත්‍රිවිධ පුන්‍ය ක්‍රියාවන් ය.

දානය විවිධ අර්ථයන්ගෙන් විවරණ වේ. නිවැරදි දේ කිරීම, බොරු නොකීම, සත්‍ය වචන කථා කිරීම, කේලාම් නොකිම, අන්‍යයන්ගේ අර්ථවත් වැඩ ගැන කථා කිරීම, මෘදු වචන කථා කිරීම, හිස් බව නොකියා අර්ථ දේ කිම, ආදී මේ සියල්ලටම නිවැරදි පිළි පැදීම උතුම් දානයයි. ඒ සඳහා අවශ්‍ය වන්නේ නිවැරදි අවබෝධය පමණි. ජීවිතය අර්ථවත් කර ගැනීමට අර්ථවත් දේ සිතීමද මහගු දානයකි. නිවැරදි දැක්මට අනුව අර්ථවත් සමාජ අවබෝධයකින් යුතුව කටයුතු කිරීම සමාජයට දිය හැකි දානයකි.

පුද්ගලයකුට තම කාය කර්ම වුවද සමාජයට හිතකාමී ලෙස ඉටු කිරීම ඉතා වැදගත්ය. සීලයෙන් කය හා වචන දෙකේ මිනිස් කම චරිතවත් කම සීලාචාර බව බෞද්ධ කම තහවුරු වේ.

සිතෙහි ක්‍රියාකාරීත්වයන් මුළුමතින්ම පාලනය වන මෙහෙයුම් බල වේගය හෙවත් පද්ධතිය සිතයි. ඕනෑම කෙනෙකුට ක්ෂණිකව සිතුවිල්ලකින් මහා දාමරිකයකු වීමට සේම සියළුම දුක් දොම්නස්සයන් විඳ දරා ගනිමින් නිවී සැනසුන පුද්ගලයෙකු වීමටද සිත බලපායි.

ඒ සඳහා අවශ්‍ය වන්නේ තම සිත තමාට අවනත කර ගැනීම පමණි. සිත දෙස බැලීමට හදුනා ගැනීමට හික්මවා ගැනීමට සංවර කර ගැනිමට ඇති මනෝවිද්‍යාත්මක උපක්‍රමය ලෙසට භාවනාව" හඳුන්වා දෙයි.

දානයෙන් පමණක් සීලය හා භාවනාව යන උසස් ගුණ නොවැඩේ. එයින් තෘෂ්ණාව තාවකාලිකව යටපත් කිරීමට හා තුනි කිරීමට පමණක් ඉඩ ලැබේ.

දානයෙන් දාන සීල දෙකේ වැඩුනොත් එයින් භාවනාව නොවැඩේ. එයින් ආමිස පූජාවෙන් භාවනාවට අවශ්‍ය කරන සූදානම් පරිසරයක් ගොඩ නැගේ. එලෙසම භාවනාවෙන් ත්‍රිවිධ පුණ්‍යත්‍රීයාවම වැඩේ. තණ්හාව මුල් කොට ගත් කෙලෙස් උපාදාන හා සංයෝජක තදංග (මොහොතකට) (කාලයකට) සමුච්ඡේද (මුළුමනින්ම) යනාදි වශයෙන් පියවරෙන්පියවර ප්‍රහීණ කරගැනිමටත් ඇති එකම මඟ භාවනාවයි.

භාවනාව සඳහා අවශ්‍ය වන කායික මානසික හා භෞතික පරිසරය ගොඩ නගා ගැනිම හා විධිමත්ව සූදානම් වීම සඳහා දානය වත් පිළිවෙත් හා ආමිස පුජා ඇතුලත් වන චාරිත්‍ර සීලයන්, පංච සීලයන්, උපොසථ සිලයන්, දස සීලයන්, සාමණේර සීලයන්, ඇතුලත් වන චාරිත්‍ර සීලයන් පූර්ව කෘත්‍ය වශයෙන් වැඩීම අවශ්‍ය වෙයි. භාවනාවේ ප්‍රභේද 02 කි. එනම්, සමථ හා විප්පස්සනා යනුවෙන් හඳුන්වයි.

## සමථ භාවනාව

පංච නීවර්ණයන් තාවකාලිකව යටපත් කරන , සංසිඳුවන, සමථයකට පත් කරවන භාවනාව සමථ භාවනාවයි. මෙය සමාධියත් සමාධිය මඟින් සිතත් දියුණු කර ගැනීමට උපකාරී වන බැවින් සමාධි භාවනාව චිත්ත භාවනාව යන නමින්ද හදුන්වයි. භාවනා ක්‍රම 40 කි. ලෞකික සමාධිය දියුණු කර ගෙන ධ්‍යාන හා අභිඥා උපදවා ගැනීමටත් එම ගින් බඹ ලොව උපත ලබාගැනීමටත් අවස්ථාව සලසා ගතහැක.

## විපස්සනා භාවනාව

ජිවිතය හා ලෝකය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ආදී වශයෙන් ඇති සැටියෙන් විවිධාකාරයට දැකීමට බැලීමට අවබෝධ කර ගැනීමට පකාරී වන්නේ විපස්සනා" භාවනාවයි. මහා සතිපට්ඨාන සුත්‍රයේ දී විදර්ශනා භාවනාවට කර්මස්ථනෙ 21 දේශනා කොට ඇත. විදර්ශනා භාවනා ක්‍රමය බුදු දහමේ හැර ලෝකයේ අන් කිසිම ආගමික, දර්ශනයක , ශික්ෂණයක , ප්‍රතිපදාවක , කිසිම දිනක ඇතුලත් නොවේ. එය බුදුදහමට ආර්ය මාර්ගයට පමණක් ආවේණික වු භාවනා ක්‍රමයයි.

මාර්ග ඵල ලැබිම සඳහා රූප ධ්‍යාන තත්වය පසු කළ යුතුව ඇත. ධ්‍යාන වලට එලබ ගත් පුද්ගලයාට නැව ඒ වාට සමවැදිය හැකිය. අභිඥා උපදවා ගත හැකිය.

යහපත් මනුෂ්‍යයෙකු ලෙස ජිවත් වෙමින් මාර්ග ඵල ලබාගෙන නිර්වාණාව බෝධය සඳහා සෑම දෙනාම වීර්ය කරගත යුතුය.

**චවින්ද්‍රා නිරෝමණි වෛද්‍යරත්න.**

# වැව් කර්මාන්තය බෞද්ධ සංස්කෘතියේ කැඩපතයි



**වැ**ව යනු සිංහල මහා සංස්කෘතියේ පදනමයි. ලක්දිව පුරා පැතිර ඇති අනන්ත වැව් වලින් කාන්දු වුනු ජලයෙන් කෙත්වත් හා මනුෂ්‍ය වර්ගයාත්, සත්වයනුත් පොෂණය ලැබීය. ඒ නිසාවෙන් වැව මේ රටේ ජාතික ආගමික අනන්‍යතාවයක් ගොඩ නගන්නට දායක වුණු ප්‍රධානතම සාධකය විය. ඒ මතින් ගලා ගිය ජන ගී රාවයන් ඔස්සේ අද අපිට සිංහල මහා සංස්කෘතියත් සිංහල සමාජයත් මනාව හඳුනා ගත හැකිය.

" ඔන්න බලාපන් බුලතා කරපු බලේ
යතුරු දාපු ගල් දොරයට වතුර හැලේ
යන එන්නෝ නිම නැරම බැලුම් ගලේ
සොර බොර වැව නොදුටු ඇස් මොටද පින් කලේ"

වැවක් යනු ගමෙහි හදවතයි. එහි කේශ නාලිකා වැවෙන් ගලා යන දිය පහර වල සමුදායයි. සමස්ථ ගමට ජීවිතය දෙන්නේ වැව බව හදුනා ගත් සිංහල ගැමියා වැව හැදු සියලු මිනිසුන්ට ගෞරවාදරය පුද කළේය. ඔවුන් දේවත්වයෙන්ද සලකන්නට තරම් විශිෂ්ඨ ජාතියක් බවට පත් විය. ගන්නා පැන් උගුරක් දිය දොතක් ගානට ඔවුන්ට දැනෙන සිහිල සැනසුම විද ගන්නේ වැව හැදු මුතුන් මිත්තන්ට පින් දෙමිනි. ඔවුන් වැවෙන් ගමන් මතුවට ප්‍රර්ථනා කළ උතුම් සම්පතක් ලෙසින් සැළකුවේය. මේ එබඳු කවකි.

"උට්ඨි මඩුව ගම නම් යස මගය බොලන්
දොරකඩ මල් යහන ඊළඟ වැවය බොලන්
බත බුලතින් දුක් වින්දා නොවෙයි බොලන්
උට්ඨ මඩුව ගම ජාතින් පතම් බොලන්"

සිංහලයෝ වැවෙන් දාගැබන් එක ලෙසට සැළකූහ. දාගැබෙන් ඔවුන් බුදුන් වහන්සේ සංකේතවත් කළේය. ගම සශ්‍රීක වන්නේ වගා කරන්නට දිය දහර දෙන වැවක් වදින්නට පුදන්නට වැඩ සිටින බුදුන් නිසා බව ඔවුහු සිතූහ. එයින් හැගවෙන්නේ වැව සිංහලයා නිදහස් නිවහල් භාවයකට කැදවාගෙන ගිය බවයි. වැවෙහි දිය රදා සිටින වැව් බැම්මට පවා පිං දුන්නේ එය සිංහල මහා සංස්කෘතිය රදා පවතින බල වේගය වූ නිසා බව පහත සඳහන් කවියෙන් පෙනෙයි.

"අපේ ගමේ වෑ කන්දේ පලයල්ලා
පුංචි දිවුල් ගැට නල නල කාපල්ලා
දෝත පුරා පැන් අරගෙන බීපල්ලා
කුලං කුට්ටි බැම්මට පිං දිපල්ලා"

වැව නිසා ලැබූ අධ්‍යත්මික ඵලයද බොහො ජන කවි වලින් මතු කොට ගත හැකිය. මේ කවි පෙනෙන්නේ වැව අවසානයේදී සිංහල ගැමි බෞද්ධ සංස්කෘතියකට පදනම දැමූ බවයි. මෙ එබදු කවියකි.

"වෙලාවට පිපුණු මල වැනි රැකේ සඳුන්
කෙළා බමරු එන ඩලෙස ඝණ වැදුම් පිදුම්
බලි ඉන්න බැරි දෙනුවන් පිරී කඳුලින්
කලා වැව දිහා බලා වැඩ ඉන්න බුදුන්"

අවුකන බුදු හිමියන්ගේ දෑස් යොමුව ඇත්තේ කලා වැව දෙසටය. උන්වහන්සේ ගේ දෑසේ කඳුළු පිරී පැවතිනි. එයට හේතුව වැව සෑදු ශ්‍රේෂ්ඨයා පුත්‍රයා අතින් ඝාතනය වනු උන්වහන්සේ දුටු නිසාවෙනි. මේ පැදියෙන් හෙළ ගැමියා වැව සමඟ කොතරම් අධ්‍යාත්මිකව බැදී ඇත්දැයි පැහැදිළි වේ.

"ඇරැවුලට නිසි ඔබිනා කොත් ගලට
අලංකාර වැව සැදුනයි සොඳ රුවට
ඊට යටින් සොද කෙත් යායයි රුවට
නිවන් දකින තුරු වළිමුව දඹුල්ලට"

ගමක් අලංකාර වන්නේ එහි ඇති සොබා සිරියෙනි වැව හා පන්සල හා සමඟ තිබූ ඉතා දැඩි සබැදියාව මෙයින් පැහැදිලි වේ. වැව සිංහලයාගේ සෞන්දර්ය ද උත්පාදනය කළා වු අපූර්වතම ස්ථානයක් විය. වැවේ සිරියෙන් මත් වු ගැමියන් මුවින් සොඳුරු කවි සිතුවිලි පහළ වීම ද අරුමයක් නොවේ. සොර බොර ආශ්‍රිතව ගොඩ නැගුණු මෙබඳු කවි මීට හොද නිදසුනකි.

ඉරේ රුවට බලාපන් ඉර ගල වැටෙ කොට
සඳේ රුව බලන් සඳ ගල වැටෙන කොට
මලේ රුව බලන් අතු අග පිපෙන කොට
වැවේ රුව බලන් කොග්ගල පිරෙන කොට"

ඔබන් මොබන් ඔබ සොර බොර වැවාණෝ
අඩා දිය වදින මහවැලි ගඟාණෝ
දිය නොසිදෙයි ඔබ සොරබොර වැවාණෝ
නිල් මල් බිසව් දිය කෙලිනා වැවාණෝ "

වැව ඇසුරු කොට ගෙන ගොඩ නැගෙන ජන ජීවිතයද වැව සමඟ අධ්‍යත්මිකව බැදුනකි. ඒ නිසා වැවෙහි සොදුරු බව වැව හරහා ගොඩ නැගුණු නිමල බෞද්ධ සංස්කෘතිය සිංහල ගැමියාගෙන් ඈත් නොවුණු බවට පහත පැදිය නිර්දේශන සපයයි.

සොර බොර වැවෙන් ඕළු මලක් නෙලාගෙන
මහවැලි ගගෙන් දියදොතක් තෙමාගෙන
මහියංගනේ මහ වෙහෙරට පුදාගෙන
එන්නඩ ඉතින් මතු දිවියේ පතාගෙන


වැව සිංහල මහා සංස්කෘතියට පදනම වූ බවටත් හය බුදු සමයේ පමනක් නොව අන් සියළු සමාජ ආර්ථික ඵලයන් හි පදනමු බවත් ඉහත නිදසුන් වලින් පැහැදිලි වේ. එහෙයින් කිව හැක්කේ වාපී" සංස්කෘතිය නැත්නම් වැව් සංස්කෘතිය ස්ථාපිත නොවුයේ,

සිංහල බෞද්ධ සංස්කෘතියක් අපට අහිමි වන බවයි. පැරණි ගැමියා නොව අදටත් අප වැවට පිං දිය යුත්තේ ඒ බැවිණි. අපේ හෙළ සංස්කෘතිය එහි පවතින නිසාවෙනි.


**එස්.ඩී.අබේකෝන්**

## පුර පසළොස්වක රජරට

පොරණ රණ විකුම් පෑ හෙළයෝද
වැව් තල දිය දිසේ
දෙරණ අනුබුදු රැසින් ඒකාලෝක වී
මිස්සක දෙසේ
වරණ පස් දුටු වරුද යති බණ
පද අරුත් පැහැදිලි ලෙසේ
ලියන ලද පොත පතද දුටු
ජන ඥණය බැතිබර හද වෙසේ
පුරන පාරමිතා උතුම් මහ
උයන මෙවුනා උවසු සේ
කරන ලද පින් උවැසියන්නේ
සාදු සාදු නඳ ඇසේ
පෙරෙන සඳරැස් ජය සිරිමහ
බෝදුමින්දු රැ දිසේ
අරණ හද නමා බවුන් වඩනා
කෙලෙස් බර නොදනුණු ලෙසේ.



උ.ක.උ. විජේසිරි



# අකුසල් සිත්

පළමු, දෙවන, තුන්වන, හතරවන ආදී ධ්‍යාන වලින් යුත් එනම් අධි චිත්තයෙන් යුත් පුද්ගලයන්ට රාග, දෝස, මෝහ අරමුණක් තම සිතට පැමිණෙන විට ඒවා ඉවත් කරගෙන සිත පිරිසිදු කරගන්නා ආකාරය, මජ්ඣිම නිකායේ එන විතක්ක සණ්ඨාන සූත්‍රය (බු.ජ.ම.නි.1 - පි.අ.300) තුළින් භාග්‍යවතුන් වහන්සේ දේශනා කර ඇත.

යෝගාවචර ජීවිතයන් ගතකරන බොහෝ දෙනාට භාවනාවේදී එන ප්‍රධාන ගැටලුවක් වන්නේ තම සිතට විවිධ අකුසල විතක්ක පැමිණ තමන්ගේ චිත්ත ඒකාග්‍රතාවය හෙවත් සමාධිය කැඩී බිඳී යාමයි. අධි චිත්තයෙන් හෙවත් අෂ්ට සමාපත්තීන්ගෙන් යුත් අයට පමණක් මෙම සූත්‍රය දේශනා කර ඇත්තේ සාමාන්‍ය ජීවිතයේ සිටින අය අකුසලයන් බව නොදන්නා නිසා අකුසල සිදුවන බවයි.

අකුසලයන් අකුසලයන් බව දැනගැනීමට සිතේ ඒකාග්‍රතාවයක් හෙවත් සමාධියක් අවශ්‍යය. මඩවලක සිටින අයෙකුට මඩ ගෑවුනාට නොදැනෙන්නා සේ සාමාන්‍ය සිතක අකුසලයන් ම ඇති බැවින් ඒවා තේරුම් ගැනීමට නොහැක. කෙසේ වෙතත් අකුසලයන්ගෙන් සිත මුදවාගෙන සිත පිරිසිදු කරගැනිමට ක්‍රම පහක් මෙහි දේශනා කර ඇත.

**අඤ්ඤ නිමිත්ත පබ්බං - අකුසල් අරමුණට එරෙහිව වෙනත් කුසල් අරමුණක සිත පිහිටවීම.**

යම් අවස්ථාවක දී රාග, දෝස හෝ මෝහ සිතක් උපන් විට ඊට එරෙහිව වෙනත් කුසල් අරමුණක් මෙනෙහි කිරීම කළ යුතුය. හරියට ලෑල්ලකට ගසා ඇති විශාල ඇණයකට හාත්පසින්ම ඊට වඩා කුඩා ඇණයකින් පහර දී පසුව අතින් ගලවා දමන්නාක් සේ විශාල වූ අකුසල් අරමුණ කුඩා කුසල් අරමුණක් මෙනෙහි කර සිතෙන් ඉවත් කළ යුතුය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**ආදීනව පසබං - අකුසල් අරමුණේ ආදීනව මෙනෙහි කිරීම.**

ඒ ඒ අකුසල විතක්කයන්ගේ දෝෂය පිරික්සමින් එනම් එහි ආදීනව දකිමින් එම අකුසලය ඉවත් කළ යුතුය. මෙම අරමුණු අකුසල් අරමුණුය, සාවද්‍යය, දුක් විපාක ඇත, යනාදී වශයෙන් සිහිපත් කරමින් ඉවත් කළ යුතුය.

කණ්නාඩිය ලඟට ගොස් සැරසෙන තරුණයෙකුගේ හෝ තරුණියෙකුගේ කර මත බලුකුණක් හෝ සර්ප කුණක් හෝ මිනිස් කුණක් දැමුවොත් එය පිළිකුල් කර ඉවත් කරන්නේ යම්සේද, ඒ ආකාරයෙන් අකුසල් අරමුණ ලැජ්ජා සහිතව පිළිකුල් සහිතව ඉවත් කළ යුතුය.

යම් රාග (ලෝභ), ද්වේෂ, මෝහ අරමුණක් සිතේ ඇති වූ විට මෙය නැවත නැවත මෙනෙහි කිරීමෙන් එය වචන බවට පෙරලෙන බවත් පසුව එම අරමුණු කායිකව සිදුකරමින් බොහෝ අකුසල් රැස් කරගන්නා බව නුවණින් මෙනෙහි කළ යුතුය.

මෙලොව වශයෙන් අලාභ, නින්දා, කායික දුක්, මානසික පීඩා, රජයේ වධ බන්ධන වලට ලක්වීමත් ආධ්‍යාත්මික වශයෙන් තමන්ගේ සීලය පිරිහීම, සමාධිය පිරිහීම, ප්‍රඥාව පිරිහීම තුළින් නිර්වාණය දුරස්වීම යනාදියත්, පරලොව වශයෙන් සතර අපාය ආදී දුක් වලට පැමිණෙන බවත්, නුවණින් මෙනෙහි කරමින් අකුසලය සිතෙන් ඉවත් කළ යුතුය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**අසති පසබං - අකුසල් අරමුණ මෙනෙහි නොකිරීම**

අකුසල අරමුණක් සිතට පැමිණි අවස්ථාවක දී එය මෙනෙහි නොකිරීමෙන් එම අරමුණ ඉවත් කළ යුතුය. රූප දැකීමට අකැමැති ඇස් ඇති පුරුෂයෙක් රූපයක් දුටුවිට ඇස් පියා ගන්නා සේ හෝ වෙනත් යමක් දෙස බලන්නා සේ සිතට පැමිණි රාග, ද්වේෂ, මෝහ , අරමුණු සිහි නොකිරීමෙන් ඉවත් තළ යුතුය.

තමන්ගේ සිතට අකුසල අරමුණක් පැමිණි විට ඒ සමඟම ඊට එරෙහිව "මෙය සිතන්න එපා" යනාදී විධානය නැවත නැවත සිතට ඒත්තු ගැන්වීමෙන් එම අකුසල් අරමුණ මෙනෙහි නොකර ඉවත් කළ හැකිය. මෙසේ දිගින් දිගටම පුහුණු කිරීමෙන් එම අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**විතක්ක මූලභේද පසබං - අකුසලයේ මූලය සිහි කිරීම**

පැමිණි රාග, දෝස, මෝහ විතක්කයේ මූලය සොයා එම මූල ඉවත් කිරීමෙන් අකුසලය ඉවත් කළ යුතුය. යම් අයෙක් වේගයෙන් දුවන විට ඔහු "ඇයි මේ දුවන්නේ ? මෙතන දුවන්න තරම් කරුණක්නැනේ" යන බව අවබෝධ වූ විට ඔහු දුවන ක්‍රියාව නවතා ඇවිදින්නට පටන්ගනී.

එසේ ඇවිදින විටත් "ඇයි මේ ඇවිදින්නේ ? මෙතන ඇවිදින්න තරම් කරුණක් නෑනේ" මේ බව ඔහුට අවබෝධ වූ විට ඔහු සිටින්නට සිතයි. සිටගෙන සිටින විට, එසේ ඉන්න අවශ්‍ය නැති බව තේරුම් ගත්විට ඉඳගන්න කටයුතු කරයි.

ඔහු ඉඳගෙන සිටින විට "ඇයි මේ ඉඳගෙන ඉන්නේ ? මෙතන ඉඳගන්න කාරණයක් නෑනේ" යන බව අවබෝධ වූ විට ඔහු ඇලවෙයි. මේ ආකාරයෙන් අකුසල මූලය හොඳින් පිරික්සමින් කටයුතු කරයි නම්, එම අකුසලයේ බලය ක්‍රම ක්‍රමයෙන් අඩුවී අකුසලය ඉවත් වේ.

තමන් වාහනයක් මිලදී ගැනීමට ලෝභ සහගත ලෙස වංචාවෙන්, කපටිකමින් මුදල් ඉපයීම් කිරීම සම්බන්ධයෙන් අකුසල් සිත් පරම්පරාවක් පැමිණුන විට එම විතක්කය පැමිණෙනුයේ වෙනත් අය පාවිච්චි කරන වාහන දෙස බලා තමන්ටත් මෙවැනි එකක් තිබුණා නම් හොඳයි යන මූලික අරමුණ පැමිණුන නිසා බව අවබෝධ කරගෙන ඇත්තටම අවශ්‍යතාවය කුමක්ද? යන්න ක්‍රමයෙන් විශ්ලේෂණය කර එම අකුසල් අරමුණ ඉවත් කළ හැකිය.

ගසක අතු ඉවත් කර, කඳ ඉවත් කර, මුදුන් මුල ඇතුලුව සියලුම මුල් ඉවත් කර එම ගස නැවත හට නොගන්නට කටයුතු කරන්නේ යම් ආකාරයකට ද, ඒ ලෙසම අකුසල් විතක්කය ඉවත් කළ යුතු වේ. එසේ කිරිමෙන් තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

**අභිනිග්ගණ්හත පසබං - ප්‍රබල කුසල් අරමුණකින් අකුසල් අරමුණ තලා පෙලා දැමීම.**

යම් ලෝභ, දෝස, මෝහ අකුසල් අරමුණක් සිතට පැමිණි විට එය දැඩි කුසල් අරමුණක් ගෙන තලා පෙලා දමා එම අකුසල් අරමුණ පහ කළ යුතුය. ශක්තිමත් පුරුෂයෙක් තම ශක්තිය යොදාගෙන හීන පුරුෂයෙක් මෙල්ල කරන්නේ යම් සේද, ඒ ආකාරයෙන් අකුසල් අරමුණ තලා පෙලා ඉවත් කළ යුතුය.

රාග සිත් පැමිණි විට අසුභය ද, ද්වේශය පැමිණි විට මෛත්‍රිය ද, ථීන මිද්ධය පැමිණි විට ආලෝකය සහ වීර්යය ද, යනාදී වශයෙන් භාවනා කිරීමෙන් අකුසල් සිත් ඉවත් කළ හැකිය. තවද සතිපට්ඨානය තුළ ඇති මෙවැනි විදර්ශනා භාවනා කමටහන් යොදාගනිමින් අකුසල් සිත් තලා පෙලා දැමූ බවත් ප්‍රකාශ කළ හැකිය. එවිට අකුසල් අරමුණ ඉවත් වී තමන්ගේ සිත ඇතුළත පිහිටයි. මනාව තැන්පත් වේ. නැවත එකඟ වේ. නැවත සමාධිගත වේ.

අධි චිත්තයෙන් යුත් අයෙක් මෙම ආකාර පහෙන් අකුසලයෙන් සිත පිරිසිදු කරගෙන එය වශීභාවයට පත් කරගන්නේ නම් ඔහුට කැමති නම් එම අරමුණ සිතීමටත් අකමැති නම් අරමුණ නොසිතා සිටීමටත් හැකියාව ඇතිවේ. එසේ කරන විට ඔහුගේ තණ්හාව පහ වේ. සංයෝජන ඉවත් වේ.

එබැවින් මානය දුරුකොට සංසාර දුක කෙලවර කරගෙන නිවනින් සැනසේ. එසේ අකුසලයන් ඉවත් කරමින් සංසාර දුක නැති කිරීමට සියල්ලන්ටම ශක්තිය ලැබේවා.

පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි


බෙසේ.. භද්‍රාවෝ සත්තුක සමඟ ආදරයෙන් වෙළී පෙම්බස් දොඩමින්... සිටින්නී.
නොබෝ දිනකින් සිටුතුමා හා සිටු දේවිය පොරොන්දු වූ පරිදි භද්‍රා කුමරියට.... සත්තුකව ..කරකාර බන්දු දුන්නේය..
ථෙරී ගාථා ඇසුරෙන්
භද්‍රා කුණ්ඩලකේශී
13
සැකසුම හා
චිත්‍ර.. පාලිත සපුආරච්චි
පැසුව...
ා සත්තුක.. මගේ පැතුම ඉටුවුණා.. දැන් මගේ බලාපොරොත්තුව දිවි ඇති තෙක් ඔබ හා විසීමයි...
හාහ්.. දිවි ඇති තෙක් වසන්ට.. ඒ නුඹ සිතා සිටින හැටි... භද්‍රා.
ඒ ඇයි සත්තුක කොනවද ඔබ බය තරම් කල්පනා කරන්නෙ... දැන් ඔබට කිසිම බියක් වන්ට දෙයක් නැද.. ඔබට.. කොනව හරි දෙයක් වුණොත් මගේ මගේ පියා ඇති තරම් ධනය වියදම් කරයි ඔබ වෙනුවෙන්..
හා... ඒ බව.. දන්නවා භද්‍රා... ඒකනේ.. මම බය නැතුව ඉන්නේ...
භද්‍රා..
සත්තුක..
ඈහා.. මාගේ රන් ආභරණ.. දම්.. රතුං.. මේ සියල්ලම ඇයින් මටයි...
මට හැකි වෝ සිටු මැදුරේ හිරකරුවෙකු වගේ ජීවත් වෙන්ට.. මාගේ සියලු ආභරණත් වස්තුවත් රැගෙන මෙහෙන් පලායන්න මිනි..... නව ටික දවසක් ඉවසමු....
ඔන්න.. ඔන්න ඔබ.. ආයෙත් කල්පනා.. කරන්ට.. පටං ගත්තා.
..ඇයි... සත්තුක.. ඔබට මගෙන් වරදක් වීද..?
නැහැ.. භද්‍රා.. මම කල්පනා කළේ එහෙම දෙයක් නොවේ මගේ හිස ගසා දැමුවානම් මම.. මේ වනවිටත් මිය ගිහින්.. හාහ්..
සත්තුක අපි ඒ සියල්ල අමතක කර.. සතුටෙන් සිටිමු..... එන්න..

සුරස අතිරේකය

සුභාවිත ගීයක රස මිහිර



# නොමිනිස්කම් උණු කරලද මන්දා කාසි හදන්නේ මේ කාලේ

**කටු මැටි බැන්දේ පිදුරු වැහැව්වේ**
**හේන් කුඹුරු සරි කර ගන්නේ**
**අත්තමටයි නෑ හිතවත් කමටයි**
**කුලියට මලියට නෙවෙයි ගමේ**
**ඉස්සර නම් අපි අපේ ගමේ**

**ගන්ධාරේ අව කාලෙට හැඬුවොත්**
**පන්සල් මිදුලේ වැලි වැහුණා**
**දුක සැප අවනඩු සමව බෙදා දී**
**ලොකු හාමුදුරුවො බණ කීවා**

**අත්තම් නෑකම් හිතවත් කම් නැති**
**කරන තරම් විස ඇති කාලේ**
**නොමිනිස් කම් උණු කරලද මන්දා**
**කාසි හදන්නේ මේ කාලේ**

*රචනය - ඩැනියල් හේවගේ*
*තනුව හා සංගීතය - කේ. ඩී. ගුණවර්ධන*
*ගායනය - කුමුදුනී ගුණවර්ධන*

අද්‍යතන වාණිජ ප්‍රවණතාව නිසා වියැකී යමින් පවත්නා සාම්ප්‍රදායික ගැමි ජීවන රටාව හා ඒ තුළ වූ සාර ධර්ම පිළිබඳව සහෘද සිත් තුළ සංවේදි ආවර්ජනාත්මක වින්දනයක් ජනනය කිරීමට ඩැනියල් හේවගේ සහෘදයාණන් සමත්ය.

සාම්ප්‍රදායික ගැමි සමාජය තුළ පැවැති අන්‍යෝන්‍ය උපකාරී ජීවන රටාව වත්මන් වාණිජ ප්‍රවණතාව හරහා සිඳී බිඳී වියැකී ගොස් ඇති ආකාරය මැනැවින් දැක ගත හැකිය.

කෘෂිකර්මය ප්‍රධාන ජීවනෝපාය කරගත් අපේ ග්‍රාමීය ජීවන රටාව දැඩි සුහඳ බැම්මකින් එකිනෙකා බැඳුණු සරළ, සුන්දර තෘප්තිමත් හා සුරක්ෂිත වූවකි. කලකට පෙර අපේ ගම්මාන වල හේන් කුඹුරු වල ගොවිතැන් කටයුතු සාර්ථක ලෙස සිදු කරනු ලැබුවේ එකිනෙකාට උදව් උපකාර කර ගන්නා අත්තම් ක්‍රමයට මිස වැටුප් ගෙවීමෙන් නොවේ. එපමණක් නොව වහළ සෙවිලි කිරීම ආදී ගේ දොර අලුත් වැඩියා කටයුතු, ලෙඩට දුකට මරණයට මඟුලට සහභාගී වීම ආදියට ද 'අත්තම' පදනම් විය. ගැමියකු තවත් ගැමියෙකු ගේ වැඩකට උපකාරී වූයේ හුදෙක් ප්‍රතිඋපකාරය අපේක්ෂාවෙන්ම නොවේ. එහෙත් එසේ උදව් උපකාර ලද පුද්ගලයා අනෙකාට උපකාරී වීම නිසර්ගයෙන්ම සිදු විය. මෙහිලා මූලික වූයේ නෑකම, හිතවත් කම මිස මුදල නොවේ. මෙම ජීවන රටාව තුළ හැම ගැමියෙකුගේම දිවි පැවැත්මට යහපත්, සංවරශීලී පහසු හා සුරක්ෂිත වූවකි.

ගමේ ප්‍රධාන පොදු මධ්‍යස්ථානය වූයේ පන්සලය. දායක සභාව, කුලඟන සමිතිය, ග්‍රාම සංවර්ධන සමිතිය ආදී විවිධ ස්වේච්ඡා සංවිධාන වල රැස්වීම් ශාලාව වූයේ පන්සලේ බණ මඩුවය. ඉරිදා දහම් පාසලට සෙවන දුන්නේ බණ මඩුවය. ආලවක දමනය, සූවිසි විවරණය, පන්සාලිස් වස් විවරණය, මනමේ, සඳකිඳුරු ආදී ආගමික නෘත්‍ය නාටක වල රංග භූමිය වූයේ බණ මඩුවයි. ලොකු හාමුදුරුවන්ගේ ප්‍රධානත්වයෙන් හා ගමේ ප්‍රභූවරුන්ගේ සහභාගිත්වයෙන් ගැමියන් අතර හටගත් ආරවුල් විසඳා ගත්තේ ගමේ උසාවිය මගිනි. ආගමික වත් පිළිවෙත් මෙන්ම ගමේ පොදු වැඩකටයුතු වල ද කැඳවීම් සංඥාව වූයේ පන්සලේ උස් කුලුණක එල්ලන ලදුව දම් වැලකින් හෝ ලණුපටකින් අදිනු ලැබ හැඬවුණ ඝණ්ඨාවේ නාදයයි.

අනපේක්ෂිත අවස්ථාවක පන්සලේ ඝණ්ඨාව නාද වුවහොත් ගමේ සියලු දෙනා පන්සල් බිමට එක් රැස් වූයේ කිසියම් විශේෂ සිදු වීමක් හෝ අවස්ථාවක් පිළිබඳ කුතුහලයෙනි.

ලොකු හාමුදුරුවන්ගේ අනුශාසනා හුදෙක් ගැමියා නිර්වාණ මාර්ගයට යොමු කිරීමට පමණක් සීමා නොවීය. ගැමියන්ගේ පෞද්ගලික ලෞකික අභිවෘද්ධියට අදාළ මඟපෙන්වීමද උන් වහන්සේගේ අනුශාසනාවන් මගින් සිදු විය.

මෙවන් සාමකාමී, සරළ හා සුවබර ගැමි ජීවන රටාවක් වෙනස් වූයේ කෙසේද. එවන් විපර්යාසයකට හේතුපාදක වූ මූලික සාධකය කුමක්ද. ගීතයේ දෙවන අන්තරා කොටසින් එම සාධකය පැහැදිලි කෙරෙයි.

මුදල් පරිහරණය සියලු කරුණු වලට මූලික වූ වාණිජ ආර්ථික රටාවෙහි ආක්‍රමණය අත්තම් ක්‍රමය හා එයට පාදක වූ නෑකම හිතවත්කම පදනම් කොට ගොඩ නැගුණ සරළ හා අල්පේච්ඡ සමාජ ක්‍රමය ගමෙන් පිට මං කිරීමට තරම් බලවත් විය. ගීත රචිකයා මේ දෙස බලන්නේ කාංසාවකිනි, අසහනයකිනි, සංවේගයකිනි. පැරණි සරළ සුන්දර අන්‍යෝන්‍ය උපකාරී ගැමි ජීවන රටාව හා රිද්මය වනසාලු මුදල් විසමුසු බලයක් ලෙස ඔහු දකියි. මිනිස්කම වෙනුවට නොමිනිස්කම මිශ්‍ර කොට උණුකොට කාසි නිර්මාණය කොට ඇති බවක් ඔහුට හැගේ. 'නොමිනිස්කම් උණු කරලද මන්දා කාසි හදන්නේ මේ කාලේ' යැයි රචිකයා පෙන්වා දෙන්නේ මෙයයි. අද්‍යතන සමාජ ආර්ථික රටාව පිළිබඳව රචකයා තුළ ඇති වන කම්පනය සියුම් ලෙස ගීතය පුරා ප්‍රතිරාව කෙරෙයි.

කේ. ඒ. ගුණවර්ධනයන්ගේ සංගීතය ද මෙයට මනාව ගැලපෙයි. රචනයේ යථාර්ථයම සහෘද සිත් තුළ තැන්පත් කිරීමට කුමුදිනි ගුණවර්ධනගේ ගායන කෞෂල්‍යයට හැකි වී තිබේ.

**චාමිකා ජනානි ද සිල්වා**

# භාරතයෙන් පෝෂණය වූ ජනවහර



හිරු නගින විට බැස යන සඳ හිරු බසින විට යළි නැග එයි. ඒ මේ ලොව යථා ස්වභාවය ලොවට කියාපාන්නට මෙනි. දින, සති, මාස, අවුරුදු ගෙවෙමින් කාලය ගෙවී යද්දී හිරු සඳු එලෙසින්ම තම දෛනික රාජකාරිය ඉටු කරයි. එසේ ගෙවී යන කාලයේ තවත් එක් වසරක් උදාවී මාසයක් ම ගතවී ගොස් හමාරය. මා මේ ලියන්නේ එවන් ගතවි යන කාලයේ එක් හෝරාවකය.

කාලය කෙසේ කොයි ලෙසින් ගෙවී ගියත් අප සැම කෙනෙකුටම ගෙවී ගිය අතීතයේ යම් යම් සොඳුරු මතකයන් නොනැසි පවතී. සැම රටකටම, ජාතියකටම උරුම වූ සාහිත්‍යාංගයන් ඒ අතර සුවිශේෂී තැනක් ගනී. අප රටේද එසේ ඉතිරි වූ සාහිත්‍යයක් ඇත. ඒ අතර ජන කවි, ජන කතා ද විශාල ප්‍රමාණයක් පවතින අතර වත්මන් සමාජයටද සුවිශේෂී පාඩම් රැසක් ඉන් ඉගෙනීමට ඇත්තේය. නමුත් මා මේ කථා කිරීමට යන්නේ අපේ ජන කවි හෝ ජන කතා ගැන නොවේ. අපේ අසල්වැසි රටක් වන ඉන්දියාවේ සාහිත්‍යාංගයක් පිළිබඳවයි. එය මා උපුටා ගනු ලබන්නේ ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ඉන්දීය ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය "බී.ඒ, පී.එච්.ඩී, එෆ්,ආර්.ඒ, ඒ.ස් උපාධිධාරි "ඒ.එල්.බෂාම්" මහතා විසින් ලියන ලද "The Wonder That was Ondia" නම් කෘතියේ සිංහල පරිවර්තනය වන "අසිරිමත් ඉන්දියාව" නම් කෘතියෙනි. බෂාම් මහතා මෙය ලියා ඇත්තේ මුසල්මානයන් ගේ ආගමනයට පෙර ඉන්දීය අර්ධද්වීපයේ පැවති සංස්කෘතිය පිළිබඳ සමීක්ෂණයක් ඇසුරිනි. එම ග්‍රන්ථයේ භාෂාව සහ සාහිත්‍යය පිළිබඳව හඳුන්වා ඇති කොටසින් උපුටා ගන්නා ලද්දකි මේ. ඒවා ද අප රටේ මෙන්ම ගැමි ජනයාගේ දුක, ශෝකය, කඳුල, සුසුම, සතුට, භීතිය, ත්‍රාසය, සොම්නස, දොම්නස කැටි කර ගත් ඒවා විය හැකි යයි එය කියවා අවසන මා හට සිතේ. මා මෙම ලිපියේ මාතෘකාව ලෙසින් උපුටා ගන්නේද එම ජන කවිවල එක්තරා කවියෙකු ලියූ කවියක කොටසකි.

"අප මෙතෙක් කථා කළ සාහිත්‍ය දීර්ඝ සම්ප්‍රදායන් ඇති සාහිත්‍යාසනහ මගින් කරන ඒවායි. සමහර කවි සම්මාන සංස්කෘත සාහිත්‍ය තරම් ක්‍රමානුකූල නැති බව පෙනේ. තැනින් තැන, විශේෂයෙන්ම දෙමළ සාහිත්‍යාවලින්හි හා ප්‍රකෘත ''සප්තශතකයේ" අපට මුඛපරම්පරාගත ජනකවිවල ස්වභාවයක් යම්තමින් දක්නට ලැබේ. අප දන්නා තරමින් කිසිම ඉන්දීය ලේඛකයෙකු පැරණි ඉන්දියාවේ ජන කවි එක් රැස්කර නැත. නූතන කවි හා සමාන කර බලන කල වැදගත් ජනකවි රාශියක් තිබෙන්නට ඇතැයි සිතිය හැකිය. එහෙත් කවි කිහිපයක් චීන පරිවර්තන වලින් සුරක්ෂිත වී ඇත. මේවා ප්‍රාග් ගුප්ත යුගයේ නියම ජනකවි වල කියුම් යයි සිතිය හැක. සංයුක්ත නිකාය නම් බෞද්ධ පිටක ග්‍රන්ථය ක්‍රි.ව 440 පමණ දී චීන බසට පෙරළිණ. එසේ පෙරළෙන ලද්දේ ක්‍රි.ව 411 දී පාහින් විසින් ලංකාවේදී,

"ඇතැම් විට පශ්චාත් ද්‍රවිඩ සාහිත්‍යයේ වැදගත්ම පුරුෂයා වීරමාමුණිවර් (1680-1747)ය. ඒ වූ කර දෙමළ රටේ 36 වසක් ඉගැන්වූ ඉතාලි ජේසුයිට් වරයෙකු වූ කොන්ටන්සියෝ බෙස්කි පියතුමාගේ අපලි නාමයයි. පැරණි ක්‍රිස්තියානි මිෂනාරීවරුන් බොහෝ දෙනෙක් මෙන් ඔහු සපුරාම ඉන්දීය ක්‍රමයට ජීවත් විය. ඔහු දෙමළ බස මැනවින් උගත්තේය. සාහිත්‍යය රීති ද උගත්තේය. ඉන් පෙර හෝ පසුව කිසිම යුරෝපියයකු එතරම් හොඳින් ඉන්දීය බසක් උගත්හයි සිතිය නොහේ. බෙස්කිගේ "තෙම්බාවනිය" පැරණි හා අලුත් තෙස්තමේන්තුවල කතා සාටෝප අලංකාර දෙමළෙන් කියන්නකි. ඔහුගේ රීතියත් වස්තු විකාශනයත් සම්ප්‍රදායානුරූපය. එහෙත් ඔහුගේ කෘතිවල මැසෝගේ ආභාෂය පෙනේ. මේ කොටසට කරුණුත් චීන කවිවල පරිවර්තනයත් ආචාර්ය ආතර් වැලිගෙන් ලැබිණ. පළමුවරට ඒවා මෙහි පළකිරීමට අවසර දිම ගැන අපි ඔහුට ඉතා ණය ගැත්තෙමු."

ලබා ගන්නා ලද පිටපතක් බලාගෙනය. මේ පොතේ අග පාලි පොතේ නැති කොටසක් තිබේ. එය පාහියන්ගේ අත් පිටපතේ තිබෙන්නට ඇත. මෙහි තිබෙන කවි ක්‍රි.පූ 1 වන සියවසේදී පාලි පිටක එක් රැස් කරන ලද කාලයත් ක්‍රි.ව 5 වන සියවසත් අතර සමයේදී දඹදිව ගයන ලද ඒවා විය හැකිය.

අප දක්වන ඡේදය නොයෙක් ලෞකික ගීත අසා ඒවා මදක් වෙනස් කොට බෞද්ධ පරමාර්ථයට අනුව හැඩ ගැස්වූ භික්ෂුවක් ගැන විස්තර කරයි. එබැවින් මෙහි පළමුවෙන්ම දක්වනු ලබන කවියට කලින් එන්නේ කරදරයක් නැතිව නිවහනට යන්නට සිතා භික්ෂුව විසින් ගයන ලද්දකි. අනෙක් ඒවාද මෙබඳුම වෙයි.

සැමියාගේ පවුල සමග ආරවුල් කරගත් ස්ත්‍රියගේ ගීතය

ගංගා නදිය
මට දැන් අවැසි වනුයේ
ඔබගේ ගලන දිය හා බැඳී
මෘදු සේ මුහුදට පාවන්නටය.
මගේ මාමණ්ඩිය හෝ නැන්දම්මා විසින්
නිතරම කළහ කරනු ලැබීම
වළක්වා ගනු සඳහාය"

පුහුල් හොරාගේ ගීතය

කාන්තිමත් චන්ද්‍රයාණෙනි,
පිටතට නො එන්නැ'යි යදිමි
ඉන්නා තැන ඉන්න
මා මේ පුහුල් කපන තුරු
මා මගේ පුහුල් හසු නොවී ගන ගියාට පසු
ඕනෑ නම් පිටතට එන්න
ඕනෑ නම් ඔහේ ඉන්න.

දුප්පතාගේ ගීතය

මට එක උෟරෙකු ඉන්න තුරු
හොඳ මදිරා එක බඳුනක් තිබෙන තුරු
මදිරා වත් කරන්නට එක බඳුනක් තිබෙන තුරු
නැවත නැවතත් බඳුන පුරවන්නට කෙනෙකු ඉන්නා තුරු
මට මේ ටික තිබෙන තුරු
මට කිසිවකින් කරදරයක් නැත

වර්ෂාව ඇති රැයෙක සිය පෙම්වතා හා නියම කරගත් පරිදි යද්දී පය ලිස්සා මඩේ වැටුණු කෙල්ලකගේ ගීතය

මා හිසකේ ලිහලා අවුල් විය......
මගේ ලස්සන මාලය ගැඹුරු මඩේ වැටිණ
මගේ මුදු හා වළලු කැඩී අවලස්සන විය
මා ප්‍රියයා වෙතට ආ විට ඔහුට අදින්නට දෙන්නේ කුමක්ද?

සිය අනියම් බිරිඳ සමග විනෝද ගමනක් ගිය ප්‍රියයකුගේ ගීතය

අපේ පහසුව හා විනෝදය ට පෙම් සිතුවිලි බරට
අපි නිල් තුරු සෙවණේ රැදෙමු
ගලන නදිය වේගයන් පිවිතුරුව ගලයි
මගේ වීණාවේ හඬ ගීතවත්ය, මිහිරිය
අපේ සැපයට වැඩි සැපයක් කොතැනක නම් ඇත්ද?

කොබෙස්සතුට අවවාද

කොබෙය්ය, ආහාර රැස් කර ගන්න
තල, වී මෙනේරි ආදිය එක් රැස් කර
කඳු මුදුනේ ගසකට ගෙන යන්න
ඉතා උසින් ඔබේ කූඩු ගුහාව තනා ගන්න
එවිට අහසින් දිය වැටෙන කාලයෙහිදී
ඔබට වාසස්ථාන, ආහාර පාන නො වරදවා ලැබේවි"

මෙයට අනුව බලන කල අපට පෙනී යන්නේ සිංහල ජන කවිය හා සමානවම ගැමි සරල සුගම බස් වහරකින් ඉන්දීය ජන කවියද සැදෑ ඇති බවකි. ගැමි ජනයාගේ කඳුලේත් සිනහවේත් අපූර්ව සංකලනයක් මෙයින්ද පෙන්නුම් කරන බව මා හැඟි සිතිවිල්ලකි.

ඒ.එල්. බෂාම්ගේ "අසිරිමත් ඉන්දියාව" ඇසුරිනි.

**එස්. දිල්රුක්ෂි අබේකෝන්**

# දේව විශ්වාස හා ඇදහිලි

**☸ දෙවියන් යනු කවුද?**

හිංදු, මුස්ලිම්, ක්‍රිස්තියානි ආගම් අදහන බැතිමතුන්ගේ විශ්වාසය අනුව සමස්ත විශ්වයම ඉර, හඳ, තාරකා, අහස, පොළව, ජලය, ගින්දර ආදිය මෙන්ම පෘථිවි තලයේ ඇති සමස්ත දේවල් සත්ව පූජාව, ඇළ, දොළ, ගංගා පවා මවන ලද උත්තමයා සදාකාලිකව වැජඹෙන දෙවියන් වහන්සේ නමින් හඳුන්වන බවයි. ලෝකය මැවීමෙන් පසු සියලු අවශ්‍යතා ඉටුකර දෙන්නේ එම අදෘශ්‍යමාන දෙවියන් බවයි. දේව දර්මය මත යාඥා කිරීමෙන් නැත්නම් දෙවියන් වහන්සේගෙන් ඉල්ලාසිටි විට උන් වහන්සේගේ අභිමතය පරිදි එය ලැබෙන හෝ නොලැබෙන බවයි.

**☸ දෙවියන් සිටින්නේ කොහිද?**

දෙවිවරු සිටින්නේ දිව්‍ය ලෝක වල. එහෙත් ඒ අයට ඕනම තැනකට ඉතා වේගයෙන් යන්න එන්න පුලුවන්. ඍද්ධි බලයක් තියෙනවා කියලා කියනවා.

**☸ බුදු දහම දෙවිවරු සිටීම ගැන පිළිගනීද?**

විමාන වත්ථුපාලියෙහි දෙවියන් පිළිබඳව සඳහන් යාමය, තුසිතය, නිම්මාන රතිය, පරනිම්මතය, තාවතිංසය, වසවත්තිය යනුවෙන් දිව්‍ය ලෝක හය ගැන සඳහන් වේ. සිද්ධාර්ථ කුමරු මහාමයා බිසවගේ කුස තුළට පැමිණියේ දිව්‍ය ලෝකයේ සිටයි. උන් වහන්සේ මෙලොවට පැමිණ සත් දිනකට පසුව කළුරියව යළි ඉපදුනේ දිව්‍යලෝකයේයි. උන් වහන්සේ එනම් තථාගතයන් වහන්සේ බුදු වීමෙන් පසුව සිය මව සොයා දිව්‍ය ලෝකයට වැඩම කර මෑණියන්ට දහම් දෙසා තිබෙනවා. බුදු රජාණන් වහන්සේ මධ්‍යම රාත්‍රියෙන් පසුව දින පතාම දෙවිවරු සමඟ බණ දහම් ගැටලු සාකච්ඡා කර තිබෙන්නේ ජේතවනාරාමයේ සිටයි.

නන්ද කුමරු උන් වහන්සේ විසින්ම දිව්‍ය ලෝකයට කැඳවාගෙන ගොස් රූමත් දෙවඟනන් පෙන්වා දී තිබෙනවා.

ඇතැම් සූත්‍ර දේශනා කර ඇත්තේ දෙවි වරුන් විසින් අසන ලද ප්‍රශ්න නිසයි. ඒ වගේම මතු බුදු බව ලබන මෛත්‍රී බුදු රදුන් දැනට වාසය කරන්නේ දිව්‍ය ලෝකයේයි. බුදු වරයෙක් ලෝක තුනකට අධිපතිවරයෙක්. මිනිස් ලොවටත්, දෙවි ලොවටත්, බ්‍රහ්ම ලෝකයටත් මූලිකයා බුදු වරුය.

**☸ දෙවි ලොවට යන්නේ කොහොමද?**

දාන, සීල, භාවනා ආදී කුසල කර්ම වල විපාක දීමක් ලෙස දෙවිලොව උපදින්න පුලුවනි. මින්නේරි වැව කරන ලද මහසෙන් රජතුමා මින්නේරි දෙවියන් වූ බව ප්‍රකට කරුණක්. දුටු ගැමුණු රජතුමාත් දිව්‍ය පුත්‍රයකුව උපන් බව එකල සිටි මහ රහතන් වහන්සේ ප්‍රකාශ කර තියෙනවා. සමහර අය දිව්‍ය ලෝක වල ඉපදිලා ඉන්නේ ඉතා පොඩි පහේ පින් කරලා. මිනිස් ලොව වේවා. දෙවි ලොව වේවා බ්‍රහ්ම ලොව වේවා උපදින්න නම් පිං අවශ්‍යයි. 'උට්ඨානේන මඝවා දේවානං සෙට්ඨිකං ගතො' උට්ඨාන වීර්යයෙන් වැඩ කළ මඝනම් මානවකයා දෙවි ලොව ඉපදුන බව සඳහන්ය.

**☸ දෙවි ලොව යෑම සැපක්ද?**

දෙවිලොව ඉපදීම සැපයි. කාම භෝගී ජීවිතයක් ගත කරන්න පුලුවන්. එහි තියෙන සැප සම්පත් කරගත් පුන්‍ය කර්ම මත විඳින්න පුලුවන්. කොයි ලොව ඉපදුනත් විපාක ලැබෙන්නේ තම තමන් විසින් කරගත්තා වූ පුන්‍ය බලය මතයි.

**☸ දෙවිලොව දී ලැබෙන කෑම මොනවාද?**

බුදු ගුණ අලංකාරය ලියපු වීදාගම මෛත්‍රී හාමුදුරුවෝ මෙහෙම කියනවා.

**දෙවියෝ නම් අඹර**
**ගහයෝ ය වූ සුරපුර**
**නොගනිති අන් අහර**
**උදක් අමරස මිසක් මනහර**

අමරස හෙවත් අමෘතය දෙවියන්ගේ ආහාරය බවයි. අමෘතයේ සුවඳ ආග්‍රහණය වූ විට දෙවියන්ගේ කුස ගින්න නැති වෙනවා.

**☸ පළතුරු දෙවියන්ට පිදීම සුදුසු ද?**

අවශ්‍ය නැහැ. ඔය පූජා වට්ටි වල කිසිවක් දෙවියෝ කන්නේ නැහැ. සුවඳවත් ආග්‍රහණය කරන්නේ නෑ. දිවුල් පේර, අන්නාසි වැනි දෙයක් හෝ කෑල්ලකින් දෙවිවරු රවටාගන්න හිතුවට වෙන්නේ නැහැ. ඒ අයට ඔය අපිරිසිදු කෑම සුවඳ අල්ලන්නවත් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒව තියන අයම පූජාව කිය කියා කනවා. දෙවි වරුන්ට කෑම අහේනියක් නෑ.

**☸ දෙවියන්ට මිනිසුන්ගෙන් අවශ්‍ය මොනවාද?**

අපේ මිනිස්සු වැඩියෙන් කරන්නේ අවශ්‍ය දේ නොවෙයි. එය පුරුදු වෙලා. මරණයක් වුනත් උත්සවයක් වුනත් සංවිධානය කළොත් තියෙන්නේ අනවශ්‍ය දේ කරන්නේ අනවශ්‍ය දේ. දෙවියන් කැමති පින් ලබා ගන්න. පින් දුන්නම ඒ පින අනුමෝදන් වුනාම දෙවියන්ගේ ආයුකාලය වැඩි වෙනවා. ආයු කාලය වැඩි වෙනවට කවුරුද අසතුටු. එහෙම පින් දුන්න අයට දෙවියොත් පෙරලා සහය වෙනවා.

දෙවි වරුන්ට මුදල් දුන්නට ඒ අය ඒ මුදල් රැගෙන බඩු ගන්න මාකට් යන්නේ නැහැ. ඒ තේවාව කරන අය නම් ඒ මුදල් රැගෙන සුපිරි ජීවිත ගෙවනවා. බලි බිලි පූජා කිරිම, රුධිරය දෙවියන් වෙතහැලීම, දෙවිවරු ප්‍රතික්ෂේප කරන දේවල්. එවන් ජරා අපිරිසිදු තැන්වලට දෙවියන් එන්නේ නැහැ. පිහිට වෙන්නෙත් නැහැ. දෙවි වරු ඉතා පිවිතුරු අයයි. යාග හෝම වලට සත්ව ජිවිත පුද කිරීම බුදු දහමට මුලුමණින්ම පටහැනි දෙයක්.

**☸ දෙවි වරු කොපමණ සිටී ද?**

සංඛ්‍යා ලේඛනයක් ලෙස මෙපමණයි කිව නොහැකි. නමුත් සතර වරම් දෙවිවරු වැඩ සිටින බව කියවෙනවා. ධූතරාඪ, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ කියලා සතර දෙනෙක් සඳහන්. ලංකාවේ මීට අමතරව ප්‍රාදේශීය විෂ්ණු, කතරගම, දැඩිමුන්ඩ, සිද්ධ සූනියම්, ගම්බාර, සුමන සමන්, සත්පත්තිනි, බද්‍රකාලී වශයෙන් විවිධ හැකියාව ඇති දෙවිවරුන් නම් වශයෙන් සඳහන්. සෑම දෙවියෙක්ම බුදු දහමට ගරු කරන එය ආරක්ෂා කරන අයයි. ඇතැම් විට කෝටියක් දෙවිවරු ගැනත් කියවෙනවා. අඩු වැඩි වීම් පැහැදිලිව කියන්න බැහැ.

**☸ දෙවිවරුන්ට මරණය සිදු නොවේද?**

සිදු වෙනවා. පිං බලය අවසන් වුනාම යලිත් මිනිස් බ්‍රහ්ම සත්ව ප්‍රේත ආදී ඕනෑම ආත්මයක ඉපදෙනවා. හැබැයි ඒ අයගේ මරණය අපේ මරණය මෙන් නොවේ. රූප කාය තබා යන්නේ නැහැ. මළ මිනියක් නැහැ. හරියට කපුරු පෙත්තක් දැල්වුවා වගේ. ඉතිරි වන දෙයක් නැහැ. ඒ නිසා කියන්නේ චුත වෙනවා කියලා.

**☸ දෙවිවරුන්ට ආයුෂ වැඩිද?**

මනුෂ්‍ය ලෝකයේ අවුරුදු සීයක් එහි එක දවසක්. තවත් දිව්‍ය ලෝක වල එය 16 ය ගුණයකින් වැඩි කළාම එන ගණන. දෙවි වරු සෑහෙන කාලයක් ජීවත් වෙනවා.

**☸ දෙවි වරු අතර මතභේද නැද්ද?**

නැත්තෙම නෑ. සුරාසර යුද්ධය ඊට නිදසුනක්. දේවත්ව ලැබූවට ඒ ඒ අයගේ ආශාවන් තුනී වෙලා නැහැ. අනෙක් ලෝක වල තරම් ගැටීම් නැහැ.

**☸ බුදු දහම දේවවාදය පිලිගනී ද?**

බුදු දහම දෙවියන් ප්‍රතික්ෂේප කර නැහැ. එහෙත් ලෝකය මැව්වාය, සත්වයා මැව්වා, ගැහැණිය පිරිමියා මැව්වාය යන අන්තවාදී මැවීම කිසිසේත්ම පිලි ගන්නේ නැහැ. ප්‍රතික්ෂේප කරනවා. දෙවියන් මැව්වේ නම් එම දෙවියන් මැව්වේ කවුද යන්න ඇසිය යුතු ප්‍රශ්නයකි. අනෙක ඒ දෙවියන් සදාකාලිකයි කියන මතය බුදු දහම කිසිසේත් පිළිගන්නේ නැහැ.

**☸ බුදුදහම කුමන මතයක් ලෝකය ඇති වීම පිළිබඳව දරයි ද?**

බුදු දහමේ මතය වන්නේ කිසියම් හේතු ප්‍රත්‍ය සමුදාවලියක් කාලීනව වෙනස් ව එම හේතුව සහ ඵලය මත විශ්වය නිර්මාණය වූ බවයි. එහි නැවතීමක් නැහැ. ඇති වූ දේ වෙනස්ව නැති වෙනවා. යලි ඇති වෙනවා. අහස පොළොව මැව්වා නොවේ. අපෝ, තේජෝ, වායු, පටවි, ආකාශ යන වස්තූන්ගේ කාලීන වෙනස්කම් බලපෑමයි. සත්ව ප්‍රජනනය වන්නේ අණ්ඩජ හෙවත් බිත්තර වලිනි. සංසේධජ විරුද්ධ ලිංග දෙකක සම්මිශ්‍රණයෙන් ජලාබුජ ජලයෙන් ඕප පාතික ඉබේ පහළ වීමෙන් කියලයි විස්තර වන්නේ.

අනෙක උදාහරණයකට ගමු මිනිසාගේ මැවීම මිනිස් රූප කෝටියක් ගත්තොත් කෝටියම අසමානයි. මැව්වානම් ඇයි අසමාන. රූපයෙනුත්, ක්‍රියාවලිනත්, අදහස් වලිනුත් සමාන ද නැහැ. 'ලුජ්ජති පලුජ්ජතිලෝකෝ' ඇති වෙනවා. එය නැති වෙනවා. යලි ඇති වෙනවා. බුදු දහමේ පෙන්වන්නේ මෙහි කෙළවරක් නැති බව. සංසාරයේ දිගු බවයි.

උදාහරණයිකින් පැහැදිලි කරනවනම්,

මහවැලි ගඟ උදාහරණයකට ගමු. සැතපුම් 206ක් දිග මහවැලිය පටන් ගන්නේ සිරිපාද කඳු මුදුනෙන්. පටන් ගන්න කොට පොඩි දියපාරක්. ටිකක් දුරට එනකොට ටිකක් දිය වැඩිවෙලා. ශබ්ද නගිමින් ගලා එනවා. තව පහළට වැඩි ශබ්ද නගමින් වැඩි කරලමින් ගඟ පළල් වෙමින් කඳු හෙල් තැනිතලා පසු කරමින් කොපමණ ජරාව වැටුනත් මඩ වුනත් එය ද සොදාලමින් පිරිසිදු වෙමින් නොයෙක් රටා මවමින් ප්‍රදේශයන් සරුසාර කරමින් ජලය බෙදා හරමින් විනීතව ශාන්තව මුහුදට වැටෙනවා. සූර්ය රශ්මිය හැකි පමණ මේ ජලය උරාගෙන වාතයට එක් කරනවා. වලාකුළු හැදිලා ඒවා විශාල වෙලා අයෙත් ජල බින්දු බවට පෙරළිලා වර්ෂාව නමින් යළිත් මේ ගඟටම එක් වෙනවා. තියෙනව ද නැවතුමක් නැහැ. නැවතුම තමයි නිර්මාණය කියන්නේ.

**☸ බණ පිරිත් ආරම්භයේ දෙවියන්ට ආරාධනා කරන්නේ ඇයි.**

එය පෞරාණික චාරිත්‍රයක්. අදටත් එය පවත්වාගෙන එනු ලබන දෙයක්. දෙවියන් පැමිණියත් නොපැමිණියත් එය ගැටළුවක් නොවේ. දෙවිවරුන්ට පිං කරගන්න පුළුවන් එකම අවස්ථාව තමයි මෙවන් අවස්ථා. දෙවිවරුන්ට පැමිණ දහම් ඇසිමේ සුදුසු වාතාවරණයක් වේ නම් දෙවිවරු එනවා. බුදුරදුන් ධම්ම චක්ක සූත්‍රය දේශනා කරන විට ශබ්ද පූජා පවත්වා තිබෙනවා දෙවිවිරු.

**☸ දෙවියන්ට තේරෙන භාෂාව කුමක්ද?**

අපි දෙවියන්ට ආරාධනා කරන්නේ පාලි භාෂාවෙන් 'සමන්තා චක්ක වාලේසු' කියන ගාථාවෙන්. බුදුරදුන් දහම් දේශනා කර තියෙන්නෙ පාලි භාෂාවෙන්. ඒ නිසා පාලි බස දේව භාෂාව වෙන්න පුළුවන් නැතිනම් පාලි භාෂාව තේරෙනවා වෙන්න පුළුවන්.

නමුත් හිංදු බැතිමතුන් දේවත්වයෙන් අමතන්නෙ ස්තෝත්‍ර වලිං ඕං-නමඃ වශයෙන්. ඒ සංස්කෘත බස.

**☸ දෙවියන් වෙනුවෙන් පොල් ගහන්නේ ඇයි?**

පොල් ගැසීම, මිරිස් ඇඹරීම කරනවා අපේම අයත්. බොහෝ විට එය කරන්නේ තමන්ට උදහසට ලක්කරල දඬුවම් දෙන්න. අදහස නම් පාපකාරි. ඒ වුණාත් මම පෞද්ගලිකව දකින්නේ එය නරක දෙයක් කියා නොවෙයි. ඊර්ෂ්‍යාව, වෛරය, පලිගැනීම ඇත්තා යම් හෙයකින් තම ප්‍රටිවාදියා විනාශ කරන්න ටී 56ක්, කඩුවක්, පිහියක් වෙනයම් ආයුධයක් රැගෙන ඔහුට කෙලින්ම පහරදීමට ගියොත් සිද්ධ වෙන්නේ මහ විනාශයක්. ඒ වෙනුවට මෙය දෙවියන් ලවා කරගන්නා අදහසින් තම කේන්තිය තරමකින් පාලනය කරගන්නට පොල් ගැසීම මිරිස් ඇඹරීම උදව් වෙනවා. ප්‍රටිඵල කොහොම වුණාත් ඔහු පාලනය වෙනවා.

**☸ දෙවියන් මිනිස් ශරීරයට ආරූඪ වෙනවාද?**

දෙවිවරු වැනි පිරිසිදු යහපත් අය කුණුවලින් දහඩිය ගඳින් යුතු මිනිස් සිරුරකට ආරූඪ වෙන්නේ නැහැ. එහෙත් යක්ෂ ප්‍රේත භූත ආත්ම වල අයනම් ආරූඪ වෙලා හරි හෝ වැරදි පේන කියනවා. බලන්න ඒ අය දත් කකා, සත්ව බිලි, නර බිලි ඉල්ලන හැටි. අන්තිමට කිකිල් බිත්තරයකින් රවටා ගන්නවා.

**☸ පැපොල, කම්මුල්ගාය දෙවියන්ගේ රෝගයක්ද?**

කිසිම දිව්‍යලෝකය සිටින දෙවියකුට මෙම රෝග හැදුන කියල කොතනක හෝ සඳහනක් නැත. එහෙත් නැති රෝග කොහොමද මෙලොවට බෝවන්නේ. එවැනි රෝග හැඳුනම ඉතා පිරිසිදුව සිට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ගන්න ඕන.

**☸ දෙවියන්ට දෑත් එක්කොට නොවඳින්නේ ඇයි?**

ද ෑත් එක්කොට පසඟ පිහිටුවා වඳින්නේ තෙරුවන්ට. මීට අමතරව දෙමාපිය ගුරු වැඩිහිටි අයට. ඒ අය හා සම නොවන දෙවියන්ට වඳින්නේ ද ෑත මිටිගුලි කොට එක තැනක තබා ගනිමින්.

**☸ දෙවියන් මිනිසුන්ට වඳිනවාද?**

දෙවිලොවටම අධිපති ශක්‍ර දේවේන්ද්‍රයා සිසිල්වත් ගුණවත් මිනිසුන්ට ආචාර කළ බවට මාතලී දිව්‍ය පුත්‍රයා දැක තිබෙනවා. යහපත් මිනිසුන්ට දෙවියන් ද කැමැතිවන බව 'මනුස්සාන' පියො හොති අමනුස්සානං පියොහොති දේවතා රක්ඛනති' කියල මෙත්තානිසංසයෙහි සඳහන්.

**☸ දෙවියන්ට කළ නොහැකි දේ තිබේද?**

කෙස් රැවුල් පැසී යාම. වයසට යාම, මරණයට පත්වීම, දත් හැලීම මේවා කිසිවක් නවත්තන්න දෙවියන්ට බැහැ. ලෙඩ දුක් නවත්තන්නත් බැහැ. එහෙම පුළුවන් කියනව නම් දෙවියන් වෙනුවෙන් කැපව සිට පුද පඬුරු දී උත්සාහ කර බලන්න.

**☸ දේව භාස්කමින් ලෙඩ රෝග සුව කරන සංවිධාන පවතිනවා නේද?**

දේව මුලධර්මවාදීන් බෞද්ධ ආගම් විරෝධීන් දේශය තුළ එවැනි ව්‍යාපාර පවත්වා ගෙන යනවා. බුදුහාමුදුරුවොත් රෝග වලට ජීවක වෛද ්‍ය වරයා හමුව තියෙනවා. කොහොම වෙතත් ලෙඩ සුව කරනු වෙනුවට ජීවිත දෙකක් මෑතකදී නැතිවුණ බවට මාධ්‍ය තුළින් දැනගත්තා.

කතරගම දෙවියන් එම ස්ථානයෙන් පිටව ගොස් ඇති බව බලංගොඩ ආනන්ද හිමියන් සඳහන් කරනවා.

එය උන්වහන්සේගේ අදහසක්. බුදුදහම තුළ අපට අවශ්‍ය එය නොවෙයි. සංසාරය කෙටි කරගන්නා මාර්ගයේ ගමන් කිරීමයි. දේව පිහිට ඉල්ලනවාට වඩා දිව්‍ය ලොව යෑමට වඩා වැඩියෙන් වටින්නේ නිවන් මඟ යාමයි.

**☸ සමස්ථ ලෝක ජනතාවගේ ඉල්ලීම් දෙවියන්ට ලබා දිය හකිද?**

කිසිසේත්ම බැහැ.

**☸ දෙවියන්ගේ පිහිට ඉල්ලා සිටිය යුතුද?**

ඉල්ලුවාට වරදක් නැහැ. නොඉල්ලුවත් වරදක් නැහැ. කොහොමත් ධාර්මික දිවි පෙවෙතක් ගත කරන්නන්ට දෙවියෝද පිහිට වෙනවා.

**☸ දෙවිවරු අතර හොඳ හා නරක දෙවියොත් සිටීද?**

ඔව්. සම්‍යක් දෘෂ්ඨික දෙවිවරුත් අසම්‍යක් දෘෂ්ඨික දෙවිවරුත් ඉන්නවා. දෙවිවරු ගැන පොත් ලියන උගත්තු දෙවියන් ලෙස සලකන්නේ තමුන්ගෙ හිත කියලත් කියනවා. බුදු දහමෙත් මූලික වන්නේ ඔය කියන හිත නැතිනම් මනස.

ඇතැමුන් හිටි හැටියේම දියුණු වූයේ දේව පිහිටෙන් කියල කියනවා.

වෙන්න පුළුවනි. හැම දෙනකුගේම කාලය එක වගේ නැහැ. අෂ්ඨ ලෝක ධර්ම අනුව වෙනසක් සිදුවෙනවා. කලක් හොඳට ඉන්නවා කලක් පාඩු ලබනවා. විශ්වයේ හැටි එහෙමයි.

**☸ දෙවියන් මැවූ ලොවක ජීවත් වන දෙවියන්ගේම මිනිසුන් හා සත්ත්වයන් ඔවු නොවුන්ම විනාශ කරගන්නේ ඇයි. විෂ වායු බෝම්බ ගිනිකඳු සුනාමි වැනිදේත් දෙවියන්ම මැවීද?**

තථාගත දහම අනුව හේතුව හා ඵලය නිසාත් තෘෂ්ණාව සහ නොදන්නා කම නිසා මේ සියළු විපත් සිද්ධ කරගන්නවා. මේවායින් බේරෙන දර්ශනය දහමේ අඩංගුයි. එය තරමක් ගැඹුරුයි.

(කුප්පියාවත්ත ජයසේකරාරාමවාසී අතිපූජ්‍ය මහාචාර්යය මාවරලේ භද්දිය හිමි)
**සාකච්ඡාකොට සකස් කළේ ටී. එම්. සෝමපාල - රිකිල්ලගස්කඩ**



# ලෞකික ජීවිතය

මිනිසුන් ජීවත් වී සොයන්නේ සැපය. ඔවුන් දුකෙන් තොරව ජීවත් වීමට සෑම උත්සාහයක්ම දරයි. හොඳින් අධ්‍යාපනයක් ලැබ, ධනය උපයාගෙන, දේපල අත්පත් කරගෙන, හොඳ පවුල් ජීවිතයක් ඇතිකරගෙන, කාටවත් අත නොපා, නිදහස්, නිවහල් ජීවිතයක් ගතකිරීම සෑම දෙනාගේ අභිප්‍රායයි. සම්මුති ලෝකය තුළ කිසිවෙකුට මෙහි වරදක් නොපෙනෙයි. සාමාන්‍ය ජීවිතයක ජයග්‍රහණය වන්නේ ද මෙයයි. මෙම අභිමථාර්ථ ඉටුකරගැනීමට ද මහත් වෙහෙසක්, උත්සාහයක්, වීර්යයක් තිබිය යුතුය. උදේ පටන් රෑ වෙනකම්, රෑ පටන් පහන්වනකම් පාඩම් කරමින් රැකියා කරමින්, ගේ දොර වතුපිටිවල වැඩ කරමින්, දඟලන්නේ මෙම සම්මුති ලෝකය ජයගැනීමටය. සාමාන්‍ය ලෝකයේ ජීවත්වන අයෙකුට මෙයින් මිදිය නොහැක. එම නිසා  කෙසේ හෝ සමාජයේ පිළිගත් අරමුණු කරා ගමන් කිරීමට කටයුතු කරයි. එනම් මිනිසුන් වර්තමාන කාලයේ දුක් විඳිමින් අනාගතයේ ඉහළ පිළිගැනීමක් හොඳ සමාජ තත්වයක් සහිතව භෞතිකව පෙනෙන ලෝකය තුළ සැපක් ඇතිකර ගැනීමට උත්සහවන්ත වේ.

ජීවිතයේ සැප ලෙස සොයා යන්නේ ඉෂ්ඨ කාන්තා මනාප රූප, ශබ්ද, ගන්ධ, රස, සහ ස්පර්ශයන් හෙවත් පංචකාමයන්ය. සත්‍ය නොදන්නා කමින් ඇතිවන අවිද්‍යාවත්, තමන්ගේ කැමැත්තෙන් ඇතිවන තෘෂ්ණාවත් නිසා මෙම පංචකාමය ම නැවත නැවත පතමින් සංසාරයේ දුක් විඳිමින් සත්වයා ගමන් කරයි. තමන්ගේ වසඟයේ නොපවතින, විනාශවන, වෙනස්වන, රෙදිකෑලි, ලී කෑලි, ප්ලාස්ටික් කෑලි, ලෝහ කෑලි යනාදී දේවල් වලට යටත් වී ඒවාත් එක්කම හැප්පෙමින්, දඟලමින් කටයුතු කරන ජීවිතය වහල් ජීවිතයකි. '' ඌනෝ ලෝකෝ අතිත්තෝ තණ්හා දාසො - ලෝකය තුළ කටයුතු කරනකෙනා, තෘප්තිමත් නොවී තණ්හාවට දාසකම් කරන බව'' බුදුපියාණන් වහන්සේ දේශනා කර ඇත්තේ මේ නිසාය.

පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහ ධාතුන්ගෙන් සෑදුන ශරීරය නියම ආකාරයෙන් කවා, පොවා, නාවා, සතපවා ඇප උපස්ථාන නොකරන්නේ නම් මහත් දුකට පත්වේ. එබැවින් තමන්ගේ ශරීරයට මැරෙන තුරු වහල්කම් කළ යුතුය.  ඒ වගේම තමන් අත්පත් කරගෙන ඇති සම්පත් වලට වහල්කම් කළ යුතුය. තමන් අත්පත් කරගෙන ඇත්තේ රෙදි කෑලි, ලී කෑලි, ප්ලාස්ටික් කෑලි, ලෝහ කෑලී යනාදී දේවල්ය. කිලිටි වූ රෙදි ටික, අපව සෝදන්න කියයි. එවිට තමුන් වහලෙක් මෙන් ඒවා සෝදයි. දූවිලි සහිත මේසය, ''මාව පිහින්න'' කියයි. එවිට වහලෙක් මෙන් මේසය පිහදමයි. දන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන් පිරිසිදුව ජීවත්වීම වැරදිද? කියලා. එය වැරදි නැත. නමුත් පිරිසිදු කර ඉවරකළ නොහැකි බව අවබෝධ කළ යුතුය. එමෙන්ම සිහින ලෝකයේ ඇති මෝටර් රථය ''මාව ගන්න ඕනෙ නම් අතිකාල වැඩකරපන්'' කියයි. තමුන් අතිකාල වැඩ කරයි. සාදන අලුත් ගෙදර ''ඔහොම හම්බකරලා බෑ, කොමිස් ගහල හරි, අල්ලස් අරන් හරි, හොරකම් කරල හරි මාව හොඳට හදපන් '' කියයි. එවිට එයද කරයි. මේ ලෙසට වහල්කම් වලට පාපකම් ද එකතු වේ.

එමෙන්ම සමාජය විසින් තමුන් වහලෙකු බවට පත්කර ඇත. අනිත් අය විසින් නියම කරන ලද සමාජ තත්වය ඇතිකර ගැනිමට, සමාජය කියන කියන දේ කරයි. රූපවාහිනියක හෝ වෙනත් මාධ්‍ය වල වෙළඳ දැන්වීම්, වැඩසටහන් වලින් මේ මේ දේවල් මේ ලෙසට කන්න, මේ මේ දේවල් මේ ලෙසට බොන්න, මේ ආකාරයට නාන්න, මේ විදියෙ වාහනයකින් යන්න, මේ විදියේ අධ්‍යාපනයක් ලබන්න, මේ විදියට මුදල් උපයන්න, මේ විදියේ රැකියාවක් කරන්න යනාදී ලෙස කියයි. මෙසේ තමන්ට අවශ්‍ය නැති දේවල්, එහෙත් අත්‍යාවශ්‍ය දෙයක් ලෙස ඉස්මතු කරමින් පෙන්වන නිසා, ඊට මුලා වී කරන වහල්භාවය තමුන්ටම නොපෙනේ. මෙහිදී තමන්ගේ අවශ්‍යතාවය මත නැවතී සිට කටයුතු කිරීම මදි පුංචිකමක් ලෙස සිතා, අනිත් අයට වුවමනා විදියට කටයුතු කිරීමේ වහල් ක්‍රියාව මහත් අභිමානයක් ලෙස දකියි.

බුදුපියාණන් වහන්සේ ලෝකයේ මනාප අරමුණකින් සුඛ වේදනාවක් ඇතිවන බවත්, එය හටගත් මොහොතේම දියබුබුලක් මෙන් බිඳී විනාශ වී ඒ තුළින් විපරිනාම දුක්ඛතාව ඇතිවන බවත්, යම් අමනාපික අරමුණකින් දුක්ඛ වේදනාවක් ඇතිවන බවත්, ඒ තුළින් දුක්ඛ දුක්ඛතාවය ඇතිවන බවත් යම් උපේක්ෂා සහගත අරමුණකින් අදුක්ඛම සුඛ වේදනාව ඇතිවන බවත්, ඒ තුළින් සංඛාර දුක්ඛතාවය ඇතිවන බවත්, දේශනා කර ඇත. මෙම බුදුවදන තුන් ලෝකයේ කිසිවෙකුට වෙනස් කළ නොහැක. කළහැකි වන්නේ බුදු වදන පිළිගෙන සත්‍ය අවබෝධ කරගෙන දුකින් අතමිදීම හෝ බුදුවදන නොපිළිගෙන දුක්විඳීමයි.

බෝසතාණන් වහන්සේ රම්‍ය, සුරම්‍ය, සුභ යන මාලිගා පරිහරණයෙන් සහ රජකුමරකු වශයෙන් මහත් සැපයක් විඳින ලදී. සර්වඥයන් වහන්සේ එම සැපය උපමාකර ඇත්තේ තුවාලයක් කසන විට ඇතිවන ඉතා කුඩා වූ සැපයකටය. එමෙන්ම ගිහිකල රජ කුමාරයෙකු වශයෙන් විඳි සැපයට වඩා පළමු ධ්‍යාන සැපය උසස් බව වැඩිදුරටත් දේශනා කර ඇත.

තමුන් මෙලෙස වහල්කම් කරමින් අත්පත් කරගන්නා දේවල් තමන්ට අවශ්‍ය ලෙස පැවැත්විය නොහැක. ඒවා වෙනස් වේ. තමන්ගේ ශරීරයවත් තමන්ට අවශ්‍ය විදිහට පැවැත්විය නොහැක. ඇස දිරයි, කණ දිරයි, මහ රැලි වැටෙයි. නොයෙක් ලෙඩ රෝග වැළදෙයි. අනිකුත් දේවල් ද එලෙසම දිරයි. විනාශ වේ. මෙලෙස වෙනස්වන, විනාශවන දේවල් රැස් කිරීමටත් ඒවා පවත්වාගෙන යාමටත්, පරපණ නැසීම, සොරකම් කිරීම, කාමය වරදවා හැසිරීම, බොරු කීම, පරුෂ වචන කීම, කේලාම් කීම, හිස් වචන කීම, මත්ද්‍රව්‍ය භාවිතා කිරීම, ඊර්ෂ්‍යා කිරීම, වෛර කිරීම, ක්‍රෝධ කිරීම, අනුන්ගේ ගුණ මැකීම යනාදී මහා අකුසලයන් සිදුකරයි.

මෙලෙස තමුන් වහල්කම්, අකුසලකම් කරමින් රැස්කරගත් දේ මහා වටිනා දෙයක්ද? එය විනාශවන දෙයක් නොවේද? කියා සිතිය යුතුය. ඒ නිසා ඇතිවුන අකුසලයන්ට වන විපාක වශයෙන් ආත්ම ලක්ෂ කෝටිගණන් නිරය, ප්‍රේත, තිරිසන්, අසුර යන සතර අපායන් හි දුක් විඳීමට සිදුවේ. ධාතු හතරකින් සෑදුන වෙනස් වන, විනාශවන රූපයන් නිසා, තමන් තමන්ට කරගෙන ඇති හානිය කොතරම්ද? යන්න සිතිය යුතුය. අනිත් අය තමන්ට කරන හානියෙන් සිදුවන්නේ කුඩා හානියකි. නමුත් තමන් තමන්ට කරගන්නා හානිය අති මහත්ය.

භාග්‍යවතුන් වහන්සේ තමන්ට අයිති නැති, තමන්ගේ වසඟයේ පවත්වාගෙන යා නොහැකි දේ අතහරින්න ලෙස දේශනා කර ඇත්තේ මෙම වහල්භාවයෙන් මිදීම සඳහාය. පහසුවෙන් පෝෂණය කළ හැකි සැහැල්ලු සරල ජීවිතයක් ගතකරමින් තමන්ගේ අවශ්‍යතාවය මත පමණක් නතරවන ලෙස උන්වහන්සේ දේශනා කර ඇත. ලෝකයේ සම්පත් සොයන ජීවිතයකට සැමදා අත්වන්නේ දුකමයි. ලෝකය අතහැර දමන ජීවිතයක ඇත්තේ සැපයකි. භික්ෂු ජීවිතයක් යනු ලෝකය අතහරිමින් නිවීම සොයන ජීවිතයකි. භික්ෂුව, ලෝකයේ ඇති සම්පත් වලට නොඇලී, ඒවා අල්ප වශයෙන් පරිහරණය කරමින් ලෝකයෙන් එතෙරට ගමන් කරයි. එය සරල සැහැල්ලු ජීවිතයකි. චීවර, පිණ්ඩපාත, සේනාසන යනාදි පැවැත්මට අත්‍යාවශ්‍ය දේ පමණක් භාවිතා කරමින් නිදහස් නිවහල් ජීවිතයක් ගත කරයි. සාමාන්‍ය ගිහි ජනතාවත් අවශ්‍යතාවය මත පමණක් රැඳෙමින් කටයුතු කරනවා නම්, සම්පූර්ණ නිවහල් ජීවිතයක් නොලැබුනත් යම්තාක් දුරට නිදහස් නිවහල් ජීවිතයක් ගත කළ හැකිය. ඉතා කලාතුරකින් ලැබෙන මනුෂ්‍ය ජීවිතය රෙදි කෑලි, ලී කෑලි, ප්ලාස්ටික් කෑලි, ලෝහ කෑලි වග වහලෙක් නොකර, බුද්ධ සාසනය පවතින කාලයේ ප්‍රයෝනයක් ගත යුතුය. නැවත මෙවැනි අවස්ථාවක් ආත්ම කෝටි ගණනකටවත් ලැබේ දැයි සැක සහිතය. බුදුපියාණන් වහන්සේ මනුෂ්‍ය ජීවිතයක් ලැබීමේ දුර්ලභ බව අවුරුදු සියයකට වරක් පමණක් මුහුද මතුපිටට එන, ඇසක් අන්ධ කැස්බෑවෙක්, විය සිදුරකින් පසලොස්වක සඳ දකිනවා වගෙයි ලෙස උපමාවකින් දේශනා කර ඇත. එබැවින් පංචකාමයන්ගේ සහ අන්‍යයන්ගේ වහලුන් නොවී බුදුපියාණන් වහන්සේ දේශනා කළ මාර්ගයේ ගමන්කොට නිවහල් ජීවිතයක් තුළින් සදහටම නිවී යාමට අධිෂ්ඨාන කර ගනිමු.

**පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි**
**ආර්ය නිකේතනය කන්නිමහර වතුරුගම.**

# විශාඛාවෙනි, බුද්ධ කාලීන විශාඛාවන්ගෙන් ඔබට....

යථාපි පුප්ඵ රාසිම්හා
කයිරා මාලා ගුණේ බහු
ඒවං ජාතේන මච්චෙන
කත්තබ්බං කුසලං බහුං

දක්ෂ මාලාකරුවෙකු මල්මාලාවක් සෑදීම සඳහා බොහෝ වර්ණවත් වූ මල් සමූහයක් ගෙන හොඳ හොඳ මල් තෝරා , වර්ණ ගලපා ප්‍රමාණ ගලපා වටිනා ලෙස මල් දම් සකස් කරයිද එසේම පිං කරනු කැමති , සැප ලබනු කැමති ප්‍රඥාවන්තයාද අකුසල් ඉවත් කොට මහා පුණ්‍ය ඵල ලැබෙන කුසල්ම සිදු කරයි.

මල්දම් සකසන්නා දක්ෂ වුවද අවශ්‍ය මල් නොලද හොත් හොඳ මල් දමක් සැකසීම කළ නොහැනියි. හොඳ මල් තිබූ තරමට මල් කරු දක්ෂ නොවන්නේ නම් වටිනා මල් දමක් සකස් නොවේ. එසේම ශ්‍රද්ධාවත් , ප්‍රඥාවත්, දෙකම ඇති නම් යම් පුද්ගලයෙකුට යහපත් වැඩද , හොඳ හොඳ පිංකම් ද කළ හැකියි. යහපත් වැඩ සහ හොඳ පිංකම් කරන පුද්ගලයාට මෙලොවද පරලොව ද ජය ගත හැකිය.

ඔබ අපි හැම කෙනෙක්ම විවිධාකාරයෙන් ජීවිත ජය ගැනුමට අපේක්ෂා කරමු. එහෙත් අපට ජය ලැබුමට අපේක්ෂා කරමු. එහෙත් අපට ජය ලැබුමට වඩා ලබන්නට වෙන්නේ පරාජයක්මය. ජය ලැබෙනුයේ කලාතුරකිනි. එනිසා අප ජය ලැබූ මට කළයුත්තේ කුමක් දැයි අතීතයෙන් විමසා බලමු.

අප ශාන්තිනායක ලොව්තුරා බුදු අමාමෑණියන් වහන්සේගේ සිව් පිරිස අතර ලෞකික ලෝකෝත්තර වශයෙන් ජය ලැබුවෝ අනන්තය. අග්‍ර ශ්‍රාවක, ශ්‍රාවිකා, මහා ශ්‍රාවක, ශ්‍රාවිකා ආදී වූ සතර මාර්ග සතර ඵල ලැබූ උතුමෝ ලෝකෝත්තර ජය ලැබුවෝය.

සම්බුදු සදහම දිවියට එකතු කර ගනිමින් දන්, සිල්, භාවනාදී දස පුණ්‍ය ක්‍රියා කළෝ මාර්ග ඵල නුවණ ලැබ හෝ නොලැබ දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලැබ ජීවිත ජය ලැබුවෝය. මේ ජය ලැබූවන් අතර ඔබගේ වටිනා ජීවිතයටත් උපදෙස් ලැබිය හැකි ජ්‍යෙෂ්ඨ චරිතයකි විශාඛා මහ උපාසිකාවගේ චරිතය.

විශාඛා මහ උවැසිය බුද්ධාන්තර ගණනාවක් මුළුල්ලේ දානාදී දස පුණ්‍ය ක්‍රියා කළ උත්තමාවියකි. ඈ ගෞතම සම්බුද්ධ ශාසනයේ අග්‍ර දායිකාව වීමේ අධිෂ්ඨානයෙන් පිං කිරීමට ආරම්භ කලේ මෙයින් කල්ප ලක්ෂයකට පෙර බුදු වූ පියුමතුරා සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ සමීපයේදීය. පියුමතුරා බුදු රජාණන් වහන්සේට ශ්‍රේෂ්ඨාකාරයෙන් දන් දුන් උපාසිකාවන්ගේ මිතුරියක වූ මේ කාන්තාව දිනක් තම මිතුරිය සමඟ පියුමතුරා බුදු රජාණන් වහන්සේට දන් පූජා කාරීමට ගිය මොහොතේ සිය මිතුරිය එම බුදු රජාණන් වහන්සේ විසින් සැදැහැ සිතින් දන් පූජා කරන උපාසිකාවන් අතුරෙන් අග්‍ර තානාන්තරයෙහි තබනු දැක මමත් යම් බුදු කෙනෙකුගේ සමයේ ශ්‍රේෂ්ඨ ලෙස දන් පූජා කරන උපාසිකාවන් අතුරෙන් අග තනතුර ලබම්යි සුවිශේෂී පිංකමක් කළාය.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ උපදෙස් ද අනුව බුදුපාමොක් මහ සඟනට සතියකට ආරාධනා කොට සතියක් පුරාවට බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට තුන් සිවුරු සහිතව සියල්ලෙන් සම්පූර්ණ දන් පැන් පූජා කර අවසාන දින තම ප්‍රාර්ථනාව වූ යම් බුදු කෙනෙකුගේ ශාසනයේ "අග්‍ර දායිකාව" වෙම්වා යනුවෙන් ප්‍රාර්ථනා කළේය.

ඉන් ඉක්බිති තුන් කල් දක්නා තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ මෙයින් කල්ප ලක්ෂයකට පසු ලොව්තුරා බුදු වන ගෞතම ශ්‍රී සම්බුද්ධ ශාසනයේ ඔබගේ ප්‍රාර්ථනාව සමෘද්ධිමත් වන්නේ යැයි අනුශාසනා කළ සේක.

මෙදින සිට කල්ප ලක්ෂයක් පුරාවට එතුමිය කළ පිංකම් අප්‍රමාණය.මේ සිදු කළ අප්‍රමාණ කුසල සම්පත්තියෙන් විශාඛා තොමෝ ලද සම්පත් ද අප්‍රමාණය.

ගෞතම ශ්‍රී සම්බුද්ධ ශාසනය පැවති සමයේ අගුරට භද්දිය නුවර මහා ධනේශ්වර වූ ,සිටුවරුන්ට ප්‍රධාන සිටු වූ මද්ධ මහා සිටුතුමාගේ පුත් ධනංජය සිටුතුමාට දාව සුමනා සිටු දේවීන් මව් කොට ඉපදෙන්නට තරම් ඈ කළ පුණ්‍ය කර්මය හේතු සම්පත් ගෙන දුනි.

විශාඛා කුමරිය ලද කුසල පුණ්‍ය සම්භාරය ඉතා කෙටියෙන් ප්‍රකාශ කළහොත්,

1.මහා ධනේශ්වර පවුලක ඉපදීම.

2.මනා රූ සපුවකින් හෙබිවීම.

3.පංච කල්‍යාණියෙන් යුක්ත වීම.

4.මනා නුවණකින් යුක්ත වීම.

5.සත් හැවිරිදි වියේදී ලොව්තුරා දහම අවබෝධ කරගැනීම.

6. ලොව්තුරු දහම වෙත යොමුවීමට කල්‍යාණ මිත්‍ර සත් පුරුෂ සේවනය ලැබීම

7. තමා කල්‍යාණ මිත්‍රයෙක්ව ඇසුරට සපැමිණි සියල්ලන්ව නිවැරදි මගට යොමු කිරීමට හැකියාව ලැබීම.

8.මව් පියන්ට සුවච කීකරු වීමට ප්‍රඥාව ලැබීම.

9. සිතන පතන සියල්ලක් ඒ ඒ අයුරින්ම ලැබීමේ භාග්‍යවන්ත වීම.

10. කීර්තිමත් පුද්ගලයෙක් වීම.

11. ආයුෂ, වර්ණය, සැපය, බලය, ප්‍රඥාව ලැබීම.

12. ඇතුන් පස්දෙනෙකුගේ බර හා ශක්තිය ලැබීම.

13. බරට,ශක්තියට ගැලපෙන ප්‍රඥාවකින් යුක්ත වීම.

මෙහි පළමු කරුණ සම්බන්ධයෙන් ඉහතින් දැක්වූ අතර දෙවන කරුණ සම්බන්ධයෙන් පැහැදිළි කිරීමේදි ඇගේ විවාහය සම්බන්ධව කරුණ ඉතා වැදගත් වේ.

විශාඛා කුමරිය ඉපදෙන කාලය වනවිට මේ පිරිස අගුරට භද්දිය නුවර වාසය කළත් කොසොල් මහරජතුමාගේ විශේෂ ආරාධනයක් නිසා කෝසල රාජ්‍යට අයත් සැවැත් නුවර වාසයට ගියහ.ඔවුහු සැවැත්නුවර වාසය කරන කාලයේ සැවැත්නුවර වාසය කල මහා ධනේශ්වර මිගාර සිටුතුමන් විසින් සිය පුතණුවන් වූ පූර්ණ වර්ධන කුමරුන්ට විවාහ වීමට සුදුසු කුමරියක් සොයමින් සිටියේය.එහෙත් විවාහයට අකමැති වූ එ කුමරුවෝ ස්ත්‍රී හැඩරුව දක්වා එබදු කුමරියක් ලදොත් පමණක් විවාහ වන බව පියතුමාණන්ට දන්වා සිටියේය.කුමරුවන් දැක්වූ ස්ත්‍රී ලක්ෂණ මෙසේ විය.

රන්වන් සිරුරක් වීම, උසට හා මහතට සරිලන ලාබාල පෙනුමක් ඇතිවීම, කේෂ කලාපය මුළුමනින්ම කාලවර්ණයෙන් යුක්ත වීම, එම කේෂ කලාපය දෙපතුල දක්වා දික්ව එයින් නොනැවතී දෙපතුල ලගින් උඩට කැරකී තිබීම, ඡවි වර්ණ වූ සමක් තිබීම, දරු මුණු පුරන් කොතෙක් ලැබුවත් තරුණ බව ආරක්ෂා කරගත හැකි සිරුරක් තිබිම, දෙතොල රත් පැහැ මසින් පිරුණ මාංශ කල්‍යාණියෙන් යුක්තවීම, සිහින් දිගටි දෙනුවන් තිබීම, පුළුල් උකුලක් හා සිහින් ඉගක් තිබීම, සිදුරු රහිත සමව පිහිටි දත් දෙපල සුදෝ සුදුවන්ව මුතු සේ බැබලීම නම් දන්ත කල්‍යාණියෙන් යුක්ත වීම, සන්සුන් බව මෙන්ම මනා නුවණින් යුක්තවීම.

ඉහතින් දැක්වූ සියළු ස්ත්‍රී ලක්ෂණයන්ගෙන් යුක්ත වූ කුමරියක් ලොව කිසිම තැනෙකින් ලැබෙතැයි පූර්ණ වර්ධන කුමරු නොසිතුවේය.එහෙත් බුද්ධාන්තර ගණනාවක් පුරාවට දන්, සිල් භාවනා සපුරමින් සපැමිණි විශාඛා කුමරිය තුළ ඉහතින් දැක්වූ කේෂ කල්‍යාණිය, ඡවි කල්‍යාණිය, මාංශ කල්‍යාණිය, දන්ත කල්‍යාණිය,වයඃ කල්‍යාණිය යන පංච කල්‍යාණිය ඇතුළු සියළු ස්ත්‍රී ලක්‍ෂණයන් සපුරා තිබුණි.

මිගාර සිටුතුමන් විසින්ද මෙබදු කුමාරියක නොලද හොත් එකම පුත් පූර්ණ වර්ධනයන් අවිවාහකව සිටින බැවින්ද, ඒ හේතුවෙන් පරම්පරාව නැසෙන බැවින්ද මහත් ශෝකයට පත්ව දූතයන් කීප දෙනෙකු මෙබදු කුමරියක් ලදොත් මසුරන් ලක්‍ෂයක් වටිනා මේ මුතුහර පළඳවා මගේ යෝජනාව එම කුමරියගේ මව්පියන්ට දන්වා මට ද දැනුම් දෙවැයි යැවීය.

මාස කිහිපයක් පුරාවට මුළු නුවර තැන තැන ඇවිදිමින් සියළු ස්ත්‍රී ලක්‍ෂණයන්ගෙන් හා මහනුවණින් හෙබි කුමරියන් සොයන මේ පිරිසට වර්ෂාවක් හේතුවෙන් එක් ශාලාවකට පිවිසෙන්නට සිදුවිය. මහා වර්ෂාවකට හේතුවෙන් දාහය නිවීයාමත් සමඟ ම මෙතෙක් කුමරියක් සොයමින් හඳවතේ තිබූ දාහයද නිවමින් මේ මොහොතේ දොළොස් හැවිරිදිවුත් විශාඛා කුමරිය දැක ගැනීමට හැකිවිය.

තම යෙහෙළියන් සමඟ දිය නෑමට නික්මුණු විශාඛා කුමරියද වර්ෂාව හේතුවෙන් නොතෙමී සිටින්නට මෙම ශාලාවට ඇතුළු වන්නට සිදුවිය. අකල් වර්ෂාව හේතුවෙන් විශාඛාවන්ගේ මිතුරියන් වේගයෙන් දිව ගොස් ශාලාවට වැදුනද කුඩා කළ පටන් ණුවනින් මුහුකුරා ගිය මෙන්ම සත් හැවිරිදි වයසේ සෝවාන් මඟඵල ලැබීමෙන් කෙළෙසුනද මදක් තුනී කරමින් තැම්පත් ණුවනින් ශෝභමාන වූ සන්සුන් ගමනින් ශාලාවට පිවිසෙන මෙකුමරිය අයුරු ණුවනින් බලාසිටි පිරිසට මේ නම් තම ස්වාමී වූ මිගාර සිටුතුමන් සොයන අඟනා මාණික්‍ය මැයි සිතා පංච කල්‍යාණියෙන් දන්ත කල්‍යාණියද දැකීම් වස් කථා කරවා ගැනීමට අවශ්‍ය බැවින් මෙසේ කීය.

"අහෝ කම්මැලි දූරියෙනි. කම්මැලිකම නිසාම වැස්සට තෙමුණා නොවේද"යි ඇසීය.

එවදන් ඇසූ විශාඛාවෝ කියන්නී. පියාණෙනි, මම දිව්වේනම් මොවුන් සියල්ල මට පරාද වේ. එහෙත් මා වැනි ශ්‍රේෂ්ඨ කුලයක වැඩිවියපත් තරුණියක් දිවීම යොග්‍ය නොවන බැවින් මම සුපුරුදු ගමනින් පැමිණියෙමි. මෙවන් වදනක් තුළින්ම විශාඛාවන්ගේ ගුණ නුවණ අවබෝධ කරගත් දූත පිණිස මුතුහර පළඳවා විවාහ යොජනාව මව්පියන් වෙත දන්වීය. මේ ආකාරයෙන් විශාඛා කුමරියගේ විවාහය මනා රූ සපුවකින්ද, ප්‍රඥාවකින් ද, මහා ධනසම්පතක්ද හිමිව තිබූ පූර්ණ වර්ධන කුමාරු හා විවහාය සිදුවිය.

විශාඛාවන්ට ලැබුණේ මෙපමණක් නොව ඇතුන් පස් දෙනෙකුගේ බර තිබූ ඈ පැළඳි මහා ලතා පළඳනාවෙන්ද හෙළිවේ.

වත්මන් විශාඛාවෙනි, ඔබ සියළු දෙනාමත් කාන්තාව ලෙස විවිධාකාරයෙන් ශෝභාමත් වීමට , ප්‍රියකරු විමට , නිරෝගි වීමට, තරුණබව රැකගැනීමට , කීර්තිමත් වීමට කැමතිය. එහෙත් සමහරවිට විශාඛාවන්ට මෙන් ඔබට මේවා උපතින් හිමිවී නැත. සමහර විට උපතින් ලද සම්පත්, සම්පත් හැටියට නොදැක අවබෝධ කර ගත නොහැකිව ඔබ විසින්ම විනාශ කොට දමා ඇත. ලැබුණ දේ විනාශකොට, නොලැබුණ දේ සෙවීම සඳහා ඔබ නොගන්නා උත්සාහයක් නැත. නොකරන වියදමක් නැත.

ස්ත්‍රියකගේ වටිනාකම ඇත්තේ ඈ තුළ පවතින පංච කල්‍යාණියත්, ප්‍රඥා මහිමයත්, සීලගුණයත් තුළය.

වත්මන් විශාඛාවෙනි, ඔබට උපතින් කේෂ කල්‍යාණිය, දන්ත කල්‍යාණිය, මාංශ කල්‍යාණිය, ඡවි කල්‍යාණිය, වයඃ කල්‍යාණිය යන සුන්දරත්ව පහෙන් කීයක් ලැබී තිබේද? මේ නොලැබුණ සුන්දරත්වය සොයා එනම් සුදු වෙන පැලෙන තඹවෙන කෙස් කළු කිරීමටද නිරෝගීව තබා ගැනීමට මොනතරම් වියදම් කළාද? සමහර විට මෙහි ඵලය ඔබ රෝගියෙක් කිරීමය. ඔබට නොමැති සමේ පැහැය (ඡවි කල්‍යාණිය) ඇති කර ගැනීම සඳහා ඔබ මොනතරම් ආලේපන කළාද? මොන තරම් වියදම් කළාද? මේ ආලේපන වල වර්ණය පවතින්නේ මොන තරම් කෙටි කාලයක්ද? ඔබේ දත් පිළිවෙලට හදාගන්න ඔබ මොනතරම් දුක් විදිනවද? වියදම් කරනවද? ඔබේ තොල් සඟලට අවශ්‍ය පිරුණු මසත්, රත් පැහැයත් නැති නිසා ඔබ මොනතරම් වියදම් කරමින් ආලේපන යොදනවාද? ඔබ වයසටත් වඩා මහළු වෙනකොට මේ සත්‍ය වසන් කරන්නට ඔබ මොනතරම් වියදම් කරමින්, කාළය කා දමමින් විවිධ දේවල් කරනවද?

දැන් බලන්න, විශාඛාවෙනි ඔබට මේ පංච කල්‍යාණියෙන් එකක්වත් නෑ නේද? ඇයි ඔබට මේ කාන්තාවන් සතු පංච කල්‍යාණිය අහිමි වුණේ. ඔබ නිවැරදිව දන්, සිල්, භාවනා වඩල නැති නිසා. කොහොමද නිවැරදිව දන්, සිල්, භාවනා වඩන්නෙ.

"සෝමනස්ස සහගත ඤාණ සම්පයුක්ත අසංඛාරික" සිතින් දන් සිල් භාවනා කරන්න ඕන. ඒ කියන්නේ සතුටු සිතින් කර්මය කර්ම ඵලය අදහාගෙන කරන පිංකමේ ආනිශංසය අවබෝධයෙන් තමන්ගේම උමනාවෙන් දන්, සිල්, භාවනා කරන්න ඕන.

එසේනම් විශාඛාවෙනි, ඔබ මෙතෙක් බාහිර ආටෝපයකට රැවටී කළ මුලාවක් නවතා ලැබූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍ය ජීවිතයෙන් උපරිම ඵල නෙලා ගැනීම් වස් බුද්ධකාලීන විශිඛාවන්ගේ සුපිරිසිදු සතුටු සිතින් පිං කුසල් අවබෝධයෙන් කටයුතු කිරීමෙන් පංච කල්‍යාණිය හෙබි කාන්තාව වීමටත්, මෙලොව පරලොව සැපත සතුට ඇතිව කටයුතු කිරීමේ ප්‍රඥාවක් ඒ තුළින් ලෞකික ජීවිතයේ සාමය සමගිය සතුට ලැබීමටත් ලෝකෝත්තර වශයෙන් මගඵල නුවණ ලැබීමටත් ඔබට හැකි වේවි.

**ගොකරැල්ල ශ්‍රී ධර්මප්‍රදීපාරාමාධිපතිණි**
**ශාස්ත්‍රවේදී වත්තේගම කුසලධම්මා මෙහෙණිය**

# ජීවිතයේ අනවබෝධය විනාශයට හේතු වේ

ජීවිතය ගැන ඇතිවන දැඩි කලකිරීම හා ජීවිතය එපා වීම සිය දිවි හානි කර ගැනීමට බලපාන්නා වු කරුණුය. ඇතැම් විට ලැජ්ජාව, බිය වැනි ආවේගාත්මක චිත්ත බලපෑම් ද දැඩි කෝපය වැනි අවස්ථාවන් ද ජීවිතයෙන් පලා යාමට හේතුවක් කර ගන්නා බව ද පෙනේ. කුමන හේතුවක් පදනම් කර ගත්තද සිය දිවි හෝ අන් දිවි නසා දැමීම බරපතල පාප කර්මයක් බව බුදු දහමේ ඉගැන්වෙයි.

රජ්ජුමාලා බුදුන් දවස විසූ කාන්තාවකි. ඇය දාසියකි. ජීවිතය ගැන කලකිරීමෙන් ගෙල වැලලා මිය යෑමට ඇය කළ සැලසුම දිවැසින් දුටු බුදු හිමියෝ ඇය මරණයෙන් පමණක් නොව සසරින් ද මුදා ගත්හ.

වක්කලී පොඩි හාමුදුරුවෝ පැවිදි බව ලැබුවේ බුදු සිරුරේ රුව බැලීමට යි. උන්වහන්සේගේ දෛනික සිරිත වූයේ බුදුන් වහන්සේ දෙස බලමින් කාලය ගත කිරීමයි. එම පිළිවෙත අත්හරින ලෙස බුදුන් වහන්සේ වක්කලී හිමියන්ට ප්‍රකාශ කළ විට සිය දිවි නසා ගැනීමට තීරණය කළ බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙයි. ගිජ්ඣකූළ පව්වෙන් පැන මිය යාමට සිතා එම පර්වයට නගින අයුරු දුටු බුදුන් වහන්සේ වක්කලී හිමියන්ට දහම් දෙසා සසර දුකින් මුදවා ලූහ.

සසර පිළිබඳව කල කිරීම කෘෂ්ටික සිතක ස්වභාවයයි. එහෙත් ජීවිතය පිළිබඳව කලකිරීම මිත්‍යා දෘෂ්ටික කල්පනාවකි. සසර ගමනේ ස්වභාවය දුක පදනම් කොට ගොඩ නැගුණු භවයට සත්ව සන්තානය ඇද බැඳ තැබීමයි. දුක යනු මේ ගමනේ යථාර්ථයයි. භවයේ ස්වභාවය අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් ලක්ෂණත්‍රයනික් දේශනා කොට තිබේ. මේ යථා ස්වභාවය වටහාගත් බුද්ධිමත් සිත වීමට නම් මේ ලබා ගත් මිනිසත්කම ආරක්ෂා කර ගත යුතුය. ලෝකය දැකිය හැකි ආලෝකය ප්‍රඥාවයි. ප්‍රඥාව වර්ධනය කරගත් සිතකට සසර ගමනේ නිසරු බව දැනේ. එවිට ඔහු උත්සාහ කරන්නේ ජීවිතය විනාශ කර ගැනීමට නොව දුකට හේතුව වූ තෘෂ්ණාව විනාශ කිරීමටයි. සංසාරගත සත්ත්වයා තෘෂ්ණා රැහැනින් වෙලී සිටින බැවින් ලබා ගත් ජීවිතය පුරාම උත්සාහම දරන්නේ පසිදුරන් පිනවමින් ප්‍රාර්ථනා ඉටු කර ගැනීමටයි. ප්‍රාර්ථනා බිඳ වැටෙන කල්හි ජීවිතය එපා වීමේ ස්වභාවය දුර්වල වූ මිනිසුන් සතුව පවතී.

මිනිස් ලොව උපත ලබා මිනිස්කම රකිනු විනා අභියෝගවලට බියෙන් ජීවිතයෙන් පලා යාමට තීරණය කරන්නේ තමන් ලැබූ පරාජය වසන් කිරීමටයි. එහෙත් සිදු වන්නේ පරාජය තහවුරු වීමයි.

සියදිවි හානි කර ගැනීමට බුදු දහමට අනුව බරපතල වූ පාප කර්මයකි. සිය දිවි යනුවෙන් වචනාර්ථ දැක්වූවද ජීවිත විෂයේදී එහි උරුමකරුවෙකු බුදු දහමට අනුව සොයා ගත නොහැක. හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා මෙම පංච කරුවෙක බුදු දහමට අනුව සොයා ගත නොහැක. හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා මෙම පංචස්කන්ධය මගේ යැයි බැඳ තබන්නේ උපාදානයයි. උපාදානය හටගන්නේ තෘෂ්ණාව නිසයි. තෘෂ්ණාවෙන් බැහැර වී ජීවිතය ගැන සිතන කවරෙකුට වුව ද ඒ ගැන තමන්ගේ තෘෂ්ණාව නිසයි. තෘෂ්ණාවෙන් බැහැර වී ජීවිතය



ගැන සිතන කවරෙකුට වුවද ඒ ගැන තමන්ගේ කමක් නොදැනේ. සත්‍යය ද එයයි. සසර ගමනේද නවාතැනක් ලෙස හමුවන මේ රූපස්කන්ධය තුළ වේදනා, සංඥා, සංඛාර උපදවා ගනිමින් පවතිනවා මිස රැගෙන යාමට හෝ සදාකාලිකව ලැගුම් ගැනීමට ඒ තුළ ඉඩක් නැත. එසේ උරුමයක් නැතැයි සිතා එය විනාශ කිරීමේ අයිතියක් ද අපට නොමැත. පුණ්‍ය ශක්තියකින් ප්‍රතිසන්ධි සිත යහපත් වී මිනිස් ජීවිතයක් ලැබී ඇත. එයින් ඵල ලබා ගැනීමට උත්සාහ කරනු විනා තෘෂ්ණාවේ මෙහෙයවීමෙන් ජීවිතයට ද්වේශ කිරීම නිවැරදි ක්‍රියාවක් නොවේ. බුද්ධි පාර්ශවය නියෝජනය කළ බුදුන් වහන්සේත් මරණ පාර්ශවය නියෝජනය කළ මාර සේනාවත් එදා බෝධි මූලයේදී බලවත් සටනක යෙදුනු බව බුදු සිරිතෙහි දැක්වේ. ලෝකය දැනෙන යම් ක්‍රියාවක දී අපේ සිතට ආරූඪ වන මාර සේනාවෝ අප පරාජය කිරීමට පොළඹවති. බුද්ධියට වඩා චිත්තාකර්ශනීය ලෙස සැරසී සිටින මෙම මාර පාක්ෂික ධර්ම අපව වෙහෙසීමට පත් කොට 'මීට වඩා හොඳයි මැරෙනවා නම්' යන නිගමනය වෙත මනස යොමු කරවයි. මරණයට උපකාර කරන්නේ හැඟීමයි. එහෙත් ජීවිතයට ධෛර්යය දෙන්නේ බුද්ධියයි.

ප්‍රායෝගික ජීවිතයේදි හමුවන සියළු අත්දැකීම් සිහින ලෝකයේදී ගොඩනඟා ගන්නා ප්‍රාර්ථනාවන් සමඟ බද්ධ කළ නොහැක. ලෞකික හදවත් වල උපදින හැඟීම්බර ප්‍රාර්ථනාවන් හා සැලසුම් ප්‍රායෝගික ජීවිතයට වලංගු වන්නේ සුළු වශයෙනි. ඒවා බොහොමයක් බිඳ වැටෙන තත්ත්වයේ පවතී. අපේක්ෂා භංගත්වය යනු ඒ අවස්ථාවයි. අපේක්ෂාවන් බිඳී ගිය විට හැඟීම්බර පාලනය කර නොගත් සිත ජීවිතය කෙරෙහි ද්වේශ සහගත වීම බුද්ධිමත් පියවරක් නොවේ.

අපේ රටේ පවතින නීති පද්ධතිය තුළ ද සිය දිවි හානි කර ගැනීමට තැත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි. දුර දක්නා නුවණින් තොරව ස්ථානෝචිත ප්‍රඥාවෙන් හීන වූ ආත්මාර්ථකාමීත්වයෙන් දුබල වූ මෝහයෙන් අන්ධ වූ බොහෝ මිනිසුන් තම අභිමතාර්ථයන් බිඳුන කල්හි මරණයේ පිහිට පැතීම නිතර දක්නාට ලැබෙන තත්ත්වයකි. වස පානය කිරීම වැනි උපක්‍රම භාවිතා කිරීමේ දී රෝහල් ගත වන බොහෝ රෝගීන් උදෙසා ලබා දෙන ප්‍රතිකාර පද්ධතිය දෙස බලන විට දුර දිග නොබලා ඔහු කළ වරදට වැයවෙන ජාතික ධනය ඉතා විශාල බව පෙනේ. ජීවිතයෙන් පලායාමට උත්සාහ කරන පුද්ගලයාගේ ජීවිතයට රැක ගැනීමට දරණ උත්සාහ දෙස බලන විට පෙනී යන්නේද ඇතුළත් වූ දා සිටම සැලසුම් වූයේ ජීවිතයෙන් මිදී යාමේ ක්‍රියාමාර්ගයකි. එය වරදකල බව තේරුම් නොගත් ඔහුට ප්‍රතික්‍රියා පිණිස වැය කර ධන සම්පත ඇතැම් විට රටට උපයා දුන් ධනයට වඩා වැඩි විය හැකිය.

මරණය තුළින් නිදහසක් ලැබේ යැයි සිතෙන තරමට ජීවිතය කරදරකාරී කර ගැනීම පුද්ගලයාගේ අනුවණකම නිසාම සිදුවන්නකි. අපේ රටේ සිය දිවි හානි කරගත් පුද්ගලයන් හා සියදිවි හානි කර ගැනීමට උත්සාහ දරණ පුද්ගලයන්ගේ ප්‍රතිශතයක් වාර්තා වන්නේ මධ්‍යම පාන්තික පවුල් වලිනි. අනන්තයටම දුක් විදින වීදි සරණ යාචක පවුල් වල සාමාජිකයන් දිවි හානිකර ගැනීමට නොපෙළඹෙති. ඔවුන්ගේ ප්‍රාර්ථනා සහ අපේක්ෂා අඩු බැවිනි. අතිශයින් සැප විහරණයන් ගත කරන ධනවත් පුද්ගලයන්ගේ ද සිය දිවි නසා ගන්නා ප්‍රතිශතය අවම වේ. මාධ්‍ය සංස්කෘතිය මඟින් විකෘති කොට ඇති වානිජමය උපක්‍රම මඟින් දූෂණය කොට ඇති අනුකරණයෙන් උමතු වී ඇති අපේ රටේ සාමාන්‍ය මිනිසුන්ගේ ජන ජීවිතය මෙතරම් අවිනිශ්චිත තත්ත්වයකට පත් වී ඇත්තේ නිවැරදි මාර්ගෝපදේශකත්වයක් නොමැති නිසාය. නැතහොත් ලැබෙන මාර්ගෝපදේශයන් ඉක්මවා නැගී සිටින මුලින් දැක්වූ බලවේගයන් නිසාය.


මරණය මෙනෙහි කිරීම පවා විමුක්තිය ලබාදෙන භාවනාවක් බව කියාදුන් බුදු දහම මරණය තමා විසින්ම සිය උත්සාහයෙන්ම ළඟා කර ගනු ලැබීම පාපයක් බව දේශනා කර තිබේ. හිතට දැනෙන දුක කමටහනක් කොට දුකින් මිදීමට කියා දුන් මඟක් තිබිය දී මෙම ජීවන අභියෝග ආශිර්වාද කොටගෙන ජීවිතය දිනා ගැනීමට තීරණය කරමු.

*ගෞරව ශාස්ත්‍රවේදී, සාහිත්‍ය ශූරී*
**වික්‍රමසිංහ අතපත්තු**

**ප්‍රායෝගික ජීවිතයේදි හමුවන සියළු අත්දැකීම් සිහින ලෝකයේදී ගොඩනඟා ගන්නා ප්‍රාර්ථනාවන් සමඟ බද්ධ කළ නොහැක. ලෞකික හදවත් වල උපදින හැඟීම්බර ප්‍රාර්ථනාවන් හා සැලසුම් ප්‍රායෝගික ජීවිතයට වලංගු වන්නේ සුළු වශයෙනි. ඒවා බොහොමයක් බිඳ වැටෙන තත්ත්වයේ පවතී. අපේක්ෂා භංගත්වය යනු ඒ අවස්ථාවයි. අපේක්ෂාවන් බිඳී ගිය විට හැඟීම් පාලනය කර නොගත් සිත ජීවිතය කෙරෙහි ද්වේශ සහගත වීම බුද්ධිමත් පියවරක් නොවේ.**

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2022 පෙබරවාරි- 2565 නවම් කලාපය

# වන්දනා චාරිකා



සම්බුද්ධත්වයෙන් නවවන වර්‍ෂයේදී ගෞතම බුදුරජාණන් වහන්සේ ලංකාද්වීපයට වැඩම කොට මහියංගනයේදී යක්ෂ ගෝත්‍රික ජනයා දහම් මඟට යොමුකළ සේක. එම අවස්ථාවට සහභාගි වූ සුමන සමන් දෙවිඳුන්ගේ ආරාධනයෙන් සමනල පර්‍වතයෙහි පිහිටි මැණික් ගලක සිරිපා සටහන් තැබූ බව වංශකතාවල සඳහන් වෙයි. මෙම පර්‍වතය සමන්ගිරි නමින්ද හැඳින්වෙයි. ලංකාවේ ප්‍රධාන ගංගාව වන මහවැලි ගඟ, කළු ගඟ ගලා බසින්නේද සමනල පර්‍වතයෙන්වීම වැදගත් වේ.

කැළණි ගඟ, කළු ගඟ, වලවේ යන ගංගාවන්ද සමනල පර්‍වතයෙන් ගලා බසින බවත් ඉපැරණි කෘෂිකර්මාන්තයට මෙම ගංගාවන්ගෙන් පිටුවහලක් ලැබෙන බවත් දැක්විය හැකිය.මෙරට ආයර්‍ය ජනයා ගංගා ආශ්‍රිතව ජීවත් වූ බව ඉතිහාසගත තොරතුරුවල සඳහන්ව ඇත. වංශකතාවල සඳහන්වන අන්දමට සමනල පර්‍වතය අවට පිහිටි ස්වාභාවික ලෙන්වල භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා වාසයකර ඇත. ලංකාද්වීපය එක් සේසත් කළ දුටුගැමුණු මහරජතුමා ශ්‍රී පාද ස්ථානය වන්දනාකර එම ස්ථානය දියුණුකර නඩත්තුව සඳහා ගම්වර පූජාකළ බව වංශකතාවල දැක්වේ. (මහාවංංශය) දුටුගැමුණු රජුගේ දසමහ යෝධයන්ගෙන් කෙනෙකු වූ ථෙරපුත්තාභය පැවිදිව සිරිපා ලෙනක වාසය කළ බව ශාසන ඉතිහාසයෙහි සඳහන් වෙයි. දේශගවේෂි පාහියන් භික්ෂූන් වහන්සේ ශ්‍රී පාදස්ථානය ගැන වාර්‍තාකර ඇත.

පොළොන්නරු රාජධානියේ රජකළ පළමුවන විජයබා රජතුමා ශ්‍රී පාදස්ථානය වන්දනා කොට ගිලිමලය ප්‍රදේශයෙන් ආදායම් එම ස්ථානයේ නඩත්තුව සඳහා මාර්‍ගය ප්‍රතිසංස්කරණය කළ බවත්, ගිමන්හල්ද තැන වූ බවත් නිශ්ශංකමල්ල රජුගේ තොරතුරුවල සඳහන් වේ. සෑම වසරකම උඳුවප් පොහොය ආරම්භවීමත් සමගම වාර්ෂික සිරිපා වන්දනා සමය ආරම්භ වේ. වෙසක් පෙහොය දක්වා කාලය තුළ ලක්ෂ සංඛ්‍යාත ජනතාව සිරිපා වන්දනා කරති. ලාංකික ජනතාව පමණක් නොව විදේශිය සංචාරකයන්ද සිරිපා නැරඹීමට පැමිණෙති. සිරිපා වැඳීමට මුලින්ම (පළමුවරට) සහභාගිවන පිරිස් හඳුවන්නේ ''කෝඩුකාර'' යන වචනයෙනි. සීත ගඟුලෙන් නා පිරිසිදු වී පඬුරු බැඳ නඩේගුරා යන නමින් හඳුන්වන කණ්ඩායමේ නායකයාට බාරදෙයි. එතැන්සිට ගමනාන්තය දක්වා නඩේගුරාගේ වචනයට අවනතව කටයුතු කිරීම කළ යුතුවේ.

කායික හා මානසික සුවය පතාත් පිං සිතුවිලි උපදවා ගැනීම සඳහාත් බොහෝ දෙනෙක් සිරිපා කරුණා කරති. ලෝක සුපූජිත ශ්‍රී පාදස්ථානය අපිරිසිදු නොකර (අපද්‍රව්‍ය දමා) අලංකාරව තබාගැනීම පොදුවේ සෑමදෙනාගේම යුතුකම වන්නේය. ජලපෝෂිත ප්‍රදේශයක් වූ සිරිපා කඳුවැටිය ලාංකික ජනතාවට වටිනාකමින් අනූන ප්‍රදේශයකි. එය රැකගැනීම අපසතු පරම යුතුකම වන්නේය.

**ඇම්.ඩී.විජයවර්ධන**

**මෙම තීරුවට ඔබටත් ලිපි එවිය හැකියි. ඔබේ ලිපි වචන 250කට කැටි කොට එයට අදාළ පින්තූරයක්ද සමඟ අප වෙත එවන්න. අප්‍රකට හා ඓතිහාසික පුණ්‍යභූමි පිළිබඳ විස්තරයන්ට ප්‍රමුඛස්ථානය හිමිවේ. ඔබේ ලිපි සෑම මසකම පොහෝ දිනට සති 2කට පෙර එවන්න.**
**(මෙම පුවත්පතේ පලවන සියලුම ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම එකී ලේඛකයන් සතුය.)**
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත,රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය,දඹුල්ල. (rangirinewspapers@gmail.com)